# ධාතුවංසො

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ
ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කළ නිබන්ධය


සංස්කාරක:
පිරිවෙන් පරීක්ෂක
රාජකීය පණ්ඩිත
කඹුරුපිටියේ නන්දරතන ථෙර
ඇම්. ඒ. (ලංකා)


# DHĀTUVAṂSA


*Edited by*

**REV. KAMBURUPITIYE NANDARATANA THERA**
M. A. (Lanka)



*Published by*

**THE CULTURAL PUBLICATIONS CO., LTD.**
212, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.

ප්‍රථම මුද්‍රණය : 1984
First Edition : 1984

මිල රු. 50/-
Price Rs. 50/-

අංක 212, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, සීමාසහිත සංස්කෘතික ප්‍රකාශන සමාගම වෙනුවෙන් කේ. හේමචන්ද්‍ර විසින් දෙහිවල තිසර මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවන ලදී.

Printed by K. Hemachandra at Tisara Press, Dehiwala, Sri Lanka. and published by The Cultural Publications Co. Ltd., 212, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.

මෙම ග්‍රන්ථය

මගේ

දෙමාපියන්ගේ නාමයට

හා

මා පැවිදි බිමට පත් කළ

විනයාචාර්ය

**මලිගස්පේ ශ්‍රී සෝමානන්ද**

ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ

ශ්‍රී නාමයට

උපහාර වේවා !

# PUBLISHER'S NOTE

The Cultural Publications Company Ltd., formed under the aegis of the Hon'ble **E. L. B. Hurulle,** Minister of Cultural Affairs and the Hon'ble **W. M. G. T. Banda,** Deputy Minister, is indeed, fortunate to have been able to bring out this hitherto unpublished Pali chronicle, the **Dhātuvaṃsa,** for the benefit ofstudentsof Pali and Sri Lankan history both here and abroad.

It is relevant here to mention the tradition that it was in the first century B.C. at Aluvihāra in the District of Mātalē in **Sīhaladīpa** (Island of the Sinhalas) that the **Theravāda Tipiṭaka** was for the first time recorded in its entirety in writing in the ancient Sinhala script. As custodians of the Pāvacana (the Sacred Word), the Sinhala people, generation after generation, have for over twenty-three centuries, continued to hand down both orally and in its written form both the Canonical teachings of the Buddha and the vast literature in Pali that has developed around it. The script employed was that used by the Sinhalas commencing with its ancient Brāhmi form in the pre-Christian era right down to its current printed script which has evolved over the centuries. This vast store-house of Pali literature which was taken serious notice of by European scholars in the early nineteenth century only was found writtten in the Sinhala script. Other Theravāda Buddhist countries such as Burma, Thailand and Cambodia now use their own scripts for writing Pali but at some stage, it was the Buddhavacana written in the Sinhala script that was in vogue in those lands before their own scripts were adapted for the purpose. Even to-day after a full century of dedicated service by the **Pali Text Society** of London which has published the entire Tipiṭaka and its commentaries, a large number of ancillary Pali works, literary compositions and a few sub-commentaries, there still remains an enormously large number of Pali works written in Sinhala script preserved in the temple libraries of Sri Lanka awaiting publication.

The text of the Dhātuvaṃsa though printed in Sinhala characters is accessible to all serious students of Pali. With a view to helping those who are not accustomed to the script a chart giving the equivalents in Roman script is given.

**Somapala Jayawardhana**
Chairman
**The Cultural Publications Co. Ltd.**

31. 1. 1984

# සංස්කාරක නිවේදනය

මා ප්‍රථම වරට සිංහල ධාතුවංශය කියවූයේ ප්‍රාචීන අවසාන විභාගය සඳහා සූදනම් වූ අවධියේදිය. ඒ අවස්ථාවෙහි පාළි ධාතුවංසය ගැන තොරතුරු පමණක් දැනගතිමි. ශාස්ත්‍රපති උපාධිය සඳහා නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු බවට නියමව තිබූ හෙයින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයයෙහි පාළි හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ මහාචාර්ය ධුරය දැරූ **ඇන්. ඒ. ජයවික්‍රම** මහත්මාගෙන් ඒ සඳහා උපදෙස් පැතිමි.

මා කලක සිට පැතූ දෙයක් මහාචාර්යතුමා දිවැසින් දුටුවා සේ පාළි ධාතුවංසය ම සංස්කරණය කරන්ට යෝජනා කළේය. අවශ්‍ය පිටපත් දුෂ්කරතා මධ්‍යයේ සොයා ගෙන ධාතුවංසය සංස්කරණය කළෙමි. සංස්කරණය කිරීමේදී මහාචාර්යතුමන්ගේ සුපරීක්ෂාකාරි අනුග්‍රහය මා වෙත ලැබිණ. බාහිර පරීක්ෂකවරයා වශයෙන් කටයුතු කළ ආචාර්ය **සී. ඊ. ගොඩකුඹුර** මහත්මාගේ නිර්දේශ ග්‍රන්ථය මුද්‍රණය කරන අවස්ථාවෙහි අවධානයට යොමු කළෙමි.

ග්‍රන්ථය සකස් කරන අවධියෙහි කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවෙහි මහා නායක ධුරන්ධර මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත අතිපූජ්‍ය **ලබුගම ලංකානන්ද** මාහිමියන්ගෙන් ලැබුණ අනුග්‍රහය ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි. ග්‍රන්ථාගත ඉතිහාස කරුණු හා මූලාශ්‍රය ගැන කරුණු සෙවීමෙහි දීද ප්‍රස්තාවනාව ලිවීමෙහි දීද මාකඩවර ශ්‍රී රේවත පිරිවෙන් විහාරාධිපති රාජකීය පණ්ඩිත ගරු **කරහම්පිටිගොඩ සුමනසාර** ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් ලැබුණ අනුග්‍රහය ප්‍රමාණ කළ නොහැකිය. උපාධිය සඳහා ග්‍රන්ථය ඉදිරිපත් කිරීමට පිටපත් සකස් කර දුන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයෙහි '**පාළි හා බෞද්ධ සංස්කෘතිය**' අංශයෙහි යතුරු ලේඛක **චන්ද්‍රනන්ද ද සිල්වා** මහත්මා ග්‍රන්ථය මුද්‍රණයෙන් පිට වන මේ අවස්ථාවෙහි මිතුරු දමින් යුතුව සිහි කරමි.

මේ වටිනා ඉතිහාස ග්‍රන්ථය මුද්‍රණය කොට ප්‍රසිද්ධ කිරීම අවශ්‍යව තිබුණද නොයෙක් හේතුන් නිසා එය ඉටු කරන්නට නොහැකි විය. එසේ තිබිය දී සංස්කෘතික අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම් **සෝමපාල ජයවර්ධන** මහත්මාගේ අවධානය මෙයට යොමු වීම නිසා සීමාසහිත සංස්කෘතික ප්‍රකාශන

සමාගම මෙය මුද්‍රණය කිරීමට ඉදිරිපත් විය. එම සමාගම පිහිටුවීමට මූලික වූ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාට හා නියෝජ්‍ය අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඇම්. ජී. ටී. බණ්ඩා මැතිතුමාට ද ලේකම් වෝල්ටර් ලද්දුව හෙට්ටි මහතාට ද විශේෂයෙන් සතුති කරමි.

සාහිත්‍යයට, භාෂාවට මෙන්ම එහි නියැලි ලේඛකයින්ට අනුග්‍රහ කිරීමේ උදර පරමාර්ථයෙන් පිහිටුවන ලද සීමාසහිත සංස්කෘතික ප්‍රකාශන සමාගම ධාතුවංසය ප්‍රසිද්ධ කිරීමේ කාර්යය භාර ගත්තේය. මේ ග්‍රන්ථය ඔබ අතට පත් වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ සඳහා ප්‍රධාන අනුග්‍රාහකයා වූයේ අතිරේක ලේකම් සෝමපාල ජයවර්ධන මහත්මා බව ගෞරව-යෙන් සිහිපත් කරමි.

මුද්‍රණයට අවශ්‍ය ලෙස පිටපත් සකස්කිරීමේදී ගතෝතැන්නේ පදිංචි විශ්‍රාම ලත් විදුහල්පති ඒ. ඇස්. හෙට්ටිආරච්චි මහත්මා ගෙන් ලැබුණ සහාය කෘතවේදිව සිහිපත් කරමි. මෙවැනි ග්‍රන්ථයක් මා අතින් සංස්කරණයට මග සලසා මුද්‍රණ අවස්ථාවෙහි දී ද අගනා හැඳින්වීමක් ලිවූ මහාචාර්ය ජයවික්‍රම මැතිතුමා ගුරු ගෞරවයෙන් යුතුව සිහි කරමි.

ග්‍රන්ථයේ සෝද්‍රපත් බැලීම සංස්කෘතික අමාත්‍යංශයේ ආරාධනය පරිදි මගේ ආචාර්යෝත්තම රාජකීය පණ්ඩිත අතිගරු ලබුගම ලංකානන්ද මහානායක මාහිමියන් වහන්සේ, රාජකීය පණ්ඩිත ගරු කරහම්පිටිගොඩ සුමනසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ මහාචාර්ය ඇන්. ඒ. ජයවික්‍රම මහත්මා විසින් සිදු කරන ලද බව ප්‍රකාශ කිරීම ග්‍රන්ථ ගෞරවයට හේතු වේ යයි මම සලකමි. ග්‍රන්ථය මුද්‍රණය කිරීමේදී "තිසර" මුද්‍රණාලයාධිපතිතුමාගේ හා කාර්ය මණ්ඩලයේ උද්‍යෝගය ද මෙහි ලා සිහිපත් කරමි.

අවසාන වශයෙන් පාළි ධාතුවංස කතිෘ ද, පුස්කොළයෙහි පිටපත් කර ගනිමින් රැක ගෙන ආ උතුමන්ද ශීර්ෂප්‍රණාමයෙන් සිහිපත් කරන අතර මෙම ග්‍රන්ථය සංස්කරණය කිරීමට හා ප්‍රසිද්ධ කිරීමට අනුග්‍රහ දක්වූ හැම දෙනාට ස්තුති කරමි.

මීට,

කඹුරුපිටියේ ඤාණරතන ස්ථවිර

ශ්‍රී විජය සුන්දරාරාමය,
කැස්බෑව.

# FOREWORD

*by*

PROFESSOR **N. A. Jayawickrama**

The Pali **Dhātuvaṃsa** which is consistently referred to as **Nalāṭadhātuvaṃsa** in the text has not been published in printed form to this day. A parallel version in Sinhalese attributed to a Thera called **Kakusandha** was published in 1890 for the first time by Ven. **Gintota Siridhammakkhandha** and followed early this century by several editions by Ven. **Dambagasāre Sumedhaṅkara** Mahathera who was chiefly responsible for the restoration of the historic shrine of Seruwavila whose annals the book purports to record. The present edition consists of a thorough revision of the tentative text prepared by Ven. **Kamburupiṭiya Nandaratana** when he submitted it as part of his dissertation for the Master of Arts degree at the University of Ceylon, Peradeniya in 1972. He explains the tentative nature of the text caused mainly by the corrupt nature of the manuscripts available to him and the paucity of manuscripts in the temple libraries. His search for manuscripts has been most frustrating as most of the books catalogued as the Pali text were invariably found to be the Sinhalese version whilst in some instances the book could not be traced at all. He was ultimately compelled to work on three manuscripts he had been able to find including that at the Colombo National Museum Library.

The text incorporated in the dissertation though tentative pays due regard to the manuscript tradition faithfully reproducing the corrupt readings if no variants were attested but making valuable suggestions in the footnotes. Such an edition, in spite of its shortcomings is of less limited usefulness to the student than an edition with learned emendations. The criteria for making such emendations should have been clearly spelled out if much weight is to be attached to the revisions even though the reader's knowledge of Pali will help him to decide in favour of such readings. Perhaps the Sinhalese version can be helpful in determining the correct readings in doubtful instances but its value as a different recension, though in a different language, has to be first ascertained before it is employed for textual reconstruction. As a text, it presents a more finished product

even shedding light on the readings in the Pali verses found repeated in it. The Dhātuvaṃsa also contains several passages parallel to those in Canonical texts like the Buddhavaṃsa and the Mahāparinibbāṇasuttanta and later works like the Thūpavaṃsa. Unless there is strong evidence to prove the contrary, these texts, all of which are anterior to the Dhātuvaṃsa, can throw light on the readings in such parallel passages. We are in a much happier position with regard to the Jinakālamāli (1516 A.C.) which repeats the words of the Dhātuvaṃsa in the account of the enshrinement of the frontal-bone relic, so that it serves as a useful check on readings in that section of the work. However, a long-felt need is fulfilled in that we now have a version of the text to go by even though it has been subjected to heavy emendation. Its usefulness to the general reader for the extraction of information as historical data cannot be denied but perfect reliance cannot be placed upon it for purposes of thorough critical investigation in doubtful instances where decisive evidence is expected from this work. The tentative text lends itself better for that purpose. More intensive research will be helpful in not only fixing the text that is faithful both to the manuscript and textual traditions but also to solve many of the problems regarding the date and authorship of the work.

The Dhātuvaṃsa belongs to the group of popular Pali works originating in **Rohana** far removed from the main stream of Pali literary activity centred round Anurādhapura and Polonnaruva in the Rajaraṭa and later Dambadeniya and Kurunegala. The monks of Rohana, celebrated for their piety and asceticism and erudition in the Tipiṭaka hardly reached the level of perfection gained by their brethren in the monastic centres of the North in matters of Pali literary activity. The editor in his introduction correctly points to the various shortcomings in the syntax of some of the sentences used by the author. Some errors can be attributed to the incorrect use of Pali idiom by the author or carelessness of copyists while others point to the influence of the Sinhalese idiom. As an example, the confusion with the flexion ට in Sinhalese which stands both for the accusative of the goal of motion as well as the dative of the recipient both probably derived from Pali අත්ථං and අත්ථාය respectively, through intermediate forms අට්ඨං and අට්ඨාය has given rise to a curious idiom in this work with the dative as goal of motion,

e.g. ගාමායගතො, perhaps reflecting on a dative of directiou found in early Canonical Pali e.g. සග්ගාය ගච්ඡති (Dh. 174). To the grammarian this is an obvious error but are we after all, justified in rejecting it altogether ? There are many other instances of such grammatical lapses such as the non-use of the locative absolute construction in a subordinate clause expressing simultaneity of action, a practice shared with several late Pali works of many countries, which the grammarian will frown upon. There is no particular reason for late medieval Pali works to have such lapses unless we presuppose a 'dialect' peculiar to Rohana and assign an inferior literay tradition to this region as is reflected in other works such as Rasavāhini. The editor specifically refers to this in his introduction.

The Dhātuvaṃsa records many popular traditions not found elsewhere. As the editor points out, the reconstruction of the history of the early Aryan settlement of South-east Sri Lanka has to some extent been facilitated by some of the details given in the book. Though the Thūpavaṃsa has been written expressly for the purpose of giving an account of the Great Thūpa the Ratanamāli-cetiya it embodies accounts of several other important Thūpas but the underlying purpose of the book is to eulogize the national hero Duṭṭhagāmaṇi who is painted simultaneously as the champion of the faith and the saviour of the nation from a foreign foe. In fact, it has been noted (Geiger and others) that the hero of the first part of the Mahāvaṃsa is also **Duṭṭhagamaṇi**. In most chronicles his father Kākavaṇṇatissa is depicted as a timid king who was content to allow the foreign usurper to continue in the territory north of the Great River. He is even said to have discouraged his sons waging war on the enemy. This chronicle completely vindicates his position. Far from being the timid ruler he is depicted as in other works, he acts as a unifying force with a set purpose before him. He uses much strategy in closing the ranks of the Sinhalese nation by effecting matrimonial alliances among the royal houses of the country, by erecting religious edifices in the vassal states winning the goodwill of the people and effecting skilful manoeuvres like planting his son Gāmaṇi in Giri Abhaya's city which led to the departure of Abhaya from there to found a new city in the North-east, the Somanagara. His ultimate aim is to prepare the ground to drive out the enemy from the Rajaraṭa. In the absence of a Sinhalese king there he assumes the role of the legitimate ruler of all Sri Lanka, the *de facto* emperor whose

allegiance was sought by the provincial kings of Kalyani, Serunagara, Lonanagara and Girinagara. His viceroy was stationed at Dīghavāpi the hinterland of Batticaloa, the granary of the kingdom. With diplomacy and tact he enlisted their support to meet the common enemy but the final assualt had to await his son's reign. The unification of Lanka was effected by the groundwork carefully prepared by him. This is an important aspect of Kākavaṇṇatissa's rule that has been overlooked by other chronicles or deliberately distorted in order to further glorify their hero Duṭṭhagāmaṇi so that his valour and heroism shall stand out prominently.

The chronicle is written avowedly for the purpose of recounting the story of the enshrinement of the frontal-bone relic of the Buddha which was deposited in the Maṅgalamahācetiya at Seruwāvila situated about 15 miles south of the ancient seaport of Gokanna (Trincomalee) but like its better known sister chronicle the Thūpavaṁsa it deals with other relics including the right eye-tooth enshrined in the Somāvati-cetiya also situated in the Trincomalee District some 10 miles south of Seruwāvila. This was built by Giri Abhaya at the request of his queen Somāvati in the city founded by him after he fled to Serunagara. But what is more important, as in the case of the Thūpavaṃsa, which eulogizes Duṭṭhagāmaṇi, the underlying purpose of the chronicle here is to extol the virtues of Kākavaṇṇatissa though it falls far short of the eulogy in the former work. All the same, the hero of the work without doubt, is Kākavaṇṇatissa. This perhaps sheds some light on the date of composition of the work in relation to that of the Thūpavaṃsa. It is acknowledged that the Dhātuvaṃsa is modelled on the latter work as is to be inferred from the arrangement of the subject matter and the numerous passages and descriptions common to both works. The inept amplifications in the Dhātuvaṃsa of passages from the Thūpavaṃsa clearly indicate that it is a younger work or at least a work of contemporary authorship. In the light of its borrowings from the Thūpavaṃsa we cannot place this work earlier than the reign of Parākramabāhu II (1236–70) when the Thūpavaṃsa was written. Though argument from silence is generally unacceptable, the silence of the Mahāvaṃsa, the Extended Mahāvaṃsa (which goes out of its way to record old legends from popular sources) and the Vaṃsatthappakāsini prevents us from assigning it to a very early date. It could also be stated that the

authors of these works were not familiar with the historical traditions of Rohana. The conjecture that it could have belonged to the time of Kākavaṇṇatissa or Duṭṭhagāmaṇi (Ven. Polwatte Buddhadatta, *Pāli Sāhityaya*, p. 381) is most improbable. Professor G. P. Malalasekera (Pali Literature of Ceylon, p. 256) assigns to it to the period tenth or eleventh century judging from the similarity of treatment of the subjects in this work and the Mahābodhivaṃsa. One could, however, say the same thing with regard to all the works belonging to this category of *vaṃsakathā* literature dealing with specific themes, and it is difficult to place them all in the same period. It is in this respect that the evidence from the Thūpavaṃsa becomes relevant. Consensus among scholars is that the Sinhalese version of the Dhātuvaṃsa by Kakusandha Thera is posterior to the Pali work. Though no date can be arrived at from the colophon, the language of the book does not warrant a date earlier than the thirteenth century for that work as pointed out by the editor. It appears that the Thūpavaṃsa, the Nalāṭadhātuvaṃsa, and the Sinhala-Dhātuvamsa all belonged to about the same period, the earliest being the Thūpavaṃsa followed by the Pali and Sinhalese versions respectively of the Dhātuvaṃsa. We have another useful piece of evidence in arriving at the lower limit to which the book can be assigned. The Jinakālāmāli makes extensive quotations from the Pali Dhatuvamsa. We already note that we cannot extend the upper limit to a period earlier than the thirteenth century. This would narrow down the period roughly to three centuries and we would not be far wrong in assigning to it a date immediately after that of the Thūpavaṃsa. However all the internal and external evidence has to be carefully sifted before arriving at a more precise conclusion. Many of the above problems have been taken up by the editor in his long introduction and his main thesis is that while the Thūpavaṃsa does full justice to Duṭṭhagāmaṇi's career, hardly any other work apart from the Dhātuvaṃsa touches upon the activities of his father and it is very likely that this work is intended to fill the breach and vindicate the position of Kākavaṇṇatissa in the main stream of the history of the entire Island and not Rohana alone when he has been unjustifiably maligned by other chroniclers who invariably were from the kingdom of Rajaraṭa.

# මූලාශ්‍රය
## REFERENCE

කෞ. — කොළඹ කෞතුකාගාර පිටපත

ජි. — මැදවල උඩුකිඳ ජිනජෝතිකාරාම පිටපත

ජිනකා — ජිනකාලමාලී

මව — මහාවංශය

රස — රසවාහිනී

වි. — දෙමටගොඩ විද්‍යාලංකාර පිරිවෙන්හි පිටපත

සිං.ධා/සිධා— සිංහල ධාතුවංශ

බුද්ධවංස

ථූපවංස

දීඝනිකාය මහා පරිනිබ්බාණ සුත්ත.

# පටුන
## CONTENTS


| | | |
|---|---|---|
| පිළිගැන්වීම | .. .. | III |
| Publisher's Note | .. .. | V |
| සංස්කාරක නිවේදනය | ... .. | VII |
| Foreword | .. .. | IX |
| මූලාශ්‍රය Reference | .. .. | XIV |
| The Pali Alphabet | .. .. | XVI |
| ප්‍රස්තාවනා | .. . | XVII |
| පෙළ Text | .. . | 1 – 72 |
| සඤ්ඤානාමානුක්කමණිකා Index | .. | 73 |

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ ē   ඔ ō

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### CONJUNCT-CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක්ක kka | ච්ච cca | ණ්ණ ṇṇa | න්ථ ntha | ම්ම mma |
| ක්ඛ kkha | ච්ඡ ccha | ණ්ට ṇṭa | න්ද nda | ම්හ mha |
| ක්‍ය kya | ජ්ජ jja | ණ්ඨ ṇṭha | න්ධ ndha | ය්ය, ය්‍ය yya |
| ක්‍රි kri | ජ්ඣ jjha | ණ්ඩ, ණ්ඩ ṇḍa | න්න nna | ය්හ yha |
| ක්ව kva | ඤ්ඤ ñña | ත්ත tta | න්හ nha | ල්ල lla |
| ඛ්‍ය khya | ණ්හ ṇha | ත්ථ ttha | ප්ප ppa | ල්‍ය lya |
| ඛ්ව khva | ඤ්ච ñca | ත්ව tva | ප්ඵ ppha | ල්හ lha |
| ග්ග gga | ඤ්ඡ ඡ ñcha | ත්‍ර tra | බ්බ bba | ව්හ wha |
| ග්ඝ ggha | ඤ්ජ ජ ñja | ද්ද dda | බ්භ bbha | ස්ස ssa |
| ඞ්ක ṅka | ඤ්ඣ ñjha | ද්ධ ddha | බ්‍ර bra | ස්ම sma |
| ග්‍ර gra | ට්ට ṭṭa | ද්‍ර dra | ම්ප mpa | ස්ව sva |
| ඞ්ඛ ṅkha | ට්ඨ, ට්ඨ ṭṭha | ද්ව, ද්ව dva | ම්ඵ mpha | හ්ම hma |
| ඞ්ග ṅga | ඩ්ඩ ḍḍa | ධ්ව dhva | ම්බ, ම්බ mba | ව්හ vha |
| ඞ්ඝ ṅgha | ඩ්ඪ ḍḍha | න්ත nta | ම්භ mbha | ළ්හ ḷha |

ා ā   ි i   ී ī   ු ු u   ූ ූ ū   ෙ ē   ෙ ා o

# ප්‍රස්තාවනා

පාලි ධාතුවංසය අද දක්වා සංශෝධනය කොට ප්‍රකාශයට පත් කොට නැති නිසාත් සෙසු මූලාශ්‍රයන්හි නොමැති ඓතිහාසික කරුණු රාශියක් එම පොතෙහි ඇතුළත්ව තිබෙන නිසාත් ශාස්ත්‍රපති විභාගයේ නිබන්ධනය සඳහා මෙම කුඩා පොත සංශෝධනය කිරීමට තීරණය කර ගන්නා ලදී. මඞ්ගලමහාචෛත්‍යය පිළිබඳ වර්ණනාව නලාටධාතුව නිසාම බිහි වූ නිසා කර්තෘවරයා ග්‍රන්ථාවසානයේදී ''නලාටධාතුසංවණ්ණනා'' යන්න යෙදූ බව පෙනේ. නලාට යනු සංස්කෘත වචනයයි. එහෙත් ලලාට නලාට යන වචන දෙකම නළලට පාලියේ ව්‍යවහාර වෙයි. මා අත ගැසුණු පිටපත් තුනෙහිම ඇත්තේ නලාට යන වචනයයි.

සිංහල ධාතුවංසය කෙතරම් සුලභ වුවත් පාලි කෘතියේ අත්පිටපත් සොයා ගැනීම ඉතාමත් දුෂ්කර කාර්යයක් විය. පිටපතක් ගැන ස්ථිර වශයෙන් දැන ගත හැකිවූයේ කොළඹ කෞතුකාගාරයේ ඇති පිටපතිනි. පළමුවෙන් එය කොපි කර ගතිමි. අනතුරුව ''ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය'' අනුව පිටපත් සෙව්වෙමි. ධාතුවංසයේ සිංහල පිටපත් එම ග්‍රන්ථයේ ස්ථිර වශයෙන් දක්වා තිබුණ ද පාලි කෘති ගැන විශේෂයෙන් සඳහන් නොවිණි. ධාතුවංසය ඇතැයි සඳහන් වූ විහාරස්ථාන දහනවයකට ගියෙමි. ඒවායින් ඇතැම් තැනෙක පාලි තබා සිංහල ධාතුවංසයකුදු නොවූ අතර ඇතැම් තැනෙක සිංහල ධාතුවංසය පමණක් දක්නට ලැබිණි. ඇතැම් තැනෙක ධාතුවංසය නමින් සඳහන් වූයේ ථූපවංසයයි. දුර බැහැර විහාරස්ථානවලට යැවූ ලිපිවලට පිළිතුරු වශයෙන් බොහෝ තැනෙක ඇත්තේ සිංහල පිටපත් බව දන්වා එවා තිබිණි. අවසානයේදී විද්‍යාලඞ්කාර පිරිවෙණේ තිබී ලැබුණු පිටපතත්, මැදවෙල උඩුකිඳ ජිනජෝතිකාරාමයේ තිබී හමු වූ පිටපතත් උපයෝගී කරගෙන සංස්කරණය කිරීමට තීරණය කළෙමි. ග්‍රන්ථය මුද්‍රණය කරන අවස්ථාවකදී නවත් පිටපත් ඇත්නම් ඒවායින් කීපයක් සොයා සැසඳීමට බලාපොරොත්තු වූ නමුදු අද දක්වා එම උත්සාහය ව්‍යර්ථ විය.

මට ලැබුණු පිටපත් තුනෙහිම සමාන බවක් පෙනෙයි. පාලියට නුහුරු යෙදුම් ග්‍රන්ථ තුනෙහිම සමානව දක්නට ලැබිණි. ඒවා ධාතුවංශයට ආවේණික ලක්ෂණයයි සිතා උපෙක්ෂාවීමි. මෙ පිටපත් තුනට වඩා සතුටුදායක පාඨ ඇති පිටපත් ඇතැම් විට තිබෙන්නට පුළුවන. අවාසනාවකට මෙන් මා අත ගැසුණු පිටපත් තුනම එකම පරපුරකට අයත් අත්පිටපත් බව පෙනෙන නිසා සංශෝධනය කිරීමෙ කාර්යය බොහෝ දුෂ්කර එකක් විය. අන්තනෝමතිකව වියරණ දෙස් පහකොට අපපාඨ ඉවත්කොට සිලුටු බස යොද සංශෝධනය කිරීමෙන් පොතේ මුල් පාඨය සොයා ගැනීම දුෂ්කර විය හැකිය. එම නිසා

කෙසේ නමුත් පිළිගත හැකි පාඨයක් පිටපතක තිබුණි නම් එය පෙළෙහි තිබෙන්නට ඉඩ දී අධෝලිපි මාර්ගයෙන් නිවැරදි පාඨය පෙන්වා දීමට උත්සාහ කළෙමි. සිංහල පිටපත බලා සකස් කළ තැන් ද ඇත. ඇතැම් ගාථාවලදී වෘත්තයට නොගැලපෙන යෙදුම් හා අර්ථාවබොධයට දුෂ්කර යෙදුම් තුබුණද මූලසාධකයක් නොලැබීමෙන් එලෙසම තිබෙන්නට හැරියෙමි.

## ලංකාවේ වංශකථා

අවුරුදු දෙදහසකට ආසන්න කාලයක් මුළුල්ලෙහි පැවත එන ලිඛිත වංසකථාවලියක් සිංහලයාට උරුමව ඇත. ලංකාවේ පාලි අට්ඨකථා ලිවීමට ද පෙර සිටම සිංහල වංසකථා ලියවුණැයි සිතීමට සාක්ෂි ඇත. අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ සිංහලයාගේ වංසකථා රචනය මහනුවර අවධිය දක්වාම දිවෙයි. අන් කවර ජාතියක් වත් නොදක්වූ උත්සාහයක් වංසකථා රචනයෙහි ලා සිංහලයා දක්වූ බව පෙනේ.

අපට ඉනාම ළං වූ සාහිත්‍යය වූ භාරතීය සාහිත්‍යය හා සසඳන කල වංසකථා සාහිත්‍යය අතින් අප වැදගත් තැනක සිටිනා බව කිව හැකිය. දෙවකථාවන්ගේ මිශ්‍රණයෙන් සැඟවී ගිය ඉතිහාස ප්‍රවෘත්ති ඇති මහාභාරත, රාමායණ මහාකාව්‍ය මෙන්ම රාජතරඞගනි වැනි එක් එක් රාජපරම්පරාවන්ට විශේෂ වූ කෘති රැසක් භාරතීයයන් සතුව ඇත. සිංහලයා මේ මගින් ඉවත්ව ආගමික ඉතිහාසය ඔස්සේ ජාතියේ ඉතිහාසය කියා පා ඇත. බුද්ධශාසනය ජාතික උරුමය කොට ගත් සිංහලයා ජාතියේ දියුණුව ආගමෙ දියුණුවත් ආගමෙ දියුණුව ජාතියේ දියුණුවත් ලෙස සැලකූ බව පෙනේ. ආගමට පැමිණෙන හිරිහැර ජාතියට පැමිණෙන හිරිහැර ලෙසත් ජාතියට පැමිණෙන හිරිහැර ආගමට පැමිණෙන හිරිහැර ලෙසත් සලකන්නට විය. මහජනයාගේ සිත් ගැනීමට තිබුණු හොඳම මාර්ගය බුද්ධාගම බව රජවරුන්ට පෙනී ගොස් ඇත. එහෙයින් රජවරුන්ගේ ආගමික කටයුතු ස්වකීය රාජ්‍යසමයේ ප්‍රධාන තැනක් ගත්තේය. ඒ කටයුතු ඉතිහාසයට එකතු වන්නටද මග පැදිණි. දේවකථාදී ආශ්චර්යාද්භූත කථාවන්ට සවන් දී භාරතීය ජනයා ආස්වාදයක් ලැබුවද සිංහලයා ආස්වාදයක් ලැබුවේ බුදුදහමට සම්බන්ධ සිද්ධීන් හා ස්ථාන ගැන සවන් දීමෙනි. මිථ්‍යා කථාවන්ට බුදුදහමෙහි කිසිදු තැනක් නොලැබුණු නිසා බෞද්ධ භික්ෂූන්ගේ සිරිත වූයේ යථාස්වරූපයෙන් සිද්ධීන් එක් රැස් කිරීමයි. භක්තිවාදය දියුණුවත්ම ඇතැම් සිද්ධීන් අතිශයෝක්තියට නඟා අද්‍යාශ්‍යමාන දෙවියනුත් සම්බන්ධ කරගෙන විස්තර කළ තැන් නැත්තේ ද නොවෙ. යථාස්වරූපයෙන් ඓතිහාසික සිද්ධීන් වාර්තාකර තැබීමේ සිරිත විනය පිටකයේ චූල්ලවග්ගයේ පඤ්චසතිකක්ඛන්ධක සත්තසතිකක්ඛන්ධක දෙකින් පැහැදිලි වෙයි. ග්‍රන්ථකරණයෙහි විවේක බුද්ධිය හා ශක්තිය බොහෝ සෙයින්ම භික්ෂූන්ට හිමි වූ නිසා විශේෂයෙන් ආගමික සිද්ධීන් ඉස්මතු වන ලෙසම ග්‍රන්ථ රචනය විය.

රජවරුන් සම්මුති දෙවත්වයෙන් සලකන්නට පුරුදු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාරතීය සිතුම්පැතුම්වලට රුචියක් දක්වූ ජනයාට රජුන් ගැන විස්තර

කියාදීමෙ දී ඔවුන් වටා ආශ්චර්යවත් සිද්ධීන් ඇතුළත් කරන්නට සිදු විය. රජවරුන්ගේ ආගමික කටයුතුවලදී දෙවියන්ගේ සහභාගිවීම දේව උපකාර ලැබීම මෙන්ම බුද්ධබලමහිමයෙන් ආශ්චර්යවත් පුද පූජා ලැබුණු ආකාරයත් ඒ ඒ අවස්ථාවල ඇතිවුණු ප්‍රාතිහාර්ය විශේෂයනුත් දක්වීම ශ්‍රෝතෘ ජනයාගේ ප්‍රසාද සංවේගය පිණිසම විය. ආගම සාමාන්‍ය ජනයා අතර ජනප්‍රිය කිරීමෙහි ලා අසිරිමත් පුවත් විශේෂ තැනක් ගනී. මුල් බුදුසමයෙන් මෙවැනි සම්ප්‍රදයයන්ට ඉඩක් නොලැබුණ ද බුදු සිරිත ලලිත විස්තරයක් කොට ගත් මහායානික අදහස් සමාජයේ පැතිරෙන විට මෙවැනි ස්වරූපයක ඊම වැලැක්විය නොහැකිය. ජනප්‍රිය බුද්ධාගම එය විය. ථෙරවාදී සම්ප්‍රදයිකයෝ බුද්ධ චරිතය ලලිත විස්තරයත් කරන්නට නොහොත් උන්වහන්සේගේ ශාරීරික ධාතූන් හා පාරිභෝගික වස්තූන් ඒ කාර්යයෙහි ලා උපයෝගී කර ගත්හ. ඇතැම් විට බුදුරජාණන් වහන්සේගෙන් නොවුණු පෙළහර උන්වහන්සේගේ ධාතූන්ගෙන් සිදුවූ බව ප්‍රකට වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මේ පිළිවෙත යටතේ ලක්දිව වංශකථාවලත් අතිශයෝක්තියට නැගූ ආගමික සිද්ධීන් දක්නට ලැබේ.

විශේෂ සිද්ධියකට පදනම නොවූ ආගමික ජාතික ඉතිහාසය කියාපාන දීපවංස, මහාවංශ, රාජාවලි, රාජරත්නාකර යන කෘතීන්ට අමතරව මහාබොධිවංශ, ථූපවංශ, ධාතුවංස, දඨාවංශ, නිකායසඞ්ග්‍රහව හෙවත් ශාසනාවතාරය වැනි කෘතීන් බිහි වූයේ ආගමික ඉතිහාසය කීමෙ මාධ්‍යයක් වශයෙනි. මේ දක්වූ වංසකථාවලියට පදනම් වූ කෘති වශයෙන් නාමාවශිෂ්ට මහාවංසට්ඨකථා, චෙතියවංසට්ඨකථා, පොරාණකථා, පොරාණට්ඨකථා, සීහලට්ඨකථා, උත්තරවිහාරට්ඨකථා, මහාබොධිවංසට්ඨකථා සඳහන් කළ හැකියි. මේ මූලාශ්‍රය කෘතීන් පිළිබඳව, මහාවංසටීකාව උපයෝගී කර ගෙන විල්හෙල්ම් ගයිගර් පඬිතුමාත්, ගුණපාල මලලසේකර මහාචාර්ය තුමාත් දීර්ඝ විමර්ශනයක් කොට ඇත.[1] මහාවිහාර අභයගිරි තරඟය නිසා මෙ ග්‍රන්ථවලින් සැහෙන ප්‍රමාණයක් ඔවුනොවුන් අතින් විනාශ වන්නට ඇතැයි යන අදහසක් ගයිගර් පඬිතුමා පළ කරයි. ඒ ඒ ආයතනයන්ට අයත් පරම්පරා කථා මෙන්ම, පොදු පරම්පරා කථා සඳහන් එම මූලාශ්‍රයන් උපයෝගී කර ගෙන රචිත වූ දැනට අප අතර ඉතිරිව ඇති ඉහත සඳහන් කළ වංසකථාවලින් පොදුවේ සමාන ඓතිහාසික වාර්තාවක් පෙනෙන බව නම් පැහැදිලිය. වෙනසකට ඇතොත් එක ග්‍රන්ථයක නැති පුවතක් වෙනත් ග්‍රන්ථයක සඳහන් වීමයි.

එම කෘතිවලින් දීපවංසය, රාජරත්නාකරය, නිකායසංග්‍රහව හැර අනෙක් කෘති සිංහල–පාලි භාෂා දෙකින්ම අප අතර ඇත. දීපවංසය පාලියෙන් පමණක් දක්නට ලැබේ. නානාවිධ මූලාශ්‍රයයන් උපයෝගී කරගෙන ශාසන ඉතිහාසයට ප්‍රධාන තැනක් දෙමින් රචනා කොට ඇති නිකායසඞ්ග්‍රහව සිංහලෙන් රචිතය. රාජරත්නාකරය මහනුවර යුගයේදී සිංහලෙන් රචිත කෘතියකි. පාලි–සිංහල

---

1. Wilhelm Geiger—*The Dipavamsa and Mahavamsa and their Historical Development in Ceylon*, p. 95. Translated into English by Ethel M. Coomaraswamy. H. C. Cottle, Government Printer, Colombo 1908.
G. P. Malalasekera: *Vamsatthappakasinī*, Vol. I, Introduction, p. 56. PTS, London 1935.

භාෂා දෙකින් දක්නට ලැබෙන කෘතීන්ගේ නූතන කෘතිය වන්නේ සිංහල කෘතියයි. පාලි කෘතිවලින් සිංහලට නැගූ බව ග්‍රන්ථයේම සඳහන් කොට ඇත. එහෙත් මුලදී ඒවා ලියැවී තිබුණේ ඊට වඩා පැරණි සිංහල කෘතීන් පදනම් කොට බව පැහැදිලි වෙයි. මහාවංසයට සීහලමහාවංසට්ඨකථාව මුල් විය. මේ පිළිබඳ ගයිගර් පඬිතුමා දීපවංස, මහාවංස අළලා ලියූ විමර්ශන කෘතියේදී දීර්ඝ සාකච්ඡාවක් කරන බව ඉහත සඳහන් කළෙමු. මහාබොධිවංසාදී අනෙක් කෘතීන් ද එමෙන්ම සිංහලයෙන් තිබූ බව මෙම නිදසුන් වලින් පැහැදිලි වෙයි.

දස්සයිස්සං මහාබොධි—වංසං භාසාය සඤ්ජුනො
පුබ්බෙ සීහළභාසාය—ඨිතං වුද්ධජනානුගො.

—මහාබොධිවංස

කිඤ්චාපි සො යතිජනෙන පුරාතනෙන
අත්ථාය සීහළජනස්ස කතො පුරාපි
වාක්‍යෙන සීහළභවෙන අභිසංඛතත්තා
අත්ථං න සාධයති සබ්බජනස්ස සම්මා

—ථූපවංස

සදෙසභාසාය කවීහි සීහළෙ
කතම්පි වංසං ජිනදන්තධාතුයා
නිරුත්තියා මාගධිකාය වුත්තියා
කරොමි දීපන්තරවාසිනං අපි

—දාඨාවංස

අප විසින් සංස්කරණය කරණ ලද ධාතුවංසය ද සිංහලයෙන් තිබී පාලියට නැගූ කෘතියකැයි විශ්වාස කළ හැකිය. එහි ඇති ව්‍යාකරණදෝෂයන් හා සිංහල රීතියට බරවූ අව්‍යක්ත පාලි යෙදුම් ගැන සලකන විට ඒ අදහස සනාථ වෙයි. එහෙත් පාලි නලාට ධාතුවංසය කකුසන්ධ හිමියන්ගේ ධාතුවංසයේ පරිවර්තනයක් නොවන බව පෙර සඳහන් කළ පරිදි නැවතත් අවධාරණය කළ යුතුය. තවද මහාබොධිවංස වැනි කෘතිවල කීවාක් මෙන් සිංහලෙන් තිබී පාලියට නඟන ලද බවක් ධාතුවංසයේ නොකියැවේ. සිංහලෙන් තිබූ කෘතියක් නොවූව ද සිංහල මූලාශ්‍රයක් උපයෝගී කර ගෙන පාලියෙන් ලියූ කෘතියක් හෝ විය හැකිය. අනුරාධපුරය කේන්ද්‍රස්ථානය කොට ගෙන වැඩුණු සාහිත්‍යයට අමතරව රෝහණ ප්‍රදේශය ආශ්‍රය කර ගෙන ද පාලි සාහිත්‍යයක් වැඩෙන්ට ඇතැයි පිළිගනිතොත් එම සාහිත්‍යාවලියේ කෘතියක් ලෙස ධාතුවංසය හැඳින්විය හැකියි. රෝහණය ආශ්‍රිත කථා බහුල වූ සීහළවත්ථු, සහස්සවත්ථු රසවාහිනී වැනි ග්‍රන්ථ ගැන විමසන විට රුහුණේ ජනකථා සාහිත්‍යයක් ගැන කරුණු වටහා ගත හැකියි. පාලි අට්ඨකථාවල ද රුහුණේ සිතුල්පව්ව, තිස්ස මහාවිහාරය ඇසුරු කොට කියැවෙන ප්‍රවෘත්ති බොහෝයි. දීපවංස, මහාවංස

කෘතිවලට මූලාශ්‍රය වූ කෘතීන් ගැන සාකච්ඡාවක් කරන මහාචාර්ය විල්හෙල්ම ගයිගර් මහත්මා විහාරස්ථානවල පැවති වංසකථා ගැන සඳහන් කරමින් රොහණවංසකථාවක් ගැන කියයි.[1]

එසේම එම ග්‍රන්ථයේදීම ඒ මහත්මා විස්තර කරන පුස්කොළපොත්වලින් ද උසස් බෞද්ධචරිතයන් ඇතුළත් වූවායැයි සැලකිය හැකි අරියවංස නම් කෘතිය ද මෙහි ලා සැලකිය යුතුයි. දුටුගැමුණු රජුට පුස්කොළපොත්වලයක් තිබූ බව අපි දනිමු. ඔහුගේ පියරජුන් වූ කාවන්තිස්ස රජුට ද එවැන්නක් තිබුණේයැයි සිතේ. එවැනි රෝහණවංසකථාවක් අරියවංසකෘතියක් හා පින්පොතක් උපයෝගී කරගෙන ධාතුවංසය රචිතයයි සිතේ.

**ග්‍රන්ථ නාමය**

ජාතික ආගමික ඉතිහාසය ලියැවුණු ග්‍රන්ථ දීපවංස මහාවංස වූ අතර අනික් පූජනීය වස්තූන් හා ස්ථාන පිළිබඳ ලියැවුණු ඉතිහාසය ඒ ඒ නම්වලින් හඳුන්වා ඇත. දසවැනි සියවසෙහි මධ්‍යභාගයෙහි පමණ උපතිස්ස නම් තෙරකෙනකුන් විසින් අනුරාධපුරයෙහි ශ්‍රීමහාබොධින්වහන්සේ පිළිබඳ ඉතිහාස පුවත මුල්කොට කළ ග්‍රන්ථය මහාබෝධිවංසයයි. දෙවන පැරකුම්බා (1236-1270) රජුගේ ධර්මාගාරයෙහි නියුක්ත වාචිස්සර නම් තෙර කෙනකුන් විසින් අනුරාධපුර රුවන්මැලිසෑය පිළිබඳ ඉතිහාසය මුල් කොට, පාලියට නඟා සකස් කළ කෘතිය ථූපවංසයයි. වාචිස්සර හිමිවරුන් කිහිප නමක් දහතුන්වැනි සියවසේ සිටින්නට ඇතැයි ද එයින් ප්‍රකට වශයෙන් ජ්‍යෙෂ්ඨ–කණිෂ්ඨ යයි දෙනමක් ගණන් ගත හැකි බවද ථූපවංසය කරන ලද්දේ සාරිපුත්ත හිමියන්ගේ ශිෂ්‍ය කණිෂ්ඨ වාචිස්සර හිමියන් විසින් බවද මහාචාර්ය ජී. පී. මලලසේකර මහත්මා පවසයි.[2] තම ථූපවංස පරිවර්තනයේදී කර්තෘ පිළිබඳ දීර්ඝ විමර්ශනයක් කරන මහාචාර්ය ජයවික්‍රම මහතා මලලසේකර මහතා දක්වන පරිදි ශාරිපුත්‍ර ශිෂ්‍ය කණිෂ්ඨ වාචිස්සර හිමියන් නොව වෙනත් වාචිස්සර හිමිනමක් ථූපවංස කර්තෘ විය හැකි බව පළකරයි.[3] ලීලාවතී රැජිනගේ සමයෙහි (1208-1211) ධම්මකිත්ති නම් තෙර කෙනකුන් විසින් දාඨාවංසය කරන ලදි. එය ද පෙර සිංහලෙන් තිබූ කෘතියකි. මහාවංස ද්විතීය භාගය ලියූ තෙරණුවන් සඳහන් කරන නාමශේෂ ග්‍රන්ථයක් වූ කේසධාතුවංසය බුදුන්ගේ කේශධාතූන් පිළිබඳ ඉතිහාසය ඇතුළත් වූවකි.[4]

බුද්ධපාරිභෝගික ස්ථානයක් හෝ ශාරීරික ධාතූන් වහන්සේ නමක් ගැන හෝ නොවන බෝධිසත්ව ගුණෝපෙත සිරිසංඝබෝධි රජු හිස දන් දුන් තැන ගෝඨාභය රජතුමා විසින් සිහිවටනයක් වශයෙන් චෛත්‍යයක් ඉදිකොට

---

1. Wilhelm Geiger—*Culture of Ceylon in Mediaeval Times*, p. 72. edited by Heinz-Bechert, 1960.
2. ජී. පී. මලලසේකර – ලංකා පාලි සාහිත්‍යය (සිංහල පරිවර්තනය), 150–151 පිටු. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1965.
3. N. A. Jayawickrama: *The Chronicle of the Thupa and the Thupavaṃsa*, Introduction, pp. 18-24. PTS, London, 1971.
4. මහාවංස, 39 පරි. 56 ගා. ජ කේසධාතුවංසය (ed. Minayeff, J P T S 1885) ට වෙනස් කුඩා පොතකි (පිටු 16).

කුරවූ විහාරය පිළිබඳ ඉතිහාසය අළලා ලියූ ග්‍රන්ථය හත්ථවනගල්ල විහාරවංසය වේ. ආකෘතිය වශයෙනුත් රචනා විලාශය අතිනුත් එම ග්‍රන්ථය සංස්කෘත සාහිත්‍යයට නැකම කියයි.

ධාතුවංසයෙන් බුදුන්ගේ නළාට ධාතුව පිළිබඳ ඉතිහාසය කියැවෙයි. ග්‍රන්ථාරම්භයේදී

**සම්බුද්ධමතුලං සුද්ධං—ධම්මං සංඝං අනුත්තරං**
**නමස්සිත්වා පවක්ඛාමි—ධාතුවංසප්පකාසනං**

යනාදි වශයෙන් ධාතුවංසය යන නම තැබුවත්, ග්‍රන්ථාවසානයේදී

**එත්තාවතා නලාටධාතුසංවණ්ණනා සමත්තා**

නලාටධාතුසංවණ්ණනා යන නම යොදයි. ථූපවංසයේ ප්‍රධාන පරමාර්ථය මහාථූපවර්ණනාව වුව ද දසථූපකථාදි අනිත් ථූපයන් පිළිබඳවත් සාමාන්‍ය ඉතිහාසයත් දැක්වෙන නිසා ථූපවංස යන සාමාන්‍ය නාමයෙන් එය හැඳින්වූවාක් මෙන් නලාටධාතුව පිළිබඳ ඉතිහාසය කීම ප්‍රධාන අරමුණ වූවත් වෙනත් ධාතුන් පිළිබඳ වෘත්තාන්ත ද ඇතුළත් වන නිසා ධාතුවංස යන සාමාන්‍ය නාමය ධාතුවංසයටත් මුලදී යොදන්නට ඇත. එහෙත් ප්‍රධාන විස්තරය නලාටධාතුව පිළිබඳව වූ හෙයින් අවසානයේදී නලාටධාතුසංවණ්ණනා යන නම යොදන්නට කර්තෘ රුචි වූවා විය හැකිය.

**ග්‍රන්ථ ස්වරූපය**

ධාතුවංසය පරිච්ඡේද පහකින් සමන්විත වෙයි. සරල පාලි භාෂාවෙන් ගද්‍ය-පද්‍ය මිශ්‍රවූ චම්පූ කාව්‍ය ලක්ෂණ ඇතිව රචනා කොට ඇති මෙය කාව්‍ය ස්වරූපයකට වඩා වෘත්තාන්ත ස්වරූපයක් ගනී. පළමුවන පරිච්ඡේද-යෙන් බුදුරදුන්ගේ ලඞ්කාගමන කථා විස්තර වෙයි. තුන්වෙනි ගමනේදී සිදුවූ සිද්ධින් ශ්‍රෝතෘජනයාට කුතුහලයක් දනවන ආකාරයෙන් වර්ණනා වෙයි. දෙවන පරිච්ඡේදයෙන් බුදුරදුන්ගේ පිරිනිවීම, ආදහන පූජෝත්සවය, ධාතු බෙදීම පිළිබඳ තොරතුරු ආදිය විස්තර වෙයි.[1] තුන්වන පරිච්ඡේදයෙන් නලාට ධාතූන්වහන්සේ පිළිබඳ ඉතිහාස කථාව කියැවේ. මහානාග රජු අතට නලාට ධාතූන් වහන්සේ පත්වීමත් කළ පූජාවිධිත් අතිශය භක්තියෙන් යුතුව වර්ණනා වෙයි. සතරවන පරිච්ඡේදයෙන් කාවන්තිස්ස රජුගේ පූර්වචරිතයත් වර්තමාන චරිතයත් විග්‍රහ වෙයි. එහි සඳහන් කාවන්තිස්ස රජුගේ පූර්වචරිතය පින්පල පෙන්වීමට අගනා නිදසුනක් ලෙස කතෘ සිතුවා විය හැකියි. එම පරිච්ඡේදයේ ඇති තවත් විශේෂ සිද්ධියක් නම් සෝමාවතී චෛත්‍යය ඉදිකිරීම පිළිබඳ ප්‍රවෘත්තියයි. කාවන්තිස්ස රජපරපුරේ ඇත්තන් පිනට–දහමට ඇති ලැදිකම වඩාත් හුවා දක්වන්නට සෝමා දේවියගේ ඉල්ලීමෙන් කළ මෙ චෛත්‍යය පිළිබඳ පුවත දැක්වූවා විය හැකිය. පස්වැනි පරිච්ඡේදයෙන් සේරුවාවිල මඞ්ගලමහා චෛත්‍යයේ නිර්මාණයත් එහි නධාතුව සඳහා කළ පූජාත් සඳහන් වේ. එතැන කළ සීමාබන්ධනයත් කාවන්තිස්ස රජු කළ වෙනත් විහාරයන්ගේ නාමාවලියත් එම පරිච්ඡේදයට අයත් වේ.

---

1. සෙසු පොත්වල එන විස්තර මේ හා සමානය

**නලාටධාතු කථා පුවත**

ධාතු බෙදන අවස්ථාවේදී නලාට ධාතූන් වහන්සේ මල්ල රජදරුවන්ගේ කොටසට ඇතුළත් වූහ. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ, නලාටධාතුව අනාගතයෙහි තම්බපණ්ණිදීපයෙහි පිහිටුවන්නට බුදුරදුන් අනුදත් බව කියා මල්ල රජුන්ගෙන් එය ලබා ගත්හ. උන්වහන්සේ ජීවිතාවසානයේදි සද්ධිවිහාරික මහානන්ද තෙරුන් අමතා අනාගතයෙහි තම්බපණ්ණිදීපයෙහි මහවැලි නදියේ දකුණුපස සේරුවාවිල සමීපයෙහි කාවන්තිස්ස රජු විසින්කරවනු ලබන චෛත්‍යයෙහි නිදන් කරනු පිණිස පරම්පරාවෙන් පරම්පරාවට රැක ගන්නැයි කියා භාර කළහ. මහානන්ද තෙරණුවෝ එය විසාලානුවර මහාවන විහාරයෙහි කූටාගාර සාලායෙහි පිහිටුවා පුද පූජා පවත්වමින් සිට අවසානයෙහි සද්ධිවිහාරික චන්දගුත්ත තෙරණුවන්ට ධාතුවංසය කියා පැවරූහ. උන්වහන්සේ එය බරණැස ඉසිපතන විහාරයෙහි තබා පුද පවත්වා ස්වකීය සද්ධිවිහාරික ජයසේන තෙරණුවන්ට පවරා පිරිනිවියහ. ජයසේන තෙරණුවෝ රජගහනුවර වේළුවන විහාරයෙහි ගන්ධකුටියෙහි තබා පුද පවත්වමින් සිට මහාසංඝරක්ඛිත තෙරණුවන්ට පවරා පිරිනිවියහ. උන්වහන්සේ එය කොසඹෑනුවර ඝෝසිතාරාම ගන්ධකුටියෙහි තබා පුද පවත්වා සද්ධිවිහාරික මහාදේව තෙරණුවන්ට පවරා පිරිනිවියහ. මහාදෙව තෙරණුවෝ දෙවනපෑතිස් මහරජුගේ සොහොයුරු මහානාග යුවරජු මාගම සේසත් නැගූ කාලයෙහි ලක්දිව හත්ථෝට්ඨ ජනපදයෙහි කුක්කුටපබ්බතයෙහි මහසල් රුකක් මුලට නලාට ධාතූන් වහන්සේ රැගෙන වැඩියහ.එ තැන තබා ගෙන පුද පූජා පවත්වමින් සිටින අතර ඒ ජනපදයෙහි මහාකාල නම් උපාසකයකුගෙන් එපවත් දැන ගත් මහානාග යුවරජ තෙරුන් හමු වීමට ගියේය. තමන්ට ධාතූන් වහන්සේ පවරන ලෙස ද ඉල්වා සිටියේය. තෙරණුවෝ පරපුරෙන් පරපුරට පුද පූජා පවත්වමින් ධාතූන්වහන්සේ ගෙන ආ ආකාරය පැහැදිලි කොට ඉදිරියටත් එසේ කරන ලෙස දන්වා රජුට පැවරූහ. යුවරජ මහපෙළහරින් ධාතූන් වඩා ගෙනවුත් මාගම රජමැදුරට නුදුරෙහි දාගෙයක් කරවා එහි ද විසිතුරු මණ්ඩපයක් නිමවා සත්රුවන් කරඬුවක බහාලූ නලාටධාතූන් වහන්සේ එහි තබා පුදපූජා පවත්වමින් ආරක්ෂා කළේය. ඔහු ඇවෑමෙන් යටාලතිස්ස රජුද ඔහුගෙන් පසු ගොඨාභය රජුද පුදපෙළහරින් ආරක්ෂා කළ ධාතූන් වහන්සේ ගෝඨාභය රජුගෙන් පසු කාවන්තිස්ස රජු අතට පත්වූහ. එතුමා චූල්ලපිණ්ඩපාතියතිස්ස තෙරුන්ගේ අනුශාසනා ඇතිව සේරුවාවිල මඞ්ගල මහා චෛත්‍යයකරවා එහි නිදන් කළේය. අනාගත පූජා සඳහා ගම්වර ද පිදීය.

**රචනා කාලය**

නලාට ධාතුවංසය කවර කාලයක රචනා වූවක් ද කතෘ කවරෙක් ද යන්න තීරණය කිරීමට ග්‍රන්ථාභ්‍යන්තරයෙන් හෝ බැහැරින් තොරතුරු කිසිවක් නොලැබෙයි. පාලි කෘතිය සිංහලයට නැගූ ධාතුවංසයක් ඇත. එම කෘතිය පාලි කෘතියේම අනුවාදයක් ලෙස සලකන්නට ඇතැම් උගතුන් මැලි වන බවක් පෙනේ. "ධාතුවංසය එහි භාෂාවිලාසයට අනුව දඹදෙණි සමයේ රචිතයයි ගත හැකි කෘතියකි. එහෙත් ඇතුළත් කරුණු අනුව දිගු කලක් තිස්සේ

සුරැකිව පැවති වෘත්තාන්ත කීපයක් පදනම්කොට සකස්කර ගන්නා ලද බව පෙනේ.''[1] මෙ සිංහල ධාතුවංසය දෙවැනි වරට දඹගස්ආරේ ශ්‍රී සුමෙධඞ්කර මහාස්වාමීන් විසින් 1924 දී ප්‍රකාශයට පත් කරන ලදී. ප්‍රථම වරට සිංහල ධාතුවංසය ගිංතොට සිරිධම්මක්ඛන්ධ ස්වාමීන් විසින් සුද්ධියට පමුණුවා මුද්‍රණය කරවන ලදූයි සුමෙධඞ්කර හිමියෝ පවසති.[2] ඒ පිටපත අප අත නොගැසිණි. රුහුණු ඉතිහාසය ගැන කරුණු සොයන්නන්ට ධාතුවංසය මුද්‍රණද්වාරයෙන් පිටවීමෙන් වූයේ මහඟු සෙතකි. පාලි ධාතුවංසය ගැන වටිනාකමක් මතු වූයේ ද එම කෘතිය ප්‍රකාශයට පත්වීමෙනි. එය ප්‍රථම වරට ප්‍රකාශයට පත් කිරීම නිසා ගිංතොට සිරිධම්මක්ඛන්ධ ස්වාමීන්ද්‍රයන්ටත් ඒ කෘතියෙන් කියවෙන මඞ්ගල මහා චෛත්‍යය දියුණු කිරීම නිසා සුමෙධඞ්කර ස්වාමීන්ද්‍රයන්ටත් ලැබිය යුත්තේ උසස් උපහාරයකි. සිංහල ධාතුවංසයේ කර්තෘත්වය කකුසන්ධ නම් තෙරකෙනෙකුන් අයත් වේ.

''සම්බුද්ධසාසනසුරද්දුමතුඞ්ගසිඞ්ග
ජාතො පබුද්ධකුසුමො කකුසන්ධනාමො
වාචංයමො රුචිරසීහළවුත්තියා'මං
ගන්ථං අකාසි වරනිබ්බුතිසොධනාය''

යන ග්‍රන්ථාවසාන ගාථාවෙන් එය පැහැදිලි වේ. සිංහල ධාතුවංසය හුදෙක් පාලි කෘතියේ අනුවාදයක්ම නොවේ. පාලි කෘතියේ කෙටියෙන් කී දෑ වර්ණනාත්මක විලාසයෙන් ඉදිරිපත් කරන තැන්ද පාලි ධාතුවංසයේ තිබෙන ඇතැම් ගාථා අත්හරින තැන්ද දක්නට ඇත. වර්ණනා විලාසයට අමතරව පාලි ධාතුවංසයේ නැති ගාථා එකතු කළ තැන් ද පෙනේ. කාවන්තිස්ස රජුගේ අතීත භවයක් විස්තර වන වරක ප්‍රවෘත්තියේ පසේබුදුන් පොළඹවා ගන්නට තැත් කරන වරක බිරියගේ මුවට නංවන ගාථා පාලි කෘතියේ නැත.

නනු නාම මනුස්සෙහි භුත්වා කාමං යථාසුඛං
යොබ්බනං අවිනාසෙත්වා පබ්බජිතපයි වත්තියො

ජිණ්ණෙන චරිතො ධම්මො න නස්සති න දුස්සති
චිණ්ණසෙසකගතා හොති ලොකෙන ච පසංසියො

මනොහරාජං යො මොහා ඛණ්ඩෙය්‍ය ඵුසකටංසුනා
යොබ්බනෙ රාගමත්තෙහ ඛජ්ජනං තපසා යථා

නත්ථ'ඤ්ඤං මධුරං භන්තෙ පංචකාමසමං භුවි
මා මොහෙන විරාධෙථ උභො භන්තෙ රමාමසෙ[3]

---

1. ගුණපාල සේනාධීර–රුහුණේ අප්‍රකට පුරාවස්තු, 20 පිට. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1964.
2. සිංහල ධාතුවංසය, විඥපනය, දඹගස්ආරේ සුමේධඞ්කර, මහාබොධි යන්ත්‍රාලය, කොළඹ, 1930.
3. සිංහල ධාතුවංසය, මකුළුදූවේ පියරතනථෙර සංස්කරණය, 26 පිට. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1941.

මේ ගාථා රසවාහිනියේ නොවෙනස්වම ඇත. එහෙත් රසවාහිනියේ ද සහස්ස වත්ථුප්පකරණයේ ද මේ කථා වස්තුවේ දී දක් වූ ස්ත්‍රීන්ගේ අත්‍යාප්තිකර කාමාශා දක්වෙන ගාථාපෙළ සිංහල ධාතුවංශයේ නැත. සත්‍යාසත්‍යතාව කෙසේ වුවද මෙය පාලියෙන් රචිත රසවත් ගාථා පෙළකි. රසවාහිනියේ තුබූ එම ගාථා සිංහල ධාතුවංශයේ නැති හෙයින් රසවාහිනිය ඇසුරෙන් එම කථාව දියුණු කළායයි කීම ද අසීරුය. ඒ හැරත් එම කාකවණ්ණතිස්ස කථාව ධාතුවංශයට වඩා ව්‍යක්ත ලෙස රසවත් ලෙස රසවාහිනිය ඉදිරිපත් කරයි. සිංහල ධාතුවංශය රසවාහිනියට පශ්චාත්කාලීන නම් එහි ව්‍යක්තභාවය එහි ද අනුගමනය කරනු ඇත. සියලුම ගාථා ද ඇතුළත් කරනු ඇත.

පාලි ධාතුවංශයේ මෑත සීමාව සෙවීමෙහි ලා උපකාර කරගත හැකි පාලි ග්‍රන්ථය නම් ථූපවංසයයි. කථාවස්තුවෙන් ස්වරූපයෙන් සංදර්භයෙන් කෘති දෙකම බෙහෙවින් සමාන වේ. භාෂා තත්වයෙන් ථූපවංසය උසස් තැනක් ගනී. ධාතුවංසයෙන් සේරුවාවිල මඞ්ගල මහාචෛත්‍යයේ ඉතිහාසය කියවෙන අතර ථූපවංසයෙන් අනුරාධපුර රුවන්මැලිසෑයේ ඉතිහාසය කියවෙයි. ධාතුවංසය ඇරඹෙන්නේ සංක්ෂිප්ත බුද්ධ චරිතය දක්වීමෙනි. ථූපවංසය ද සංක්ෂිප්තව බුද්ධ චරිතය ඉදිරිපත් කරතත් ප්‍රථම විවරණය ලැබූ සුමෙධ කාලයේ සිටම දක්වයි. ග්‍රන්ථ දෙකෙහිම පරිනිර්වාණයත් ආදහන පූජාවත් ධාතු බෙදීමත් විස්තර වේ. ධාතුවංසයේ ඇති බුදු රජුන්ගේ ලංකා ගමන කථා ථූපවංසයේ නැත. තෙවැනි ගමනේදි යම් යම් තැන්වල සමාපත්තින්ට සමවැදුණු බව මහාවංශයේ සඳහන් වේ.[1] ධාතුවංසයේ ඒ ප්‍රවෘත්තිය තවත් විස්තර කරමින් ඒ තැන් ආරක්ෂා කිරීමට ඒ ඒ දෙවියන් නවත්වා ගිය බව සඳහන් වෙයි. ධාතුවංසය ලංකාගමන කථාව දක්වනුයේ මඞ්ගල මහා චෛත්‍යයෙහි වංසකථාව හා ගලපනු සඳහායි. බුදු රජුන් සේරුවාවිලට වැඩි බව කීම එහි අරමුණයි. බුදු රජුන් සේරුවාවිලට වැඩි බවක් පිළිගත් වෙනත් වංශකථාවක සඳහන් නොවේ. එහි වැඩියා පමණක් නොව තමන් වහන්සේගේ ගඳකිලිය අසල පොකුණ අරක්ගත් සුමන නාග රාජයාද කැඳවා ගෙන අවුත් සේරුවාවිල චෛත්‍යය පිහිටන තැන ආරක්ෂාවට නැවැත්වූ බව ද සඳහන් වෙයි. සේරුවාවිලට වැඩීමේ පුවත සාටෝප ලීලාවකින් ඉදිරිපත් කරන්නේ ඒ ස්ථානයට අතිපූජනීයත්වයක් ලබාදීමට විය හැකියි. ආදහන පූජාව, ධාතු බෙදීම, ග්‍රන්ථ දෙකෙහිම භාෂාවෙන් හා රචනා ශෛලියෙන් ද සමාන.වේ. ථූපවංසයට අවශ්‍ය වන පසුබිම වශයෙන් ථූප නිර්මාණ පිළිබඳ වංශකථාව දක්වන අතර ධාතුවංසය එයට අවශ්‍ය පසුබිම වශයෙන් ධාතු පරම්පරාව කියා නලාට ධාතුවංස කථාව ප්‍රමුඛත්වයට ගනී. ධාතු බෙදීමේ පුවතේදී පාලි ධාතුවංසයේ විශේෂ පුවතක් එයි. එනම් දළද තුනක්ම ද්‍රෝණ බමුණා විසින් සඟවා ගත් බවයි. මේ පුවත වෙනත් කෘතියක දක්නට නැති අතර සිංහල ධාතුවංශයේ ද සඳහන් නොවේ. ධාතු බෙදීමේ සිට යම් ධාතූන් වහන්සේ නමක්, බොහෝ කාලයකට පසු කෙරෙන ධාතු නිධානය තෙක්, අඛණ්ඩව රැක ගෙන ඒමේ පුවතක් සඳහන් වන කෘතියක්

1. මහාවංස, 1 පරි. 32 හා.

වෙනොත් එය ධාතුවංසයයි. එහි නලාට ධාතුව ගෙන ආ ස්ථවිර පරම්පරාව දක්වා ඇත. අවසන් වන්නේ සේරුවාවිල මඞ්ගල මහා චෛත්‍යයේ එය නිදන් කිරීමෙනි. ශාසන ඉතිහාසයෙහිලා ස්ථවිර පරම්පරාවක් සොයතොත් මේ ඉතා වැදගත් වාර්තාවකි. ථූපවංසය සෙසු සිද්ධස්ථාන කීපයක් ඇතුළත් මහාථූපයේ වංශකථාව ගෙනහැර දැක්වීමේ ව්‍යාජයෙන් දුටුගැමුණු වෘත්තාන්තය ඉදිරිපත් කරයි: (යුද්ධෙ දනෙ ච සුරෙන සුරිනා රතනත්තයෙ-ආදි තැන්).[1] එසේම නලාට ධාතුවංශ කථා ව්‍යාජයෙන් කාවන්තිස්ස වෘත්තාන්තය මෙහි ඉදිරිපත් වේ. මෙවැනි ධර්ම කථා ව්‍යාජයෙන් ඉදිරිපත් කරන ලද නවත් "තිරච්ඡානකථා" සංඛ්‍යාත රාජකථා තිබෙන්නට ඇත. මේ ගණයට එබඳු පොත් නොවැටෙන සේ නිතරම පාහේ "සුජනප්පසාද සංවෙගත්ථාය කතෙ" කියා දක්වේ. චරිත දෙක්හිම අතීත චරිතයත් වර්තමාන චරිතයත් ප්‍රකටවෙයි. ධාතුවංසයෙහි සේරුවාවිල මඞ්ගල මහා චෛත්‍යය ගොඩනැගූ අයුරුත් ථූපවංසයෙහි අනුරාධපුර රුවන්-මැලිසෑය ගොඩනැගූ අයුරුත් දක්වෙයි. චෛත්‍ය ඉදිකරන තැන් ග්‍රන්ථ දෙකෙහිම අසිරිමත් විලාසයකින් දක්වෙයි. ථූපවංසය අනුව මහාසෑය පිහිටුවන තැන දැන ගන්නේ දුටුගැමුණු රජු මහාබෝධිපූජාව කොට ආපසු නගරයට පිවිසෙද්දී දුටු ශිලාස්ථූපයක් ඇසුරෙනි. ධාතුවංසයේ එය දැනගන්නේ ආශ්චර්යවත් සිද්ධීන් කීපයක මාර්ගයෙනි. කාවන්තිස්ස රජුගේ ඇතුන් අසුන් ගොනුන් නොසැලී ලැග සිටි ස්ථානය චෛත්‍යය පිහිටන ස්ථානයයි තීරණය කෙරේ. ධාතුවංසයට වඩා ථූපවංසයේ ධාතුගර්භ වර්ණනාව විස්තාරිතව ඇත. සේරුවාවිල චෛත්‍යයේ ධාතුගර්භයේ ඇති විශේෂයක් නම් කාකවණ්ණතිස්ස රජුගේ රූපයත් චූලපිණ්ඩපාතිකතිස්ස තෙරුන්ගේ රූපයත් එහි තුළ කරවීමයි. ධාතුවංසයෙහි චෛත්‍ය නිර්මාණයෙන් පසු සංඝාරාමයක් සාදවා චූල්ලපිණ්ඩ පාතික තිස්ස තෙරණුවන්ට අතපැන් වත් කොට පුද ස්ථානයේ අනාගත සංරක්ෂණය සඳහා ගම්වරත් පුද භික්ෂූන්ට අවශ්‍ය සීමා බන්ධයක් ද කෙරෙයි. ථූපවංසයේ එවැන්නක් නැත. ධාතුවංස අවසානයෙහි කාකවණ්ණතිස්ස රජු කරවූ වෙනත් විහාරයන්හි නාමාවලියක් සඳහන් වන අතර ථූපවංසයෙහි මරණ මංචකයෙහි හුන් ගැමුණු රජුට කළ නොයෙක් පිංකම් සඳහන් කෙරෙයි. මේ රජවරුන්ගේ අනාගත ජන්මය විස්තර කරන ධාතුවංසය කාවන්තිස්ස රජු අනාගතයෙහි මෙතේ බුදු රජුන්ට පියා වන බවත් විහාරදේවිය මව වන බවත් ගැමුණු කුමරු අග්‍රශ්‍රාවක වන බවත් සද්ධාතිස්ස කුමරු ද්විතීය ශ්‍රාවක වන බවත් සඳහන් කරයි. ථූපවංසයේත් එය එසේම සඳහන් වන අතර වැඩිමනත් වශයෙන් ගැමුණු කුමරුගේ නැන්දණිය වූ අනුලා දේවිය මෙතේ බෝසතුන්ට අගමෙහෙසිය වන බවත් සාලියකුමරු පුතා වන බවත් භාණ්ඩාගාරික සංඝ ඇමති අග්‍රඋපස්ථායක වන බවත් ඒ ඇමතිගේ දියණිය අග්‍රඋපස්ථායිකාව වන බවත් සඳහන් වෙයි. මෙසේ කථාවස්තුව අතිනුත් සංදර්භය අතිනුත් ධාතුවංසයත් ථූපවංසයත් සැහෙන සමානකමක් දරන බව පෙනේ. ථූපවංසය ගැමුණු කුමරුගේ දිග්විජය සඳහන් වීරකාව්‍යයක ස්වරූපය ගන්නා අතර ධාතුවංසය කාවන්තිස්ස රජු පිළිබඳ වෘතාන්ත ස්වරූපයක් ගනී. භාෂා තත්ත්වය අතින්

1. N. A. Jayawickrama, *Ibid* p. 216.

ථූපවංසය ධාතුවංසයට වඩා ව්‍යක්තවූත් බුද්ධිගෝචර වූත් විලාසයක් පෙන්වයි. භාෂාවිලාසය අතින් ඇති සමානකම හා එවැනි අවස්ථාවලදී ථූපවංසයේ පෙනෙන නිවැරදි ස්වරූපය දැනගැනීමට මේ 'වාක්‍යඛණ්ඩ කීපය සසඳනු වටී.

ධාතුගබ්භෙ ගන්ධා මා සුස්සන්තු පුප්ඵානි මා මිලායන්තු රතනානි මා විවණ්ණා හොන්තු පූජාභණ්ඩානි මා නස්සන්තු පච්චත්ථිකපච්චාමිත්තානං ඔකාසො වා විවරො වා මා හොන්තූති අධිට්ඨහිංසු.

—ධාතුවංස

ධාතුගබ්භෙ ගන්ධා මා සුස්සන්තු මාලා මා මිලායන්තු දීපා මා නිබ්බායන්තු රතනානි මා විවණ්ණා හොන්තු පූජනීයභණ්ඩානි මා නස්සන්තු පච්චත්ථිකානං ඔකාසො මා හොන්තූති අධිට්ඨහිංසුං.

—ථූපවංස

සිනෙරුස්ස මත්ථකෙ පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලාසනෙ අම්හාකං සත්ථුනො පටිමං ඝනකොට්ටිමරත්තසුවණ්ණමයං කාරාපෙත්වා මාතුදෙවපුත්තපමුඛා දසසහස්සචක්කවාළදෙවතානං සත්තපකරණං අභිධම්මං දෙසනාකාරෙන නිසීදාපෙසි. තස්ස වීසති නඛා අක්ඛිතලානං සෙතට්ඨානානි ජාතිඵලිකමයානි අඞ්ගුලියො සුවණ්ණමයා හත්ථපාදතලානිච දන්තාවරණානිච අක්ඛීනං රත්තට්ඨානානිච ජාතිපවාළමයානි කෙසමස්සු භමුකට්ඨානානි ඉන්දනීලමයානි සමචත්තාලීසදන්තා වජිරමයා අහෙසුං. උණ්ණලොමං පන සුවණ්ණභිත්තියං ඨපිත රජත බුබ්බුලවිලාසං රජතමයං අහොසි.

—ධාතුවංස

බොධිරුක්ඛස්ස පාචීනදිසාභාගෙ රතනම්භයෙ කොටිඅග්ගනකෙ පල්ලඞ්කෙන ඝනකොට්ටිමසුවණ්ණමයං බුද්ධපටිමං නිසීදාපෙසි. තස්සා පටිමාය වීසති නඛා අක්ඛීනං සෙතට්ඨානානිච ඵලිකමයානි හත්ථතලපාදතලදන්තාවරණානි අක්ඛීනං රත්තට්ඨානානිච පවාළමයානි. කෙසභමුකානි අක්ඛීනං කාළකට්ඨානානිච ඉන්දනීලමයානි. උණ්ණලොමං පන රජතමයං අහොසි.

—ථූපවංස

පළමු නිදසුනෙහි දීපා මා නිබ්බායන්තු යනුවෙන් ථූපවංසයෙහි දක්නට ඇති අතර පච්චත්ථිකානං ඔකාසො මා හොන්තූති අධිට්ඨහිංසු යනුවෙන් නිවරදව ඇත. දෙවැනි නිදසුනෙහි ධාතුවංසයේ තස්සා/අක්ඛිතලානං/ ජාතිඵලිකමයානි/ ජාතිපවාළමයානි/ කෙසමස්සුභමුකට්ඨානානි යන තැන්

ථූපවංසයේ "තස්සා පටිමාය, අක්ඛීනි ඵළිකමයානි, පවාළමයානි, කෙසභමුකානි" යනාදි වශයෙන් වඩා ව්‍යක්ත ලෙස යොද ඇත. "අඞ්ගුලියො සුවණ්ණමයා, සමවත්තාලිසදන්තා වජිරමයා" යන විස්තර ථූපවංසයෙහි නැත. "උණ්ණලොමං පන සුවණ්ණභිත්තියං ඨපිතරජතබුබ්බුලවිලාසං රජතමයං" යනුවෙන් කියවෙන විස්තරය ථූපවංසයේ දක්වූයේ උණ්ණලොමං පන රජතමයං යනු සැකෙවෙනි. ථූපවංස වාක්‍යවල වඩා ව්‍යක්තභාවයක් අනවශ්‍ය වර්ණනා නොකිරීමත් මෙයින් පෙනේ. පිළිමය සතරනින් කළ බව ග්‍රන්ථ දෙකම දක්වයි. එවිට අඞ්ගුලියො සුවණ්ණමයා (ඇඟිලි රනමුවාමය) යි අමුතුවෙන් නොකිවමනායි. සමවත්තාලිසදන්තා වජිරමයා යි ධාතුවංසයේ දක්වේ. දත් පෙනෙන සේ ප්‍රතිමා නිර්මාණයක් නැත. ථූපවංශයේ එවැනි අනවශ්‍ය විස්තර නැති බව ඉන් පැහැදිලිය. "උණ්ණලොමං පන සුවණ්ණභිත්තියං ඨපිතරජතබුබ්බුලවිලාසං රජතමයං" (රන්බිත්තියක තැබූ රිදී බුබුලක විලසින් රිදීමය යි) සඳහන් වන අතර ථූපවංසය සඳහන් කරන්නේ උණ්ණලොමං රජතමයං පමණි. ඌර්ණරෝමය බුබුලකට උපමා කිරීම ඖචිත්‍යහීනය. මෙ කරුණු සලකා බැලීමේදී ථූපවංසයේ ව්‍යක්තභාවය පැහැදිලිය. ථූපවංස කතුවරයා වූකලී දෙවැනි පරාක්‍රමබාහු රජුගේ ධර්මාගාරයේ නියුක්තව සිටි වාචිස්සර තෙරනුවෝය. මෙ පාඨ සංසන්දනය කිරීමෙ දී පෙනී යන්නේ ථූපවංසය වඩා පැරණි බවයි. වැඩි කල්පනාවක් නොමැතිව ථූපවංසයේ එන කොටස් ධාතුවංසයේ පුළුල් කොට තිබේ. නලාට ධාතුවංසයෙහි සඳහන් දත් 40 විදුරුමිණිමුවා වූවත් ඒවා කිසිවෙකුට නොපෙනේ. බුදුරදුන්ගේ දන්තවිදංසකයක් ගැන ආරංචි මාත්‍රයක්වත් නැත. ථූපවංසයෙහි එන පාඨ විස්තෘතව ලිවීමට ගොස් අපීශුන්‍ය ඖචිත්‍යහීන ව්‍යාකරණ දෝෂයන්ගෙන් ගහණ වර්ණනා ධාතුවංසයේ දක්නට ලැබේ. එහෙයින් ථූපවංස කතු තුමා තරම දක්ෂ නොවූ රෝහණ ජනපදවාසී හිමි නමකට මෙවැනි කෘතියක් රළ වඩා පසු කලෙක ලිවීමට බැරි නැත. තවද "දුට්ඨගාමිණී අපදානය" වන ථූපවංසය ගුරු තනතුරෙහි තබා එරජුගේ පිය රජුන්ගේ වෘත්තාන්තය ලියන්ට ඇතැයි ද නිගමනය කළහැක.

පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පවසන අයුරු (පාලි සාහිත්‍යය පි. 381) සේරුවාවිල චෛත්‍යය ඉදිවුණු අවධියේම ධාතුවංසය කළා නම් මහාථූපය හා මිරිසවැටිය සඳහන් වන්නට ඉඩක් නැත. එවැනි යුගයක ලක්දිව පාලි පොත් ලියා ඇති බවට කිසිදු සාක්ෂ්‍ය නොමැත. බුදුරදුන් ලක්දිවට වැඩි තෙවැනි ගමනේදී සමාපත්තිවලට සමවැදුණු තැන් ප්‍රකාශ කරද්දී මහථූපය හා මිරිසවැටිය ධාතුවංසයේ සඳහන් වෙයි.

"මහාථූපට්ඨානෙ තථෙව සමාපත්තිං සමාපජ්ජි. තතො වුට්ඨාය මරිචවට්ටි චෙතියට්ඨානෙ ගන්ත්වා සමාපත්තිං අප්පයි.

එසේම මහියඞ්ගණථූපකථාව සඳහන් වන තැනදී එය අසුරියන් උස්කොට තැනූ බව කියැවේ. එද දුටුගැමුණු රජුගේ ක්‍රියාවකි. මෙ හැර දන්තධාතුව ලක්දිවට ගෙනර්මේ පුවත ද ධාතුවංසයේ සඳහන් වෙයි.

දන්තධාතුන්වහන්සේ මෙහි වැඩමවූයේ කිත්තිසිරිමෙඝ රජු දවසයි. (299–327.) ඒ දුටුගැමුණු රාජ්‍යකාලයෙන් (ක්‍රි.පු.161–137) අවුරුදු හාරසියයකටත් පසුවයි. අනුරාධපුරයේ මුල් යුගයට නුහුරු දීර්ඝ වෘත්තයෙන් බඳනා ලද ගාථා දෙකක් ද ධාතුවංසයේ පෙනේ.[1] එකක් මාලිනීවෘත්තයෙනි (අතිසය මතිසාරො......) අනික් එක ශ්‍රග්ධරාවෘත්තයෙනි (කප්පා යො බොධිඤාණං.........). සංස්කෘත කාව්‍යලක්ෂණයක් වූ ශබ්දලංකාරය ගැන ද රුචියක් දක්වා ඇත. ඵලිසම්යෙන් යුත් ගාථා කීපයක් ද දක්නට ඇත. මේ අනුව මෙම ගාථා පාලියට සංස්කෘත කාව්‍ය ලක්ෂණ යෙදීමට පටන් ගත් යුගයට පසු කලකට හෝ අයත්යැයි පිළිගත හැකියි. එසේ නැතහොත් ථූපවංසය හා සමකාලීන කෘතියක් ලෙස ද සැක කළ හැකිය. ථූපවංසය දුට්ඨගාමණී අපදනය වශයෙන් සලකා ධාතුවංසය කාක-වණ්ණතිස්ස අපදනය ලෙස ගණන් ගත හොත් මේ තීරණයට අපට බසින්ට හැකිවේ. මහාවංසය පදනම් කර ගෙන ථූපවංසය කළාක් මෙන් ඉහත සඳහන් කළ "රෝහණවංස" කථාවක් හා වෙනත් මූලාශ්‍රයන් පදනම් කරගෙන ධාතු-වංසය ලියා ඒ මගින් කාකවණ්ණතිස්ස චරිතය ප්‍රකාශ කරන්නට රුහුණුවාසී තෙර කෙනකුන් දුරු ප්‍රයත්නයන් ලෙස ධාතුවංසය හැඳින්වීමට බැරිකමක් නැත. භාෂාවත් ශෛලියත් අනුව ථූපවංසය රචිත කාලයට සමකාලීනව සකස් වූ කෘතියක් ලෙස සඳහන් කළ හැකියි.

## කර්තෘ

කාලය ගැන මෙන්ම කර්තෘ ගැනත් ස්ථිරව කීමට ග්‍රන්ථගත සාක්ෂියක් හෝ බාහිර සාක්ෂියක් නැත. රචනා ස්වරූපය හා අන්තර්ගත කරුණු සලකා බලා යමක් සාකච්ඡා කළ හැකිය. අනුරාධපුර යුගයේ පශ්චාද්භාගය වන විට පාලි භාෂාව සෑහෙන ප්‍රමාණයකින් දියුණු වී තිබිණි. ඒ දියුණු පාලි භාෂා ස්වරූපය ධාතුවංසයේ නැත. පාලි භාෂාව ලංකාවේ එතරම් නොදියුණු මුල් යුගයට ධාතුවංසය අයත් කිරීමට ද ග්‍රන්ථාභ්‍යන්තරයෙන් ලැබෙන කරුණු ඉඩ නොදෙයි. ථූපවංසය කළ යුගයේ භාෂාව ද අව්‍යක්ත නොවන බව ඒ ඇසුරෙන්ම පෙනේ. නමුත් අපි ධාතුවංසය ථූපවංසයට සමකාලීන විය හැකි-යයි අදහස් කළෙමු. එසේ නම් ථූපවංසයේ ඇති ව්‍යක්තභාවය එහි නැති වන්නට හේතුව කුමක් ද? මේ ප්‍රශ්නය ගැන සිතන විට ථූපවංසයේ කර්තෘ ගැන අනුමාන අදහසක් අපට මෙසේ සාකච්ඡා කළ හැකිය.

අනුරාධපුරය ලක්දිව භික්ෂුශාසනයේ කේන්ද්‍රස්ථානයව පැවතුණු බව අපි දනිමු. රුහුණේ විහාරස්ථාන කෙතරම් තිබුණත් භික්ෂූන් කෙතරම් සිටියත් අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ අනුරාධපුරය යනු අනුමානයක් නැත. රුහුණට විහිදුණු භික්ෂුපරම්පරාව ඒ ප්‍රදේශයේ වැසියාට ධර්මදේශනා කරමින් ශාසනික ප්‍රතිපදවෙහි ව්‍යාවෘත වන්නට ඇතුවාට සැක නැත. මූලස්ථානය තිබෙන නිසා ග්‍රන්ථධුරය ගැන එහි වැඩි සැලකිල්ලක් නොදක්වූවා විය හැකියි.

1. ආචාර්ය සී. ඊ. ගොඩකුඹුර මහතා මෙවැනි ගාථා පසුව පොතට ඇතුළත් කිරීමට ඉඩ ඇතැයි පුද්ගලික නිවේදනයක සඳහන් කරයි.

ව්‍යවෝද්ගතකළ ධර්මයන් ආරක්ෂා කර ගනිමින් භික්ෂු පරමාර්ථ ඉෂ්ටකර ගැනීමට ව්‍යාවෘත වූ භික්ෂු පරම්පරාවක් රැඳි ප්‍රදේශයක් ලෙස රුහුණ හැඳින්වුවොත් එය සත්‍යයට එතරම් ඇත් නොවේයයි සිතමි. අට්ඨකථාවල නිතරම පාහේ සඳහන් වන චිත්තලපබ්බතය භික්ෂූන්ගෙන් පිරි ඉතිරී ගිය එකකි. එහෙත් එය ශාස්ත්‍ර මධ්‍යස්ථානයකට වඩා ආරණ්‍යසේනාසනයක ස්වරූපයෙන් අපට හැඳින්වෙයි. මේ පිළිබඳ ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහත්මා එකතු කර ඇති කරුණු විමසා බැලීමෙන් මෙය තහවුරු වේ.[1] ඒ මහත්මාගේ ග්‍රන්ථයේ හඳුන්වා ඇති රුහුණ ආශ්‍රිත අනිකුත් විහාරස්ථාන ද වැඩි වශයෙන් සඳහන් වන්නේ භාවනානුයොගී භික්ෂූන් සිටි තැන් ලෙසය. නැතිනම් ධර්මදේශක භික්ෂූන් සිටි තැන් ලෙසිනි. ව්‍යවෝද්ගත කළ ධර්මයන් පිරිවසමින් සාමාන්‍ය ජනයාට ධර්මදේශනා කරමින් විසූ භික්ෂු සමාජයක් ගැන වැඩි තොරතුරු රුහුණෙන් ලැබෙයි. ධර්මය දේශනා කිරීමෙහි ලා උපයෝගී කර ගන්නට ඇත්තේ වඩා ගැඹුරු නොවන සාමාන්‍ය උපදේශාත්මක උදාහරණ කථා බව සිහලවත්ථු, සහස්සවත්ථු, රසවාහිනී වැනි කෘතීන්ගෙන් පැහැදිලි වෙයි. මේ ග්‍රන්ථවල සඳහන් කථාවස්තුවල ජනකාන්ත ධර්මදේශනා විලාසය පැහැදිලි වෙයි. ඒවා වැඩියක් රුහුණ වටා ගෙතුණු කථායි. මේ ධර්මකථා සාහිත්‍යය රුහුණේ භික්ෂූන්ගේ උරුමයක් වන්නට ඇතුවාට සැක නැත. රජවරු නම පින් කළ ඇත්තෝය. ඔවුන්ගේ ප්‍රවෘත්ති ඇසීම ජනයාට සතුටකි. ඔවුන් සැප ලැබුයේ පෙර කළ පින් බලයෙන් යැයි ද ඒ පින් නම් අසවල් ඒවා යැයි කියාපෑම ද එසේම ඒ රජුන්ට යම් දුර්විපාකයක් වී නම් එය පෙර අකුසලයකිනියි කියාපෑම ද ධර්මදේශකයන්ගේ සිරිතක් විය. උතුමන්ට වන විපත පෙර කළ සුළු කර්ම විපාකයකැයි කීම කර්මඵල විශ්වාස කිරීමට ජනයා යොමු කරවන්නකි. බුදු සිරිතට පවා මෙවැනි කථා ඇතුල් කොට ඇති බව අපි දනිමු. මේ ආකල්පය යටතේ අනුරපුර රජුන්ට වඩා රුහුණට සම්බන්ධ වූ රජවරුන්ගේ පූර්වචරිත විග්‍රහ වී ඇත. කාකවණ්ණතිස්ස රජුගේ චරක වෘත්තාන්තය, දුටුගැමුණු රජුගේ පූර්වචරිතය, සාලිය–අශෝකමාලා වෘත්තාන්ත දශමහායෝධ කථා මෙහි ලා සිහි කරනු වටී. රජවරුන්ගේ ශාසනික ක්‍රියා ලියා තැබීමේ පිළිවෙත ද රුහුණෙන් අනුරපුරට ගිය රජකු පිළිබඳව ම එයි. ඒ දුටුගැමුණු රජුගේ ''පින්පොත'' යි. කථා මාර්ගයෙන් මෙන් ම රජවරුන්ගේ පුණ්‍ය ක්‍රියා විස්තර කර දීමෙන් ද මහාජනයා සුමගට හැරවිය හැකියි. ඒ කථා ''අරියජනපසාදනත්ථාය'' යයි දැක්වීමට ධර්මදේශකයෝ කිසිසේත් මැලි නොවූහ. ඉදිවුණු සිද්ධස්ථානයන් පිළිබඳ ආශ්චර්යවත් සිද්ධීන් කියාලීම ජනයාගේ ආගමික භක්තිය වැඩි කිරීමට තවත් වැදගත් මාර්ගයක් විය. රුහුණු බදව ඉදිවුණු සේරුවාවිල චෛත්‍යය පිළිබඳ වර්ණනාව ද ඒ අනුව නිබන්ධිතයයි සිතීම අපහසු නොවේ. රුහුණේ හිමි නමක් අතින් එම නිබන්ධය කෙරෙන්නට ඇත.

1. ඊ. ඩබ්ලිව්. අදිකාරම් – පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, 267 පිට, ජී. කේ. ජී. ජයවර්ධන සහ සමාගම, කොළඹ 1963.

රුහුණේ වෘත්තාන්ත ගැන වැඩි හැඟීමක් ලැබීමට උපකාරී වන තැනක් හමු විය. එය වඩා ප්‍රකට නැති නිසා මෙහි ලා සඳහන් කිරීමට අදහස් කරමි. දුටුගැමුණු රජුගේ පූර්වචරිතය ගැනත් කාකවණ්ණතිස්ස රජුගේ කාකරුතය හැඳිනීම ගැනත් විසිතුරු කථා දෙකක් ''රුහුණු මාගම්පුර වර්ණනා'' නම් කෘතියේ සඳහන් වේ.[1] ඒ කෘතිය නොයෙක් මූලාශ්‍රයන් උපයෝගී කොට ගෙනම සකස්කොට ඇති බව පෙනෙන නිසා මෙ කථාවද ගන්නට ඇත්තෙ යම් මූලාශ්‍රයකින් බව පෙනේ. එවැනි මූලාශ්‍රයන් අද දක්වා සොයා ගෙන ඇති බවට සාධක නැත. ඒ ප්‍රවෘත්තිය මූලාශ්‍රය ග්‍රන්ථයක් පදනම් කර ගෙන ද නැතිනම් ජනප්‍රවාදයක්දැයි ස්ථිරව කිව නොහැක. ඒ කථාව සැකෙවින් මෙසේයි:—

''දෙමාපියන්ගේ අභාවයෙන් ඉතා දුක්ඛිතවූ තරුණයෙක් පදලත්ථලියේ (පදලඩගල?) සිටි මාමා කෙනෙකු වෙත යන අතර වලවේ ගඟ අසබඩදී මුවදෙනකට විදින්නට උත්සාහ කළේය. මුවදෙන බියෙන් දුවන්නි ගඟට පැන උඩුගං බලා පිහිනුවාය. ගැබ් බරින් සිටි මුව දෙන පිහිනද්දීම පැටවකු ප්‍රසූත කළාය. ප්‍රසූත වූ පැටියා ආපසු ගසාගෙන යනු දුටු මුවදෙන තමා මරන්නට එසවූ ඊදුනුත් නොතකා පැටියා පසුපස යටිගං බලා පිහිනුවාය. මෙ දුටු තරුණයා අතිශයින් සංවෙගයට පැමිණ තිස්සමහා විහාරයට ගොස් පැවිදි වූයේය. ඔහු රෝගී වූ විටයි විහාරදේවිය කුස පිළිසිඳ ගන්නට ආරාධනා කළේ.''

මෙවැනිම කථාවක් කාකවණ්ණතිස්ය රජුගේ කාකරුතය හැඳිනීම පිළිබඳව ද එයි. මේ හා සමාන කථාවක් ජිනකාලමාලියෙහි තිබේ. එහි එන පුවතින් විස්තර වන්නේ හරිපුඤ්ජය නගරයේ විසූ ආදිච්ච නම් රජුගේ හිසට කපුටකු පැහැරීමක් පිළිබඳවයි.[2] කාකවණ්ණතිස්ස රජුගේ පූර්වචරිතය සහස්සවත්ථු, රසවාහිනී ග්‍රන්ථවල දක්නට ලැබෙනත් රුහුණු මාගම්පුර වර්ණනාවෙ තිබෙන ප්‍රවෘත්තිය දක්නට නැත. ඒ කථාව ද සැකෙවින් මෙසේයි:—

''ගෝඨාභය රජතුමා රුහුණේ දසබෑ රජුන් මරා තම බලපුළුවන්කාරකම ගැන ඇමතියන් සමඟ කථාකරමින් සිටී. මේ අතර කපුටෙක් රජුගේ හිසට පැහැරීය. එයින් කිපුණු රජ තම රාජ්‍යයේ සියලු කපුටන් මැරීමට නියෝග කළේය. මේ නියෝගයේ නුසුදුසුකම පෙන්වා දුන් ඇමතියෝ වරදකළ කපුටා පමණක් සොයා මරණ ලෙස උපදෙස් දුන්හ. ඒ උපදෙස් අනුව කපුටා හඳුනා ගැනීමට සිය පුත් තිස්ස කුමරා යෙදවීය. ඔහු කපුටන් හා විශ්වාස බවට පැමිණ කපුටු බස ද උගත්තේය. දිනක් ආහාර බුදිමින් සිටි කපුටෙක් කපුටියකට බාධාවක් කරයි. කෝපයට පත් කපුටි රජුගේ හිසට පැහැරීම තරම් නොහොබිනා වැඩක් කළ නුඹගේ

1. ඩී. ඊ. වික්‍රමසූරිය – රුහුණු මාගම්පුර වර්ණනාව, 11,17 පිටු. ශ්‍රී ලොකොපකාර යන්ත්‍රාලය අනුරාධපුර 1912.
2. N. A. Jayawickrama—*The Epochs of the Conqueror*, pp. 106-109, PTS, London 1968.

මේ කාරිය පුදුමවන්නට දෙයක් නැතැයි කියමින් දෙස් නැගීය. මෙ අවස්ථාවෙහි පියා ගිසට පැහැරූ කපුටා හඳුනා ගත් කුමරා උඹ අල්ලා පියාට ඉදිරිපත් කරයි. මෙසේ මේ කුමරු කපුටු බස් දන්නා නිසා එද සිට කාකවණ්ණතිස්ස විය.''[1]

එසේම සාලිය කුමරාගේ ද අශෝකමාලාගේ ද අතීත කථාව සීහළ-වත්ථුප්පකරණයේත් රසවාහිනියේත් දක්වේ. සහස්සවත්ථුවෙහි සාලියරාජ-කුමාර වත්ථුව මහාවංසයෙන් බලාගන්නට කියයි. (සාලිරාජකුමාරවත්ථු මහාවංසෙ වුත්තනයෙනෙව වෙදිතබ්බො). එසේ කීව ද ඒ කථාව වර්තමාන මහාවංසයේ ඇත්තේ ගාථා තුනකින් පමණි. එහෙයින් ඇතැම් විට මෙ කියන්නේ සීහලට්ඨකථා මහාවංසය විය හැකියි. මේ ප්‍රවෘත්ති ද රුහුණට සම්බන්ධය. මේ කරුණු සලකා බැලීමේදී රුහුණට ආවේණික වූ වෘත්තාන්ත සාහිත්‍යයක් තිබූ බවට අනුමාන කළ හැකියි. රුහුණේ රජවරුන් රුහුණුබදව කළ විහාරයන්ගේ නාමලේඛනයක් ධාතුවංසයේ සඳහන් වේ. නලාට ධාතුන් වහන්සේ නිදන් කළ සේරුවාවිල මඞ්ගල මහා චෛත්‍යය රුහුණේ ආගමික තත්ත්වය තහවුරු කරන එකක් විය. ඒ නිසා රුහුණු රටවාසී තෙර කෙනකුන් විසින් මෙය රචනා කරන්නට ඇතැයි ද අනුමාන කළ හැකිය. වැදගත් සාහිත්‍ය සේවාවක් කළ තෙරුන් පිරිසක් රුහුණේ සිටි බව පෙනේ. ඒ පරම්පරාව රුහුණටම විශේෂ වීයැයි සිතන්නට ඉඩ තිබේ. එහි පැවති නමුත් දැනට නටබුන්වී ඇති වෙහෙර විහාර පිළිබඳ විමර්ශනයක් කළ හොත් පැතිරී ගිය ආගමික ප්‍රබෝධය සහ දියුණුව පැහැදිලි වෙයි. රුහුණේ පුරාවස්තු ගැන විමර්ශනයක් කරන ගුණපාල සේනාධිර මහතා පවසන වචනයක් මෙහිදී සඳහන් කරමි. ''රුහුණේ ඉසුරුමත් අතීතය අද බිහුසුණු වන සතුන් ගහණ මහවනයෙන් වැසී පවතී...... කොටින් කියතොත් විහාරයක් බවට නොපමුණු-වන ලද එකද පර්වතයක් රුහුණෙන් සොයා ගත හැකි නොවේ.''[3] යම් යම් කරුණු පිළිබඳව නිදර්ශන කතා ගෙනහැර පෑමේදී රුහුණුබදව සිටි තෙරුන් පිළිබඳ පුවත් අට්ඨකථාවල සඳහන් වේ. එම කථා වැඩි ප්‍රමාණයක් සීහළවත්ථු, සහස්සවත්ථු, රසවාහිනී යන කෘතිවල සවිස්තරව දක්වේ. මේ කරුණු අනුව ධර්ම අධ්‍යයනය අතින් සැලකිය යුතු ප්‍රමාණයක දියුණුවක් තිබුණු බව කිව හැකියි. ආගමික ප්‍රබෝධයෙහි තත්ත්වය පෙනෙන තවත් වැදගත් කරුණක් නම් රාජකීය සම්බන්ධය ඇතිව සිටි අය ද පැවිදි ජීවිතයට ඇතුළත්ව සිටීමයි. ධාතු-වංසයේ සඳහන් වන චූලපිණ්ඩපාතියතිස්ස තෙරුන් වහන්සේ එයින් ප්‍රධාන තැනක් ගන්නා තෙර නමකි. උන්වහන්සේ විහාරමහාදේවියගේ සොහොයුරෙකු බව (විහාරදෙවියා භාතා චූලපිණ්ඩපාතියතිස්සථෙරො නාම) ධාතුවංසයේ කිය-වෙයි. සේරුවාවිල චෛත්‍යකර්මාන්තයට කාකවණ්ණතිස්ස රජු මෙහෙයවූවෝ මේ හිමිපාණෝය. මුන්වහන්සේ සමග සේරුවාවිලට ගොස් චෛත්‍යකර්මාන්තය

1. රුහුණු මාගම්පුර වර්ණනාව 11 පිට.
2. මහාවංස 33 පරි, 1-3 ගාථා.
3. ගුණපාල සේනාධීර – රුහුණේ අප්‍රකට පුරාවස්තු 23 පිට. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම කොළඹ 1964.

කොට නිමවා විහාරයක් කොට පූජා කළ බව සඳහන් වෙයි. උන්වහන්සේ මෙ කාර්යයෙහි ලා දක්වූ උනන්දුව පැහැදිලි වන්නේ රජුගේ මෙන්ම මේ හිමියන්ගේ රූපයක් ධාතුගර්භයේ තැන්පත් කළ බව ධාතුවංසයේ සඳහන් වීමෙනි. උන්වහන්සේ එම විහාරයේදීම පිරිනිවන් පෑ බව ප්‍රකාශ වෙයි. රසවත් වූත් ආදර්ශවත් වූත් කථා පුවතක් වන රසවාහිනී නකුලවත්ථුවෙ සඳහන් තිස්සමහාවිහාරවාසි චූල්ලපිණ්ඩපාතියතිස්ස තෙරුන්වහන්සේත් මුන්වහන්සේමදැයි සැක සිතෙයි. එහි සිටි චූලපිණ්ඩපාතියතිස්ස තෙරුන්වහන්සේ කාකවණ්ණතිස්ස රජුට පෙර පිරිනිවන් පෑහ. එකම කාලයේ එකම තැන එකම නමින් දෙනමක් සිටියෝදැයි කිව නොහැකිය. කෙසේ වුවත් මුන්වහන්සේ ජනාදරයට ලක්වූ තෙරුන් වහන්සේ නමකි. කාවන්තිස්ස රජු සමග සේරු නුවර බලාගිය භික්ෂු පිරිසේ ප්‍රධානත්වය හිමි වූයේ මුන්වහන්සේට නිසා මහජනතාවගේ සහයෝගය රජුට වඩාත් ලැබුණා විය හැකිය. සුමඞ්ගලවිලාසිනියේ මහානිදානසුත්‍රඅටුවාවේදී ගිරි විහාරවාසී පිණ්ඩපාතිය තෙර නමක් පිළිබඳ සටහන් වෙයි.[1] වැදගත් ප්‍රශ්න විසඳීමෙහි ලා ඒ හිමියන් සහභාගි වූ බව එයින් පෙනේ. ගිරි විහාරවාපි චූල්ලපිණ්ඩපාතියතිස්ස නම් තෙරුන් වහන්සේ නමක් දමිළ දෙවාරිකයෙකුට පිහිටවීම සඳහා වැඩි පුවත මනොරථපූරණී අඞ්ගුත්තර අටුවාවෙ පෙනේ.[2] මිලක්ඛතිස්සට උපස්තම්භක වූයේ ද චූලපිණ්ඩපාතියතිස්ස තෙර නමකි.[3] පපඤ්චසූදනී මජ්ඣිමනිකාය අට්ඨකථාවේ රථවිනීතසූත්‍ර වර්ණනාවෙ ගිරි විහාරවාසී චූල්ලපිණ්ඩපාතියතිස්ස නම් තෙරනමක් ගැන සඳහන් වෙයි[4]. විසුද්ධිමග්ග කම්මට්ඨානග්ගහනනිද්දෙසයේ චූල්ලපිණ්ඩපාතිකතිස්ස තෙරුන්ගේ අන්තේවාසිකයකු ගැන සඳහන් වෙයි.[5] ජනාදරයට පාත්‍රවූ මෙ හිමිපාණන්වහන්සේ සේරුවාවිල චෛත්‍යාසන්න විහාරයෙන් පූජා ලැබූ හිමියන්ම විය හැකිය.

**මූලාශ්‍රය**

නලාටධාතුවංසය සිංහල ධාතුවංශයක අනුවාදයක්යයි අනුමාන කළාක් මෙන් ඒ මූලික සිංහල පිටපතට ද වෙනත් කෘතියක් මූලාශ්‍ර වන්නට ඇත. මහාවංසය පවා රචනා වී ඇත්තේ එබඳු මූලාශ්‍රයන් පදනම්කර ගෙනය.

> පොරාණෙහි කතො පොසො අතිවිත්ථාරතො කවචි
> අතිව කවචි සංඛිත්තො අනෙකපුනරුත්තකො
>
> වජ්ජිතං තෙහි දෙසෙහි සුඛග්ගහණධාරනං
> පසාදසංවෙගකරං සුතිතො ච උපාගතං

යන මහාවංස ගාථාවලින් එය පැහැදිලි වේ. සීහළට්ඨකථා මෙන්ම මහාවංස ටීකාකරු සඳහන් කරන සීමාකථා, චෙතියවංසට්ඨකථා, මහාචෙතියවංසට්ඨකථා ඉහත දක්වූ පරිදි රොහණ වංසකථාව ද රුහුණේ ග්‍රන්ථ සම්පාදනයේ දී ද

---

1. *Sumangalavilasini*, II, p. 514, PTS, London 1931.
2. *Manorathapurani*, II, p. 215, PTS, 1930.
3. *Manorathapurani*, I, p. 35, PTS, 1924.
4. *Papancasudani*, II, p. 145.
5. *Visuddhimaga*, I, p. 116, PTS, 1920.

උපයෝගී වන්නට ඇත. සමහර විට රුහුණේ වැඩුණු චෛත්‍යවංසට්ඨකථාවක් තිබෙන්නට ඇත. මේ අදහසට ගැලපෙන අදහසක් ඉදිරිපත් කරන සිරිමා වික්‍රමසිංහ මහත්මිය මෙසේ පවසයි:

> "ධාතුවංසය ලංකාවේ තිබුණු බුදුන්ගේ ධාතූන් පිළිබඳ ඉතිහාසය දැක්වීමට දැරූ ප්‍රයත්නයකි. එහෙත් ග්‍රන්ථය අවසානයේදී රුහුණේ චෛත්‍යවල නිදන් කරන ලද ධාතූන් වඩාත් සවිස්තරව දැක්වීමට උත්සාහ ගෙන තිබෙන බව පෙනේ. මුල් පරිච්ඡේද වංශ සාහිත්‍යයේ එන පිළිවෙළ අනුගමනය කර ඇතත් එහි අවසාන භාගයෙහි අන්‍ය මූලාශ්‍රයන්හි සඳහන් නොවන ජනප්‍රවාද රාශියක් අන්තර්ගත වෙයි. මේවායින් බොහොමයකම රුහුණ වටා ගෙතුණ ඒවායි. ධාතුවංසය ක්‍රි.පූ. දෙවන සියවසේ රජ කළ කාකවණ්ණතිස්ස රජුගේ රාජ්‍ය සමයෙන් අවසාන වේ. ධාතුවංසය දක්ෂිණ ලංකාවේදී රචිත වූවකැයි නිසැකවම කිව හැකිය. ලංකාවේ දකුණු දෙස ප්‍රචලිත වූ ප්‍රවෘත්ති හා එම ප්‍රදේශයේ තිබුණායයි සැලකිය හැකි දක්ෂිණ වංශකථාවක් ධාතුවංසයට මූලාශ්‍ර වීයැයි සිතිය හැකිය. මෙම කෘතිය රුහුණේ සේරුවිල විහාරය ආශ්‍රිතව රචිත බැව් හැඟේ. පැරණි ලංකාවේ ප්‍රාදේශීය වංශකථා තිබුණු බවක් ඇඟවීම ධාතුවංශයෙන් හෙළිවන වැදගත් කරුණකි."[1]

මේ කරුණු සලකා බලන විට අනුරාධපුර සාහිත්‍යයට වඩා වෙනස්කම කියහැකි, ධාතුවංස වැනි කෘතිවලට මූලාශ්‍රය වූ සාහිත්‍යයක්, රුහුණේ තිබූ බව පෙනේ.

**භාෂා තත්ත්වය**

පාලියට ආවේණික වූ සරල භාෂා විලාසයක් අනුගමනය කොට නලාට ධාතුවංසය රචනා වී ඇත. පාලි කාව්‍ය සාහිත්‍ය කෙරෙහි සංස්කෘත අලංකාර රීතිය බලපෑමට පෙර අවධියක මෙය ලියවී ඇත. ධාතුවංසය කථාවෙන් මිස භාෂාවෙන් ආටෝප කරන්නට නොගිය බව පැහැදිලි වෙයි. කලාතුරකින් ශබ්දමාධුර්යය ඇති කිරීමේ පරමාර්ථයෙන් සමාන පද එක ළඟ යෙදීමේ රුචියක් දක්වයි. ඒවායේ වුවද ආයාසයෙන් ගත යුතු තරම් සැඟවුණු අර්ථ නැත. දීර්ඝ වෘත්ත යෙදූ පද්‍ය කීපයේදී නම් අර්ත්ථය එතරම් පැහැදිලි නැත. එයින් පැහැදිලි වන්නේ අලංකාරවත් භාෂාවක යෙදීමට කතෘට අවශ්‍යතාව තිබුණත් එහි ලා ශක්තියක් නැති බවයි. සරල පද්‍ය කීපයකදී යෙදූ ශබ්දලංකාර සෑහෙන ප්‍රමාණයකින් සාර්ථක වී ඇත.

> සත්‍ථු පුඤ්ඤානුභාවෙන රක්ඛා පුඤ්ඤබලෙනච
> චින්තිතචින්තිතං සබ්බං ඛණෙනෙව සමිජ්ඣති
>
> මහාපඤ්ඤා මහාසද්ධා මහාවීරො මහාඉසි
> මහාබලෙන සම්පන්නා මහානාගුණභූසිතො

---

1. අමරදස ලියනගමගේ/රණවීර ගුණවර්ධන- අනුරාධපුර යුගය; "ඓතිහාසික මූලාශ්‍ර" 17 පිට. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, කැළණිය 1961.

උරුවෙලං තතො ගන්ත්වා උරුවෙලෙන සංපය
උරුවෙලඅනුප්පත්තො උරුවෙලනාගං දමි

දීර්ඝවෘත්ත රීතියේදී රචනාව සාර්ථක නොවන බව දෙවන පරිච්ඡේදයේ අවසාන ගාථාවෙන් පැහැදිලි වේ. එහි ඇති අර්ත්ථ ව්‍යාකූලතාව කර්තෘ අතින් සිදු වූවක් ද කාලයක් තිස්සේ පිටපත් කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක්දැයි කීම දුෂ්කරය. ගද්‍යයෙහිදී වුවත් ඔජොගුණික භාෂා විලාසයක් පෙනෙන්නට නැත. වාක්‍ය සරල වුවත් ව්‍යක්ත බවින් තොරය. සිංහල භාෂා රීතිය පාලි රීතියක් කරන්නට උත්සාහ ගන්නා බව පෙනේ.

ඉමස්ස ඨානස්ස ආරක්ඛං කරොහීති

රාජා එත්තකං සතකහාපණං දත්වා චතූසු දිසාසු ආරක්ඛං දාපෙත්වා

තං සුත්වා රාජා පිතිපාමුජ්ජො චක්කවත්තිස්ස සිරිසම්පන්නො දළිද්දො විය

ජනපදවාසී මනුස්සාපි ථෙරස්ස සන්තිකෙ සීලානි ගණ්හන්ති

රඤ්ඤො සකලසරීරං පංචවණ්ණපීතියා පරිපුණ්ණං අහොසි

තාත තිස්ස, අම්හෙහි පරිහරිතනලාටධාතුයා පූජෙහීති ධාතුවංසං කථෙත්වා පුත්තං අනුසාසෙත්වා කාලං කත්වා සග්ගපුරං පූරයමානො ගතො

අභයකුමාරො ගිරිනගරම්හි නිසීදාපෙසි

සොමාදෙවී රඤ්ඤා සද්ධිං කථෙසි

තතො සාලිකනාම මධුකරුක්ඛයිතපාසාණථූපස්ස ගතො

තතො. . . . . .කණිකාරසෙලස්ස ගතො

ලොණසාගරස්ස අනොත රජතසෙලස්ස ගතො

සිංහල භාෂාවේ ගමනාර්ත්ථය හැඟවීම සඳහා යොදන ලද ''ට'' ප්‍රත්‍යය සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යයක් වශයෙන් සලකා මෙතැන චතුර්ථියෙන් යොදනු-යේ පාලි රීතිය ගැන එතරම් සැලකීමක් නොකොට බව පෙනේ. විටෙක පාලි සිංහල රීති දෙකටම අනුව යොදනු පෙනේ. පූරණාර්ත්ථ ෂෂ්ඨිය යෙදිය යුතු තැන, සිංහල රීතිය අනුව ''යූසං පත්තෙ පූරෙත්වා'' යනාදි වශයෙන් යොද පාලි රීතිය අනුව ''චන්දනදෙණියා සතපාකතෙලස්ස පූරාපෙත්වා'' යනුවෙන්'' යොදනු ද පෙනේ. ගමනාර්ථය හඟවන තැන ව්‍යාකරණානුකූලව ''අස්සබන්ධනං නාම ඨානං ගතො'' ''සබරං නාම

පාසාණං ගතො'' යනාදි වශයෙන් යොදනු ද පෙනේ. එකම තැන දෙව්ධියකට ගමනාර්ත්ථය ප්‍රකාශ කළ ආකාරය සීමාබන්ධනයේදි පෙනේ. මේ දීර්ඝ කාලයක් තිස්සේ පිටපත් කිරීමෙන් වූ වැරදියයි කීම අපහසුය. ''අලංකතම්මහාජනා .........අට්ඨාසි'' ''රාජානො......ගතකාලෙ'' යනාදි තැන් වල ව්‍යාකරණය ගැන දක්වූ නොසැලකිල්ල පෙනේ. භාෂාව යෙදීමේදි තිබිය යුතු සංයමය ගැන එතරම් සැලකිල්ලක් නොදක්වූ තැන්ද පෙනේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑසේක යන අදහස කීවේ ''ඨපෙත්වා යො මච්චුමුඛං උපෙතො'' යනුවෙනි. බුදුහු මාරවිෂය ඉක්මවූහ. මරණයට පත්වූ බව කියනු විනා ඊට වඩා දුරක් කතෘ නොසිතූ බව පෙනේ. පසේබුදුන් පිරිනිවන් පෑ බව කීවේද ''ගතො විනාසං පවරො යසස්සී'' යනුවෙනි. මෙ කාව්‍යොචිත යෙදුමක් නොවේ. මෙතෙක් කළ විග්‍රහයන්ට අනුව භාෂාව එතරමම ව්‍යක්ත නොවන බව කිව හැකිය. පාලිය රුහුණු දේශයෙහි සාහිත්‍යයික භාෂාව වී ගෙන ආ මුල් අවධියේ දී රචිත බවක් ද එයින් හැඟේ. එසේ නැතිනම් තීරණය කළ යුතු වන්නේ පාලිභාෂා අධ්‍යයනය රුහුණුකරයේ එතරම් දියුණු නොවූ බවයි. සිංහල නම් ගම් පාලියට නඟන්නට උත්සාහ කිරීම නිසා බොහෝ තැන් අව්‍යක්ත වී ඇති බව පෙනේ. ග්‍රන්ථසංස්කරණයේදි ව්‍යාකරණ වශයෙන් වැරදි තැන් හමු වුවත් භාෂා තත්ත්වය දැනගැනීම ආදියට ඉඩ තබා ඇති බව මෙහි ලා සැලකිය යුතුය. සීහළවත්ථුප්පකරණ, සහස්සවත්ථුප්පකරණ, රසවාහිනි යන කෘතිවල තිබෙන භාෂාවෙ අව්‍යක්ත බව පාලි ධාතුවංසයේත් බොහෝ දුර දක්නට ඇත.[1]

**ධාතුවංශයේ ඓතිහාසික වැදගත්කම**

ජාතික ඉතිහාසය කියන දීපවංස, මහාවංස ආදී කෘතිවලින් මගහැරී ගිය ඓතිහාසික කරුණු සැහෙන ප්‍රමාණයක් ඇති බව පැහැදිලි කරුණකි. ඒ තොරතුරු වංසත්ථප්පකාසිනි, ධාතුවංස, රාජාවලි, රාජරත්නාකර, පූජාවලි වැනි ග්‍රන්ථවලින් එළිවෙයි. ඒවායේ ඇති ඇතැම් තොරතුරු කටකථා නොව සත්‍ය ඒවා බව මහා වනපියෙස්වලට අසුවී තිබුණු, දැනට සොයාගෙන තිබෙන ශිලාලිපිවලින්[2] සනාථ වේ. මගහැරී ගිය තොරතුරු අතුරින් රුහුණ පිළිබඳ තොරතුරු විශේෂ වේ. ලඬකාරාජධානිය රුහුණෙන් ඈත්වීමත් සමග එහි වැදගත්කම ටිකෙන් ටික අඩුවන්නට ඇත. අප මුලදී සඳහන් කළ පරිදි සශ්‍රික වූ රුහුණේ ඉතිහාස ප්‍රවෘත්තිය සකස්කර ගැනීමට ක්‍රමවත් ප්‍රවෘත්ති මාලාවක් තවත් ලැබී නැත. එහෙත් එහි ලා නලාටධාතුවංසයෙන් ලැබෙන පිටුබලය වෙනත් කිසිම කෘතියකින් තවමත් නොලැබෙන බව සඳහන් කළ හැකිය. රුහුණු ඉතිහාසය සොයන්නෙකුට ධාතුවංසය අගය කළ නොහැකි මූලාශ්‍රයකි. මහාවංසය රුහුණ ගැන සඳහන් කරන්නේ රුහුණේ ස්ථාවර රාජ්‍ය බලයක් තිබුණි යන්න විස්තර කිරීමට නොව රුහුණ යනු රජරටේ රාජ්‍යය දුර්වල වූ විට

1. ආචාර්ය සී. ඊ. ගොඩකුඹුර මහතාගේ පුද්ගලික නිවේදනයක් අනුව මේ ලක්ෂණ ''රොහණ පාලියට'' අයත් ඒවාය. එහෙයින් අව්‍යක්තයයි කිව නොහැක.
2. කුසලාන්කන්ද, බෝවත්තේගල, කතරගම, ලාහුගල, කරඳහෙල, කොටාදැමූහෙල: ලිපි.

පලා ගොස් සිටිය හැකි ස්ථානයක් ලෙසත් නැවත රජරට ජයගැනීමට සූදනම් විය හැකි ආරක්ෂක ප්‍රදේශයක් ලෙසත් පමණි. අනුරාධපුරය රාජ්‍ය මධ්‍යස්ථානය වීමත් සමග කලින් කල රජකුමරුවන් ආරක්ෂාව සොයා එහි පලා අවුත් පදිංචිවීම, කාලය ඵලඹවිට පිටවීම නිසාම රුහුණේ දියුණුව කඩාකප්පල් වීයයි සිතිය හැකියි. රාජාවලිය රුහුණ ගැන සඳහන් කරන්නේ, "මේ රාජාවලියේ කැලණියත් රුහුණමාගමත් නොනැසී සිරිලකට රජබිජුව තිබුණැයි දනගත යුතුයි"[1] යනාදි වශයෙනි. සිංහල රාජ්‍යයට පදනමක් ලෙස රුහුණ තිබූ බව එයින් අදහස් කෙරේ. අදත් මහ වනපියෙස්වලින් ගැවසී ඇති කොටසත් දනට අනාවරණය වී ඇති කොටස ගැනත් සලකා බලන විට ජාතික සංස්කෘතිය කියාපාන වෙහෙර විහාර ද වැව අමුණු ද රුහුණෙත් අඩු නැතිව තිබේ. අනුරාධපුරයේ මෙන්ම එකට අත්වැල් බැඳ ගත් ආගමික සංස්කෘතික දියුණුවක් රුහුණුබදව පැවති බව එයින් පැහැදිලි වෙයි. කාලයාගේ ඇවෑමෙන් රුහුණුබද ඓතිහාසික ප්‍රවෘත්තිද අනුරාධපුර ප්‍රවෘත්තීන් සමග මිශ්‍ර වන්නට ඇත. ධාතුවංස වැනි කෘතිවලට මූලාශ්‍රය වූ රුහුණු ඉතිහාසය කියා පාන වංශකථාවක් රුහුණට තිබෙන්නට ඇතැයි අපි මුලදී සඳහන් කළෙමු.

මහාවංසයේ රුහුණු ඉතිහාසය පිළිබඳ සෑහෙන ඉතිහාස ප්‍රවෘත්තියක් නැතිවීම ගැන දෙස් කියයුතු නැත. මහාවංසය ලියන අවධිය වනවිට එහි තිබූ ස්වාධීන රාජ්‍ය ස්වරූපය අනුරාධපුර රාජ්‍යයට කිඳාබැස තිබුණි. රුහුණේ ප්‍රදේශ රාජ්‍යයක් තිබුණත් අනුරාධපුර රාජ්‍යය තරම් ප්‍රබල නොවූ නිසාත් විශේෂයෙන් රුහුණේ ප්‍රදේශ රාජ්‍යයන් එක් කොට බලය පිහිටවූ මාගම රජවරු අනුරපුර බලයට පත්වීම නිසාත් රුහුණේ දියුණුව සාමාන්‍ය ප්‍රමාණයකින් ඇණ හිටින්නට ඇත. ගැමුණු රජුගෙන් පසු රුහුණ හා සම්බන්ධය කොතෙක් තිබුණත් රුහුණේ ස්ථිර රාජ්‍ය තත්වයක් හෝ ආගමික තත්ත්වයක් රැඳුණයි කිව නොහැක. විශේෂයෙන් දුටුගැමුණු රජුගෙන් පසු රුහුණ අනුරාධපුර රජවරුන්ට ඒ ඒ කාලවලදී නවාතැන්පොළකට පමණක් සීමා විය. ධාතුවංසය කාකවණ්ණ තිස්ස රජුගේ ප්‍රවෘත්තිවලින් අවසන් වන නිසා ඉන් පසුව රුහුණ ගැන සඳහන් වන ඓතිහාසික තතු විමසීමක් දීර්ඝ ලෙස කිරීමට මෙහිලා උත්සාහ නොකරමි. පසුකාලයේ රුහුණේ පැවතුණු රාජ්‍ය තත්ත්වය පිළිබඳ සෑහෙන විස්තරයක් පී. ටී. ඒ. ගුණසිංහ මහත්මා "පුරාතන රෝහණ රාජ්‍යය" නමැති කෘතියෙන් පැහැදිලි කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.[2] රොහණ රාජ්‍යය ගැන විවරණයක් කරන ආචාර්ය සිරිමල් රණවැල්ල මහත්මා මෙසේ පවසයි.

> "රුහුණු ප්‍රදේශය සම්බන්ධයෙන් දුටුගැමුණුට පසුව ආ රජවරුන් විසින් එහි පාලනය සඳහා කුමන වැඩ පිළිවෙළක් අනුගමනය කළේ ද යන්න නිගමනය නොකළ හැකිය. තරමක් දුරට මේ වගකීම අනපසු කළ බව පෙනේ."[3]

---

1. රාජාවලිය, 18 පි. බී. ගුණසේකර, එච්. රෝස් කොට්ල්, රජයේ මුද්‍රණාලය, කොළඹ 1926.
2. පුරාතන රෝහණ රාජ්‍යය – දීපානි මුද්‍රණශිල්පියෝ, නුගේගොඩ 1968.
3. අනුරාධපුර යුගය; "රෝහණ රාජ්‍යය" 254 පිට. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය 1961.

පසුකාලයේදී අනුරාධපුරයේ හා පොළොන්නරුවේ ඇති වූ රාජ්‍ය අස්ථිර තාවන් නිසා පලා යන රජුන්ගේ ආරක්ෂා ස්ථානයක් ලෙසිනුත් ප්‍රතිප්‍රහාර සංවිධානය කරන මධ්‍යස්ථානයක් වශයෙනුත් රුහුණ ප්‍රයෝජනයට ගත් බව පෙනේ. ඒ ඒ කාලයන්හි රුහුණ පාලනය කළ ප්‍රදේශාධිපතින්ගේ සහාය ලැබූ ඒ ඒ රජවරු අභිමතාර්ථය සිද්ධ වූ පසු නැවත රුහුණේ දියුණුවක් පිළිබඳ කල්පනා නොකළ බව පෙනෙයි. විශේෂයක් වශයෙන් කරන්නට ඇත්තේ තමන්ට සහයෝගය දුන් ප්‍රධානීන්ට යම යම් සත්කාර සම්මාන කිරීම හෝ අනුරාධපුරයට කැඳවා එහි යම යම් තනතුරු පැවරීම හෝ බව පෙනේ. ධාතුසේන කුමරා රුහුණට පලා ගොස් එහිදී සංවිධානය වී අනුරපුර රාජ්‍යබලය ලබා ද්‍රවිඩ පාලකයින්ට සහයොගය දක්වූ අනුරාධපුර ප්‍රභූන්ගේ ආදයම් මාර්ග හා බලතල ඉවත් කොට ඒවා රුහුණේ ප්‍රධානීන්ට පැවරූ ආකාරය එක් උදහරණයක් වශයෙන් මෙහි ලා සිහි කරමු.

තෙසං ගාමෙ ගහෙත්වාන ගාමෙසවාකාසි රක්ඛකෙ
රොහණාගමම තෙ සබ්බෙ කුලීනා තමුපට්ඨහුං
තෙසං සක්කාරසම්මානං යථා යොග්ගමකාසි සො[1]

රෝහණ රාජ්‍යයේ පෞරාණිකත්වය අනුරාධපුරය තරමට ම ඈතට දිවයන බව ඉතිහාසකරුවෝ විශ්වාස කරති.[2] ලක්දිව වයඹදිග පෙදෙසට ගොඩබට ආර්ය පිරිසට සම්බන්ධ නොවූ ස්වාධීන පිරිසක් විසින් රුහුණ ජනාවාසයක් කර ගන්නා ලදී. පසුව භද්දකච්චානා කුමරියගේ සොහොයුරන් කිහිපදෙන නිසා ජනපද බිහි විය.

තථා විජිත-දීඝායු රොහණානං නිවාසකා
විජිතගාමො දීඝායු රොහණනාති ච වුච්චරෙ

යන මහාවංස විස්තරයෙන් එය පැහැදිලි වෙයි. මුලදී ඇති වූ ජනාවාස කවර ප්‍රදේශවලදැයි කියා ස්ථිර නිගමනයන්ට බැසීමට තරමක් දුෂ්කරය. මුලදී අවුත් පදිංචි වූ පිරිස තුළ බුද්ධාගම ගැන දැනීමක් ද තිබූ බව ඉතිහාසකරුවෝ විශ්වාස කරති.

"මහියඞගණ පුවත ද බුදුන්වහන්සේ එහි වැඩි බව සඳහන් විමද මේ ස්ථානය (රොහණය) බෞද්ධාගම සහ ආර්යයන්ගේ පැමිණීමට පෙර සිටම පූජනීය ස්ථානයක්ව පැවති බවත් පසුව එය වැදගත් බෞද්ධ සිද්ධස්ථානයක් බවට පත්වූ බවත් අනුමාන කිරීමට තුඩු දේ."

යනුවෙන් ලක්ෂ්මන් එස්. පෙරේරා මහතා පවසන්නේ ඒ අදහසයි.[3] ඓතිහාසික වශයෙන් පෙනෙන ආර්යාගමනයට පෙරාතුව පදිංචි වූ ආර්ය පිරිසකුත් ස්වදේශීය පිරිසකුත් රුහුණුබදව වසන්නට ඇත. දෙවනපැතිය් රජුදවස පැවැත්වුණු

1. මහාවංස, 38 පරි. 39 ගාථාව.
2. **විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය, සිංහල පරිවර්තනය, 12 පිට.**
3. **අනුරාධපුර යුගය: "රෝහණ රාජ්‍යය", 241 පිට.**

බෝධි පූජා උත්සවයට පැමිණියහයි මහාවංසයේ[1] සඳහන් වන කතරගම ක්ෂත්‍රියයනුත්, චන්දනගම ක්ෂත්‍රියයනුත් මුලදී අවුත් පදිංචි වූ ආර්ය පිරිස්වල පාරම්පරිකයින් විය හැකියයි ලංකාවිශ්වවිද්‍යාලයීය ඉතිහාස ග්‍රන්ථයේ සඳහන් වෙයි.

> "කතරගම ක්ෂත්‍රියයන් විනාගි අනුරාධපුර රාජවංශයේ ආදිපුරුෂයන් හැටියට පුරාවෘත්තවල සඳහන් අයගෙන් පැවත එන්නන් බවත් කිසි තැනක සඳහන් නැත. ඔවුන් අනුරාධපුරය සහ ඒ අවට පෙදෙසේ පදිංචි වූ පිරිසට සබඳකමක් නැති වෙනත් ආගාමික පිරිසකගේ නායකයන්ගෙන් පැවත ආබව සිතිය හැකිය."[2]

යන විග්‍රහය දක්වන්නේ ඒ අදහස පැවසීමටයි. "භද්දකච්චානාකුමරිය හා ඇයගේ සොහොයුරන් ශාක්‍යයන් වූ බැවින් ක්‍රි.පූ. තුන්වන සියවසේදී කතරගම හා චන්දනගාමයේ විසූ ක්ෂත්‍රියයන් ඇයගේ සොයුරන්ගෙන් පැවත ආ බව සිතිය හැකිය" යනුවෙන් මීට වෙනස් අදහසක් ආචාර්ය සිරිමල් රණවැල්ල මහතා දක්වයි.[3] එහෙත් ඒ මහතාගේ අදහස ස්ථිර කිරීමට ඇති සාධක අල්පය. කතරගම ක්ෂත්‍රියයනුත් මාගම රජපරපුරත් අතර ගැටුමක් තිබුණු බව පෙනෙන නිසාත් අවසානයේදී ගෝඨාභය රජු අතින් දසබෑ රජවරුන් මැරුම් කෑ බව ධාතුවංසයේ සඳහන් වන නිසාත් රණවැල්ල මහත්මාගේ අදහසට වඩා විශ්ව විද්‍යාලයීය ඉතිහාස ග්‍රන්ථයේ අදහස පිළිගත හැකි බව පෙනේ. මේ මතවලින් කවරක් සත්‍ය හෝ අසත්‍ය වුවත් ධාතුවංසයේ සඳහන් වන මහානාග කුමරු මාගම බලයට පත් වන විට රුහුණේ ස්ථිරවූ පාලනතන්ත්‍රයක් තිබුණු බව පෙනේ. ඒ වන විට එය අනුරාධපුරයට යටත් නොවූ ස්වාධීන රාජ්‍යයක් වන්නට ඇත. මහානාග යුවරජ අනුරාධපුරයෙන් පලා ගොස් බිය සැක නැතිව මාගම රැඳුණේ ඒ නිසා විය හැකිය. මහාවංසයේ සඳහන් නොවන රාජ්‍ය ප්‍රදේශ කීපයක් ගැනත් ධාතුවංසය සඳහන් කරයි. මහාවංසයට අනුව ක්‍රි.පූ. දෙවන සියවස වන විට ලංකාවේ ප්‍රධාන රාජ්‍ය තුනකි. අනුරාධපුරය, මහාගාම, කැලණිය යන රාජධානි මුල් කොට ගත් රාජ්‍ය තුනයි ඒ. මේ රාජ්‍යවලින් එකට බැඳී කටයුතු කළේ රුහුණත් කැළණියත් යන රාජ්‍ය දෙකයි. රුහුණ අනුරාධපුරය හා සම්බන්ධකම් පැවැත්වීම වැඩි වූයේ මහානාග රජු රුහුණට අවුත් රාජ්‍ය ප්‍රදේශයක් පිහිටුවා ගැනීමෙන් පසුවයි. ලක්වැසියන්ගේ ආදි ජාතික පුරුද්දක් වන ආගන්තුක සත්කාරය උසස් කොට සැලකීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුරාධපුරයෙන් පැන ආ මහානාගහට මාගම රාජ තන්තවයෙන් ඉන්නට ඉඩ ලැබුණි. පසුව ඒ පදිංචියම රුහුණු පාලකයන්ගේ ස්වාධීනත්ත්වය නැති වී අනුරාධපුරයට යටත්වීමට ද තුඩු දුන්නා විය හැකියි. "රුහුණ, මාගම, කැලණිය නුවර රජදරුවෝ අනුරාධපුර නුවරට කප්පන් නිතිපතා අවුරුද්දකට දෙන්නාහ"[4] යන රාජාවලි

1. මහාවංස 11 පරි. 53. ගාථාව.
2. විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය, පරිවර්තනය, 143 පිට.
3. අනුරාධපුර යුගය: "ලංකාවේ ආර්‍ය ජනපද පිහිටුවීම 70 පිට.
4. රාජාවලිය, බී. ගුණසේකර සංස්කරණය 17 පිට.

පාඨය මෙය අපට සිහි කරවයි. එහෙත් මේ කුඩා ලංකාව ප්‍රදේශවලට බෙදී කුඩා පාලන කොට්ඨාශයන් වශයෙන් තිබීම විදේශීය සතුරන්ගේ තෝතැන්නක් වීමට කාරණයක් නිසා සාමූහික රාජ්‍ය පාලනයක අවශ්‍යතාව තිබුණේය. මේ කුඩා රටෙහි විටින් විට ද්‍රවිඩ ආක්‍රමණිකයින් බලය අල්වා ගත්තේ කුඩා රාජ්‍ය-වලට බෙදී සිංහලයා අසමගිව සිටි නිසායයි කිය හැකිය. පසුකාලයේ හෝ සිංහල රාජ්‍යයන් එක්සත් කොට ස්වාධිනත්වය රැකගැනීමට මාර්ගය පෑදුණේ මහානාග රජුගෙන් මුල පිරුණු අනුරාධපුර හා රෝහණ රාජ්‍යයේ සම්බන්ධය නිසායයි කිව හැකිය.

## මාගම්පුර රාජධානිය

මහානාග යුවරජුට පෙර මාගම වශයෙන් රාජධානියක් අපට නොපෙනේ. සිය සොහොයුරාගේ බිරිය කළ උපක්‍රමයක් නිසා බියට පත්ව රුහුණට පලා ආ[1] මාහානාග කුමරා එකල රුහුණේ සිටි පාලකයන්ගේ ආධාර ලැබ මාගම රාජධානියක් පිහිටුවා ගත්තේය. එසේම එය දියුණු ද කළේය. මහා-නාගගේ පැමිණීම සමග බුද්ධාගම අතින් රුහුණට අමුතු ආලෝකයක් ඇතිවිය. දෙවනපෑතිස් රජුගේ බෝධිපූජාවට පැමිණි කතරගම හා සඳුන්ගම ක්ෂත්‍රිය-යන්ටත් තිවක්ක ගමේ බමුණාටත් රෝපණය කරන්නට බෝධි ශාඛා දුන් බව[2] සඳහන් වෙතත් බුද්ධාගම පිළිබඳ දියුණුවක් ඒ ප්‍රදේශවල තිබුණු බවක් සඳහන් නොවේ. කතරගම ක්ෂත්‍රියයන් බෞද්ධයන් නොවූවත් රාජ්‍ය උත්සවයකට පැමිණි පිරිසක් වශයෙන් රජුගෙන් ලැබුණු බෝධි ශාඛා ත්‍යාගය ගෞරවයෙන් පිළිගන්නට බැරිකමක් නැත. මහානාග රජු අනුරාධපුරයේදී ලැබූ ආගමික පරිසරය අමතක නොකොට මාගමදී එය දියුණු කළ බව පෙනේ. ඒ වටිනා තොරතුරු අපට ලැබෙන්නේ ධාතුවංසයෙනි. ඉහතදී ධාතු පරම්පරාවේ අවසානයට දක්වූ මහාදේව තෙරුන් වහන්සේගෙන් නලාට ධාතූන් වහන්සේගේ භාරකාරත්වය පවරා ගත් මහානාග රජතුමා එය මාගමට වැඩමවා ගෙන ධාතු ගෙයක් කරවා මහා පූජාවිධි පවත්වමින් ආරක්ෂා කළේය. නලාටධාතුව පිළිබඳව ලක්දිවදී ඇසෙන ප්‍රථම පුරාවෘත්තය මෙයයි. එතැන සිට කාකවණ්ණ තිස්ස රජු දක්වා එය රැකුණේ රජවරුන්ගේ ආරක්ෂාව යටතේය. පසුකාලයේ පාත්‍රා ධාතුව හා දළදාව රාජ්‍ය උරුමයේ සංකේතයක් ලෙස සිංහලේ රජවරු සැල-කුවාක් මෙන් මාගම රජවරුද රාජ්‍ය උරුමය තහවුරු කරන වස්තුවක් වශයෙන් මෙය රැකි බව පෙනේ. මේ නලාටධාතු පුවත රුහුණට බුද්ධාගම පැමිණීම යනුවෙන් නම් කරන්නට පවා උචිත බව පෙනේ. එපමණක් නොව තම රාජධා-නියේ වෙහෙර විහාර සියයක් පමණ මහානාග රජු කළ බව ධාතුවංසය සඳහන් කරයි. මහානාගගේ ඇවෑමෙන් යටාලතිස්සත් ඔහුගෙන් පසු තම පුත්‍ර ගෝඨා-භයත් ගෝඨාභයගෙන් පසු කාකවණ්ණතිස්සත් පිළිවෙළින් මාගම රජ වූහ. යටාලතිස්ස ගෝඨාභය දෙදෙනා පිය-පුතුන් නොව සොහොයුරන් බව මහාචාර්ය

1. මහාවංසය, 12 පරි. 2–6 ගාථා.
2. මහාවංසය, 19 පරි. 60,61 ගාථා. (තිවක්කගම වවුනියා ප්‍රදේශයේ පිහිටියේය.)

සෙනරත් පරණවිතාන මහතා පවසයි. "......එබැවින් ගෝඨාභය රජු ගත යුත්තේ ඉතිහාස පොත්වල සඳහන් පරිදි නොහොත් ඒවායින් ඉතා වැදගත් පොත්වල විවරණය කොට ඇති පරිදි යටාලතිස්ස රජුගේ පුත්‍රයා හැටියට නොව ඔහුගේ සහෝදරයා හැටියට යි" යනාදි වශයෙන් විමර්ශනාත්මක සාකච්ඡාවක තීරණය පළ කරයි.[1] ඒ මහතා මෙ තීරණය ගැනීමට හේතුසාධක වශයෙන් මඩකලපු දිස්ත්‍රික්කයේ කුසලානකන්ද ලෙන් ලිපියත් මෙ ප්‍රවෘත්තිය මහාවංසය කියද්දී ඇති වන අවුල් සහගත තත්ත්වයත් උපයෝගි කර ගනී. ඒ තීරණයට එකඟවිය හැකි අනුමාන සාක්ෂිද අපට ලැබේ. මහානාග උපරජුගේ පුත් යටාලතිස්ස කල්‍යාණ නමැති නුවරක් කරවා එහි විසුවේ යයි රාජාවලිය හා රාජරත්නාකරය පවසයි.[2] මෙය කැලණියදැයි සැක සහිතයි.[3] යටාලතිස්සගෙන් පසු දෙවෙනිව ඔහු රුහුණු මාගම රාජ්‍ය කළේයයි එහි සඳහන් කළ කියමන මෙහි ලා විමසීම වටී. මහානාගගෙන් පසු රජවන්නට සිටියේ යටාලතිස්ස නම් ඔහු 'කැලණි නුවර' කරවා රාජ්‍ය කරන්නට ගියේ ඇයි? එසේම ගොඨාභය යටාලතිස්සගේ පුතු නම දෙවෙනිව මාගම රාජ්‍ය කළේයයි කියන්නේ ඇයි? එහෙත් අප නොදන්නා මූලාශ්‍රයක් පදනම් කර ගෙන ගෝඨාභය රජුන් කැලණියේ රජකම කළේයයි රුහුණු මාගම්පුර වර්ණනාව පවසයි.[4] ඒ කෘතිය ගැන මීට පෙර සඳහන් කළෙමි. මහානාග රජුට පුතුන් දෙදෙනකු සිටි නිසා වැඩිමහල් පුත් කල්‍යාණ නගරයේ රාජ්‍යපාලනයක් ගෙනයන්නට ඇත. කාවන්තිස්ස රජු මාගම සිටින අවදියේදි ඔහු පුත් ගැමුණු කුමරු ගිරි නුවර පාලනය කළාක් මෙනි. මහානාගගේ ඇවෑමෙන් යටාලතිස්ස මාගම රාජ්‍යය භාර ගත් විට තම දෙවැනි පුත් ගෝඨාභය කල්‍යාණ නගරය පාලනය කරන්නට ඇත. මෙහි කැලණි නුවර කරවා යන අදහස නම් එය රුහුණේ, කැලණිය නම් වූ වෙනත් ප්‍රදේශයක්දැයි නිගමනය කළ හැක. කැලණිපුරයේ පිහිටීම ගැන වර්තමාන ඉතිහාසඥයන් අතර පවතින අදහස් ද මෙහිලා විමසීම වටී. සිරිමල් රණවැල්ල මහතා විද්‍යුලකර දෙවන අංකයට කැලණි රාජ්‍යයේ නැඟීම හා පිරිහීම යන මාර්තෘකාව යටතේ සපයන ලිපියේත් පී. ටී. ඒ. ගුණසිංහ මහතා "පුරාතන රෝහණ රාජ්‍යය" නම් කෘතියේ කැලණිය කොහි පිහිටියේ ද යන අදහස මතු කරමින් කරන සාකච්ඡාවෙත් මෙ පිළිබඳ අදහස් දක්වා ඇත. යටාලතිස්ස කරවූ කැලණිය, ප්‍රසිද්ධ කැලණි රාජ්‍යයෙන් වෙනස් එකක් නම් යටාලතිස්ස ගෝඨාභය දෙදෙනා සොහොයුරන් ය යන මතයට එලියක් ලැබෙයි. මහාවංසයෙහි කියැවෙන විස්තරයට වඩා වෙනස් තත්ත්වයක් මෙයින් මතුවන බව පෙනේ. ඒ විමසීම ඉතිහාසකරුවන්ට අයත් වේවා. යටාලතිස්ස ගෝඨාභය දෙදෙනා ද සැහෙන ආගමික කටයුතු රැසක් කළ බව ධාතුවංසයේ සඳහන් වේ.

1. විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය, සිංහල පරිවර්තනය 150· පිට.
2. **රාජාවලිය,** බී. ගුණසේකර, 17,පිට; **රාජරත්නාකරය,** සයිමන් ද සිල්වා වාසලමුදලි, 10 පිට.
3. "යටාලතිස්ස රජු කළ කැලණිය දිවයිනේ ගිනිකොණින් පිහිටි 'කල්‍යාණකණණිකා'' නම් ප්‍රදේශයයි.—ආචාර්ය සී. ඊ. ගොඩකුඹුර මහතාගේ පුද්ගලික නිවේදනයකි.
4. **රුහුණුමාගම්පුර වර්ණනාව,** 11 පිට.

ගෝඨාභය රජු ගැන විශේෂ පුවතක් ද එයි. එතුමා කතරගම දසබෑ රජුන් මරා දමූ බවද එයින් උද්ගත වූ මහජන කළකිරීමට පිළියම් වශයෙන් මහවැලි ගඟින් එතෙර මෙතෙර විහාර පන්සියයක් බැඳින් කළ බවද ධාතුවංශයේ සඳහන් වේ. මහානාග යුවරජ ආත්මාරක්ෂාව තකා අනුරපුරයෙන් බැහැරව අවුත් මාගම රාජ්‍යය පිහිටුවා ගත්තේය. ඔහු ආයේ බලවාහන ද සහිතවය.[1] ඒ අවධියේ කතරගම පාලනය කළ ක්ෂත්‍රියයන් මැඩපවත්වා රාජ්‍යයක් පිහිටු-වන්නට ඇතැයි සිතිය නොහේ. එතරම් විශාල හමුදවක් ඔහු සමග එන්නට අවස්ථාවක් හෝ හේතුවක ඇති නොවිණි. රුහුණේ බලවත්තු, අනුරපුර රාජ්‍ය කරන්නන් අතර ඇතිවූ මේ හබය ගැන සිත යටින් සතුටු වන්නට ඇත. රොහණය එතරම් බලවත්ව නොසිටි නිසාත්, මේ භේදය ගැන සතුටු වන නිසාත් මාගම රාජ්‍යයක් පිහිටුවන්නට මහානාග උපරජුට සහයෝගය දක්වන්නට ඇත. සහයෝගය දී කටයුතු කළත් රාජවංශ දෙකක් නිසා පසුව යම් යම් ගැටීම් ඇති වන්නට ඇත. යටාලතිස්ස යුගයේ දී මෙය තවත් දියුණු වී ගොඨාභය රජුදවස වැඩි වන්නට ඇත. එහි ප්‍රතිඵලය වූයේ ගෝඨාභය විසින් ඔවුන් මරා දමා ඒ ප්‍රදේශය තමා සතු කර ගැනීමය. කොතරම් බලගතු වුවත් රුහුණුවාසීන් අතර අනුරපුරෙන් ආ රජුන් කෙරෙහි වැඩි භක්තියක් මුලදී නොතිබෙන්නට ඇත. ඒ රජුන් රුහුණේ බලය තහවුරු කළේ ක්ෂත්‍රියන්ගේ සහයෝගය ලැබීමෙන් බව මහජනයාගේ සිත් තුළ පැවතුණාට සැක නැත. ගෝඨාභය යුගය වන විට විරුද්ධ පාලන පිරිසක් සිටි නිසා කතරගම සොහොයුරන් දසදෙනා සිය රාජ්‍ය ප්‍රදේශය කොටස්වලට බෙද ගෙන මහජනයාට වඩා ප්‍රයෝජනවත් ක්‍රමවත් පාලනයක් ගෙන යන්නට ඇත. මෙ ගැන මාගම යටත්වැසියෝ ද දැන සිටින්නට ඇත. ඒ නිසාත් මුලදී මහානාග පරපුරට සහයෝගය දක්වන්නට ඇති නිසාත් මෙ ඝාතනය ගැන මහජනයා කලකිරෙන්-නට ඇත. ඒ කලකිරීම නැති කිරීම සඳහා මෙසා විශාල ප්‍රමාණයක් විහාර සෑදවූ බව පෙනී යයි. දසබෑ රජුන් මැරීම නිසා කලකිරුණු මහජනයා තමාට අවනත කර ගැනීම පිණිස මෙවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නට ඇති බව සෙනරත් පරණවිතාන මහත්මා පවසයි. "......පුරාණ කාලයේ සදචාර නීතිවලට අනුව කළගුණ නොසැලකීම වනාගි පසුනැවිල්ලෙන් පින්-දහම්වල යෙදී සමාව ලබා ගත යුතු දුෂ්ට අපරාධයකි."[2] දසබෑරජුන් මරා ඔවුන්ගේ පාලන බලය නැති කළ ද කතරගම ක්ෂත්‍රියවංශය අභාවයට නොගොස් තැන් තැන්වල සුළු සුළු රාජ්‍ය ප්‍රදේශයන් ඇතුව සිටි බව ද පරණවිතාන මහතා සාධක සහිතව දක්වයි.[2] කරුණු කෙසේ වුවත් දසබෑ රජුන් මරා ඒ ප්‍රදේශයේ බලයත් තමන් සතු කර ගැනීමෙන් ගෝඨාභය රජු කළ මෙ ක්‍රියාව ඔහුගේ පුත්‍ර කාකවණ්ණතිස්ස රජතුමා කළ රුහුණු රාජ්‍යය එක්සත් කිරීමෙ පිළිවෙතට විශාල උපකාරයක වීයැයි සඳහන් කළ හැකිය.

---

1. "උපරාජා තං කාරණංඤත්වා දෙවියා භීතො තතොයෙව අත්තනො දෙවිඤ්ච බල වාහනඤ්ච ගහෙත්වා රොහණං අගමාසි." Thupavamsa p. 206, PTS, London 1971.
2. විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය, සිංහල පරිවර්තනය, 143 පිට විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. කැලණිය 1964.

ගෝඨාභය රජුගෙන් පසු මාගම රජවූයේ කාකවණ්ණතිස්සයි. ථූපවංසයේ දුටුගැමුණු රජු මෙන් නලාට ධාතුවංසයේ ප්‍රධාන කථානායකයා වශයෙන් පෙනී සිටින කාකවණ්ණතිස්ස රජු සියපුත් දුටුගැමුණු කුමරු අනුරාධපුරය ද්‍රවිඩ බලයෙන් මුදවා ගැනීමට කළ ව්‍යාපාරයේ පසුබිම සකස් කළ තැනැත්තා වශයෙන් හැඳින්විය හැකිය. එතුමා ඒ පසුබිම සකස්කළේ මාගම රාජ්‍යය එක්සත් රාජ්‍යයක් කිරීමෙන් බව පැහැදිලි වෙයි. ඉතිහාසඥයන් කල්පනා කරන හැටියට කැලණියේ රාජ පරම්පරාවත් කතරගම ක්ෂත්‍රියයනුත් එක පරම්පරාවකට අයත්ය.[1] අනුරාධපුර රාජ පරම්පරාවට සම්බන්ධ වූ මහානාග පරම්පරාවට ඔවුහු සම්බන්ධ නැත. එමනිසා ගෝඨාභය රජු කතරගම දසබෑ රජුන් මැරීමත් සමග කැලණි රජවරු අමනාප වන්නට ඇත. අමනාප වුවත් ප්‍රතික්‍රියා කිරීමට තරම් ශක්තිමත් නොවූයේ කැලණිය කුඩා රාජ්‍යයක් වීමත් මාගම බලවත් රාජ්‍යයක් වීමත් නිසයි. එහෙත් මෙ අමනාපය සිංහලයන්ගේ බෙදීමට තුඩු දෙන නිසා නැති කළ යුතු විය. කාවන්තිස්ස රජු ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ගය නම් කැලණියේ තිස්ස රජුගේ දූ වූ දේවී කුමාරිය විවාහ කර ගැනීමයි. එය තවත් තහවුරු වීම වස් සිය නැගණියන් වූ සෝමා දේවිය කැලණියේ අභය කුමරුට පාවා දෙයි. කැලණිය හැර එදා පැවති තවත් ප්‍රත්‍යන්ත රාජ්‍යයන් කිපයක සාමයෙන් නමුත් දූරදර්ශී තියුණු බුද්ධියෙන් සිය බලය පතුරුවා ලිය. බෞද්ධ සංස්කෘතියෙන් හික්මවනු ලැබූ ජනයාගේ හිත් ගන්නට ඇති වැදගත් මාර්ගය ආගමයි. පුද පූජා පවත්වමින් තම පරපුරෙන් පරපුරට රැක ගෙන එන නලාට ධාතූන් වහන්සේ නිදන් කිරීමට ඔහු තෝරා ගත්තේ ප්‍රදේශ රාජ්‍යයකි. ඒ සේරු නුවරයි. පරම්පරානුයාත පූජ්‍ය වස්තුවක් වූ නලාට ධාතූන් වහන්සේ නිදන් කිරීමට චෛත්‍යයක් කළ යුතු සුදුසුම ස්ථානය මාගම විය. ඒ සුදුසුකමට වඩා එයින් ලබා ගත හැකි විපුල ප්‍රයෝජනයක් ඔහු දුටුවේය. සේරු නුවර, ගිරි නුවර, ලෝණ නුවර ආදි ධාතුවංසයේ පෙනෙන ප්‍රාන්ත රාජ්‍ය අර්ධ ස්වාධීනත්වයක් දරන්නට ඇත. කාකවණ්ණතිස්ස යුගය වන විට රජ රටේ දෙමළ බලය දියුණු වී මහවැලි ගංතෙර තෙක් ව්‍යාප්තව තිබිණි. අනාගතයෙහි ද්‍රවිඩයන්ට විරුද්ධව කරන්නට බලාපොරොත්තු වන සටනට ප්‍රදේශ රාජ්‍යයන්ගේ සහයෝගය අත්‍යවශ්‍ය විය. ඒ හැරත් ද්‍රවිඩ පාලකයන් විසින් යම් විදියකින් මාගමට උතුරෙන් පිහිටි ඒ ප්‍රදේශ රාජ්‍යයන් යටත් කර ගතහොත් මාගම රාජ්‍යයට ඒ විශාල තර්ජනයකි. මෙ කරුණු හැමෙකක්ම සලකා බැලූ කාකවණ්ණතිස්ස රජ අත්‍යන්ත ජන ගෞරවයට පත් වූ නලාටධාතූන් වහන්සේ සේරු නුවර චෛත්‍යයක් කොට නිදන් කරන්නට තීරණය කළේය. මෙයින් ඒ ප්‍රදේශවල ජනයා එතුමාට ගෞරව දක්වන නිසා ඔහුගේ ක්‍රියා කලාපය ගැන විරුද්ධ වන්නට ප්‍රාදේශීය රජුන්ට අවසරයක් නොලැබුණි. චෛත්‍ය බැඳවීමට පෙර මෙතුමා කළ තවත් රාජ්‍ය උපක්‍රමයක් ගැන ධාතුවංශයෙන් හෙළි වෙයි. එනම් සිය නැගණිය වූ සෝමා දේවිය විවාහ කර ගත් අභය රජු පාලනය කළ ගිරි නුවරට තම පුත් ගැමුණු කුමරු පිටත් කර යැවීමයි. නෑකම පෙරට තබා දුටුගැමුණු ගිරි නුවරට යැවූ

1. එම 144 පිට.

නමුත් ගැමුණු කුමරු උසිගන්වා ක්ෂත්‍රිය විවාදයක් මතු කොට ගිරි අභය රජු එම නුවරින් පලවා හැර එහි ගැමුණුකුමරුගේ පාලනය තහවුරු කළ බව ඉතිහාසය පිළිබඳ උගත්තු අදහස් කරති.[1] කාවන්තිස්ස රජුගේ රාජ්‍යයේ ප්‍රත්‍යන්ත දේශයන් වශයෙන් සලකන ලද ප්‍රදේශ අනුන් අයත් විය නොදී රැක ගැනීමට ද එතුමා සමත් විය. දීඝවාපිය එවැනි ප්‍රදේශයක් විය. ගැමුණු කුමරු ගිරි නුවරට යැවූ අතර (ථූපවංසය අනුව ගිරි ජනපදයට පලා යාමකි) තිස්ස කුමරුන් දීඝා වැවට යැවුයේ ඒ ප්‍රදේශය රැකීමටයි (තිස්සකුමාරං ජනපදරක්ඛණත්ථාය දීඝවාපියං ඨපෙසි).[2] මහාවංස, ථූපවංස අනුව අනාගත අනුරාධපුර සටනට සේනා සංවිධානය කිරීමත් අය්වැද්දීමේ ව්‍යාපාරයන් කරවමින් ආගමික කටයුතු මාර්ගයෙන් මහජනයාගේ සිත් ගනිමින් නැකමන් ආගමත් ඉවහල් කරගෙන මාගම එක්සත් කළ වීර රජ කෙනෙකු ලෙස කාකවණ්ණතිස්ස හැඳින්විය හැකිය. මොහුගේ මේ දූරදර්ශී ක්‍රියා පිළිවෙත ගැන විශ්වවිද්‍යාලයීය ඉතිහාස ග්‍රන්ථයේදී පරණවිතාන මහතා විවරණය කරයි.[3] "සුළු කුමාරවරුන් පාලනය කරන ලද ජනපදයක් එකට ඇඳීමෙන් ද එක්සත් රජයක් ඇති කිරීමෙන් ද ඒ මගින් තමන්ගේ විරුද්ධකාරයින් සියල්ල නිෂ්ප්‍රභ කිරීමෙන් ද රෝහණ රාජ්‍යය ගොඩනැඟීමෙහි වැදගත්ම මෙහෙය කරන ලද්දේ කාකවණ්ණතිස්ස රජු විසිනි" යනුවෙන් ආචාර්ය ලක්ෂ්මන් එස්. පෙරේරා මහතා ද ඉදිරිපත් කරන්නේ මේ අදහසමයි.[4] මේ ආකාරයෙන් ප්‍රශංසාවට ලක් වන කාකවණ්ණතිස්ස චරිතයට අපේ පිළිගත් වංශකථා රචකයින් විසින් ආරෝපණය කරන ලද බියසුලු චරිතය - වෙනත් ලෙසකින් විග්‍රහ කොට හඳුනාගන්නට ලැබෙන මූලාශ්‍රයන් අතුරෙන් නලාට ධාතුවංසයට ලැබෙන්නේ ප්‍රධානම තැනකි.

## කැලණියේ රාජධානිය

කැලණියේ රාජධානියේ පිහිටීම ගැන උගතුන් විවිධ අදහස් පළ කරන බව මුලදී සඳහන් කළෙමු. කැලණියත් ආර්යාගමනයට පෙර ඈත අතීතයකට දිව යන ඉතිහාසයක් ඇතැයි සිතිය හැකිය. පසුව පැමිණි ආර්ය ජන කොටස් විසින් ඒ ප්‍රදේශයේ සිටි ස්වදේශික ජන කොටස් යටත් කරන්නට ඇත. බුදුරදුන් තෙවැනි ගමන කැලණියට වඩිද්දී එහි විසූවෝ මෙ ස්වදේශික නාග ගෝත්‍රිකයෝය. බුදුරදුන්ගේ වැඩමවීමට අමතරව මහාවංසයේ කැලණිය ගැන සඳහන් වන්නේ කැලණිතිස්ස රජුගේ දියණිය වූ දේවී කුමරිය මාගම කාවන්තිස්ස රජුට බිරිය වීමේ පුවතයි. එහෙත් ධාතුවංසයේ එන කැලණියේ සිව රජකු ගැනත් ඔහුගේ භාගිනෙය්‍ය වූ අභය කුමරා ගැනත් සඳහන් වෙයි. මෙ කැලණියේ විසූ රාජ පරම්පරාව කතරගම ක්ෂත්‍රියයන්ට සම්බන්ධ වූ නමුත් අනුරපුර රාජ පරම්පරාවට සම්බන්ධ නොවූ පිරිසක් හැටියට විශ්වවිද්‍යාලයීය

1. විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය, සිංහල පරිවර්තනය 145 පිට.
2. *The Chronicle of the Thupa and the Thupavamsa*, pp. 77 and 207, N. A. Jayawickrama, PTS, London 1971.
3. විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය, 146 පිට.
4. අනුරාධපුර යුගය, 251 පිට.

ඉතිහාස ග්‍රන්ථය පවසන අතර[1] කැලණි රාජපරම්පරාව අනුරාධපුර රාජපරම්පරාවට සම්බන්ධයයි දක්වීමට ආචාර්ය සිරිමල් රණවැල්ල මහතා උත්සාහයක් දරයි.[2] මහාවංශ ටීකාව කැලණිතිස්ස, උත්තිය දෙදෙනා මුටසීවගේ මුණුබුරෙකු වූ උත්තිය රජුගේ පුතුන් බව කියයි. "කල්‍යාණිරාජිනො පන තිස්සස්ස උත්තියො නාම කණිට්ඨයො අහොසි. තෙසං පිතා මුටසිවරඤ්ඤො නත්තා උත්තියරාජිනො පුත්තො"[3] යන මහාවංස ටීකා පාඨය උපයෝගී කර ගන්නා රණවැල්ල මහතා එයට කරුණු දක්වයි. එහෙත් කතරගම ද උත්තිය කෙනෙකු සිටි බව පැවසෙන නිසා අනුරාධපුර සිටි උත්තිය යයි වරදවා ගෙන මුටසිව ඔවුන්ට සම්බන්ධ කරන්නට ඇතැයි යන අදහස දරණ ලංකා ඉතිහාස ග්‍රන්ථය කැලණිතිස්ස හා උත්තියගේ පියා වූ උත්තිය කතරගම සිටි තැනැත්තා විය හැකියයි සඳහන් කරයි. මතභේද කවරක් වුවත් කැලණියත් රුහුණත් අතර තිබුණු සම්බන්ධය ගැන යමක් මහාවංසයට වඩා ධාතුවංසයෙන් එළිදරව් වෙ. කාකවණ්ණතිස්ස–විහාර දේවී විවාහයට අමතරව කැලණියේ සිව රජු ස්වකීය භාගිනෙය්‍ය වූ අභයට කාකවණ්ණ රජුගේ නැඟණිය වූ සෝමා දේවිය ගෙන්වා සරණ කර දුන් බව ධාතුවංසය පවසයි. භාගිනෙය්‍ය යනු බෑනායි. විහාර දේවිය කැලණියේ සිවගේ සොහොයුරිය නිසා කාකවණ්ණතිස්සගේ නැඟණිය සිවගේත් විහාරදේවියගේත් බෑනාට දීම නෑකම අතින් නොගැලපේ. බෑනා යනු බෑණා වී නම් ගැටලුවක් මතු නොවේ. බෑණා යනු සොහොවුරායි. ධාතුවංසයේ සිංහල පිටපතක "කැලණියේ සිව නම් මහ රජ තමාගේ බෑණා වූ අභය රාජ කුමාරයාහට කාවන්තිස්ස රජ්ජුරුවන්ගේ බුහුණනි වූ සෝමා දේවී නම් රාජ කුමාරිකාවක් මහපෙරහරින් ගෙනවුත් පාවාදී බෑණනුවන් අභය රාජ කුමාරයන් ගිරි නුවර වාසය කරවූයේය."[1] යනුවෙන් සඳහන් වෙයි. පාලි ධාතුවංසයට මුල් වූ සිංහල කෘතියේ තිබෙන්නට ඇත්තේ බෑණ කියා විය යුතුයි. ඒ බෑණ යන වචනය බෑනා යයි සිතා භාගිනෙය්‍ය යනුවෙන් වරදවා යෙදුවා විය හැකිය. එසේ සලකා "අත්තනො භාගිනෙය්‍යස්ස" යන්න "අත්තනො භාතුනො" යයි ගතහොත් බොහෝ අවුල් විසඳෙන බව පෙනේ. ලංකාවිශ්වවිද්‍යාල ඉතිහාස ග්‍රන්ථය කැලණියේ සිව විහාරදේවියගේ සොහොයුරා ලෙස පිළිගනී. ඒ පිළිගැනීම අනුව කැලණිතිස්සගේ මරණින් පසු කැලණි ඉතිහාසය ගැන තොරතුරක් දැනගන්නට නැත යන නිගමනයට බසින්නට ඉඩ නැත. කැලණියේ සිව රජුත් අභය කුමරුත් විහාර දේවියත් විහාර දේවියගේ සොහොයුරායයි ධාතුවංසයේ සඳහන් කරන චූලපිණ්ඩපාතිය හිමියනුත් කැලණිතිස්ස රජුගේ දරුවන් බව කිව හැකිය. සිව කැලණියේ රජ වූ අතර අභය ගිරි නුවර විසීය. කැලණි රාජපරම්පරාව ගැන දීර්ඝ විමර්ශනයක යෙදෙන සිරිමල් රණවැල්ල මහතා සිව රජු කැලණිතිස්සගේ පුතා නොව පියා ලෙස

1. විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය, 144 පිට.
2. විද්‍යුලකර දෙවැනි අංකය, 44 පිට.
3. මහාවංස ටීකා, 307 පිට (1895)
4. සිංහල ධාතුවංශය, සුමෙධඞ්කර සංස්කරණය, හා වෙනත් පුස්කොළ පිටපත් කීපයක.

හඳුන්වයි.[1] ධාතුවංසයේ සඳහන් පරිදිම අභය සිවගේ බෑනා (භාගිනෙය්‍ය) බව ද සඳහන් කරයි. මෙ විමර්ශනවල ප්‍රතිඵල වශයෙන් ලැබෙන විහාරදේවියගේ හා කාවන්තිස්සගේ වයස් පරතරය රසවාහිනියේ එන පුවතක් ද මතක්කරමින්, වියහැක්කක් ලෙස ද දක්වයි. ඒ මහත්මාගේ වැඩි අවධානය යොමු වී ඇත්තේ කැලණි රාජපරම්පරාව අනුරාධපුරයේ උත්තියට සම්බන්ධ කිරීම බව පෙනේ. මෙහිදී ඉහත කී නිගමනවලට බසින්නට ඒ මහතාට සිදු වී ඇත. එහෙත් ඥාති සම්බන්ධතා සලකන විටත් කැලණි රාජ්‍යය කැලණිතිස්සගෙන් පසු එකවර ඇනහිටින්නට හේතුවක් නොවුණ නිසාත් විශ්වවිද්‍යාලයීය ඉතිහාස ග්‍රන්ථයේ මතය සත්‍යයට වඩා ළං වෙතැයි සිතමි. අභය සිවගේ බෑනා බවට ඒත්තු ගැන්වීමට ධාතුවංස පාඨයට අමතරව ජිනකාලමාලියේ වාර්තාවත් රණවැල්ල මහතා සිහිපත් කරයි. ජිනකාලමාලියත් මේ ප්‍රවෘත්තිය ධාතුවංසය බලා ගෙන ලියා තිබෙන නිසා[2] ප්‍රමාණ පාඨයක් වශයෙන් එහි වැදගත්කමක් නැත. කවර ලෙසකින් හෝ මේ විශේෂ ප්‍රවෘත්තිය සඳහන් වීම නිසා ඓතිහාසික වශයෙන් තවත් වැදගත්කමක් ලැබීමට ධාතුවංසය සමත් වී ඇත.

## ගිරි නුවර

මහාවංසයේ සඳහන් නොවන ප්‍රදේශ රාජ්‍යයන් කීපයක් ගැන ධාතුවංසයෙන් තොරතුරු ලැබේ. ගිරි නගර, සෝම නගර, සේරු නගර, ලෝණ නගර යන සතරයි ඒ. එයින් ගිරි නුවර අසවල් ප්‍රදේශය යයි නිගමනය කිරීම දුෂ්කරව ඇත. ගිරි නගරය කුමක්දැයි හඳුනා ගැනීමට ගුණසිංහ මහතා සෑහෙන උත්සාහයක් දරා ඇත.[3] මේ ගැන විවිධ අදහස් පවතී. ගිරි ජනපදය යනු දැනට ගිරුවා පත්තුවයි. එහෙත් ගිරුවාය මාගම පත්තුවට යාබද ප්‍රදේශය වන එහි බටහිර සීමාව තිස්සමහාරාමයෙන් හැ. 40 ක් පමණක් නිසාත් ප්‍රදේශ රාජ්‍යයක් එහි වූ බව නිගමනය කළ නොහැක. තවද ගිරුවායේ එතරම පැරණි නගරයක් තිබූ තැනක් ගැනත් සාධක සොයා ගැනීම අපහසුය. ගිරි නුවර ඇතැම විට මලය දේශයේ විය හැකිය. මෙ ප්‍රදේශය රුහුණු රාජ්‍යයට සම්බන්ධකම ඇතිව අර්ධ ස්වාධීනත්වයකින් පැවතුණක් ලෙස සඳහන් කළ හැකිය. කැලණියේ සිව රජු අභය කුමරා මෙහි පාලනයට පිටත් කර යැවීය. සෝමා දේවියත් සමග අභය එහි වාසය කරද්දී කාකවණ්ණතිස්ස රජ සිය පුත් දුටුගැමුණු කුමරුවන් ඇමතියෙකුගේ ආරක්ෂාව යටතේ ගිරි නුවර වාසයට යැවීය. (අමච්චං තස්සපිතුවඨානෙ ඨපෙත්වා ගිරිනගරං පාහෙසි). මේ ඇමතියා දාවා නැමැත්තෙකැයි සිංහල ධාතුවංශය සඳහන් කරයි. මහාවංසයේ හා ථූපවංසයේ සඳහන් වන දුටුගැමුණු කුමරුගේ මලය රටේ විසීමත් ගිරි නුවර විසීමත් අතර යම සම්බන්ධතාවක් තිබෙන බව පෙනේ. දුටුගැමුණු කුමාරයා ගිරි ජනපදයෙහි ගත කළ පුවත ඓතිහාසික සත්‍යයක් වශයෙන් පිළිගත හැකි බවත් පිය රජුට අකීකරු වී

1. විදුලකර දෙවන අංකය, 1962, ''කැලණි රාජ්‍යයේ නැගීම හා පිරිහීම'', 47 පිට ගුණසිංහ මහතා ද රණවැල්ල මතය දරණ බව පෙනේ. පුරාතන රෝහන රාජ්‍ය, 180 පිට.
2. *Epocks of the Conguorce* p. 71 n. 6. N.A. Jayawickrama, PTS, London, 1968 .
3. පුරාතන රොහණ රාජ්‍යය, 189 පිට.

මලය රටට පැන ගොස් විසීම ප්‍රබන්ධයක් විය හැකි බවත් සිරිමල් රණවැල්ල මහතා පවසයි.[1] කාකවණ්ණතිස්ස රජතුමාගේ ක්‍රියාකලාපය ගැන ධාතුවංසයෙන් හෙළි වන ආකාරයට ඒ අදහස තහවුරු වෙයයි සිතමි. ගැමුණු කුමරු ගිරි නුවර සිටියදී සිය මාමා වූ අභය රජුත් සමග ඇති වූ "ජාතිය නිසා විවාදයෙන්" ගැමුණුට ඉඩ දී අභය සේරු නුවරට යයි. මේ ජාතිය නිසා ඇති වූ විවාදය රුහුණත් කැලණියත් එක පරම්පරාවක රජුන් නොවූ බවට පරණවිතාන මහතා දක්වන අදහසට රුකුලක් වෙයි. ගිරිඅභය ගිරි නුවරින් බැහැරවීමත් සමග දුටුගැමුණු එහි ප්‍රධාන පාලකයා වන්නට ඇතුවාට සැක නැත. කාකවණ්ණතිස්ස රජු සේරු නුවර චෛත්‍ය කරවීමට ගියේ ගිරි නුවර සිටි ගැමුණු කුමරා ගෙන්වා මාගම නවත්වයි. ඒ අවස්ථාවේදී ගිරි නුවර පාලනය කළේ කවද යන බවක් ධාතුවංසයේ සඳහන් නැත. එය ඉබේටම මාගම පාලන ප්‍රදේශයට හසුවන්නට ඇත. දැනට මාගම යන නමින් හඳුන්වනු ලබන ගම පුරාණ මහාගාම නොවේ. රුහුණු දනව්වේ ග්‍රාමණිගේ මහාග්‍රාමය තිස්සමහාරාමයයි දැනට ප්‍රකට නගරයයි.

## සෝම නුවර

ගිරි නුවරෙහිදී මාමා බෑනා අතර වූ අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහිවූ නුවරයි සෝම නුවර. ගැමුණු හා කලහ කිරීමට අකමැති වූ හෝ ශක්තියක් නොතිබූ අභය සිය බිරියත් සමග සේරු නුවර රජ කළ සිව නම් මිත්‍ර රජකුගේ උපකාරය පතා ගියේය. ඔහු සාදරයෙන් පිළිගත් සේරු නුවර සිව රජතුමා වෙනම නුවරක් කරවා එය අභයට පැවරිය. බිසවගේ නමින් ඒ නුවර සෝම නම් විය. මේ රාජ්‍යය වැඩි විශාල එකක් විය නොහැකිය. මෙ කාලය තුළ වැඳ පුදා ගැනීමට ස්ථානයක් නොදුටු සෝමාදේවිය ඒ ගැන සිය සැමියාට දැන්වීය. (අථාපරස්මිං කාලෙ සොමදෙවි රඤ්ඤා සද්ධිං කථෙසි: අයය, අම්හාකං පටිසරණං චෙතියං ච විහාරං ච ඉමස්මිං ඨානෙ නත්ථි. තස්මා චෙතියං ච විහාරං ච කාරෙතුං වට්ටතීති). මාගමදී ඈ ලැබූ ආගමික වාතාවරණය යටපත් කරන ලද මෙ ඉල්වීම අභය රජතුමා පැහැර නොහළේය. එතුමා මිහිඳු නම තෙර කෙනෙකුගේ උපදෙස් පරිදි බුදුන්ගේ දකුණු දළදාව නිදන් කොට විශාල චෛත්‍යයක් කළේය. එයට ද සිය දේවියගේ නම තැබූ බව පෙනේ. සෝම නුවර පිහිටි ප්‍රදේශය තීරණය කරන්නට හැකි වන ලෙස මේ චෛත්‍යය අද දක්වා අපට පෙනෙන්ට තිබේ. සෝමාවතී චෛත්‍යය පුරාණ සඳකඩපහන් ආදියෙන් හෙබි ඉතා අගනා ස්ථානයක් බව අද මතු කොට ඇති දෙරටු සතරෙන් පැහැදිලි වෙයි. අභයගෙන් පසු මෙ කුඩා සෝම නුවර ගැන කිසිවක් දැනගන්නට නැතත් ඒ රාජ්‍යය මතක් කිරීම සඳහා සෝමාවතී චෛත්‍යය ප්‍රමාණවත් වෙයි. ඒ නුවර ගැන මෙන්ම මේ වැදගත් නිර්මාණයේ හරි තොරතුරු ලබාගැනීමට ප්‍රධාන මූලාශ්‍රය වීමෙන් ධාතුවංසය සිය අගය අපට පෙන්වයි.

1. විදුලකර දෙවන අංකය, 76 පිට (1962)

**සේරු නුවර**

ධාතුවංසයේ සඳහන් සේරු නුවරත් එහි බැඳි චෛත්‍යයත් ඓතිහාසික සමීක්ෂණයකට මග පාදයි. නලාට ධාතුව නිදන් කොට චෛත්‍යයක් කිරීමට කාකවණ්ණතිස්ස රජ සේරු නගරය තෝරා ගත්තේය. ඒ වන විට එහි පාලකයා වූයේ සිව නමැති රජෙකි. සේරු නගරය අර්ධස්වාධීන රාජ්‍යයක් ලෙස තිබෙන්ට ඇත. එහි අර්ධස්වාධීනත්වය සැහෙන තරමකින් මාගම එක්සත් රාජධානිය බිහිකිරීමේ ක්‍රියා මාර්ගයට බාධාවක් විය හැකි නිසා එහි චෛත්‍යයක් බඳවා බලය තහවුරු කර ගෙන රටවැසියා තමාවෙත අවනත කර ගැනීමට කාකවණ්ණතිස්ස රජු සිතුවා විය හැකිය. එතුමා චූලපිණ්ඩපාතියතිස්ස මහ තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් පිරිවරා ගෙන නලාට ධාතුව රැගෙන එහි ගියේය. කාකවණ්ණතිස්සගේ අදහස ගැන සිව රජු දැනගන්නට ඇතත් මහජනයා ඒ ගැන අමුත්තක් නොසිතනු ඇත. බුදුරදුන්ගේ නලාට ධාතුව කාකවණ්ණතිස්ස රජු අතින් මහවැලි ගං තෙර සේරු නම් විලක් අසබඩ ඉදි කරන චෛත්‍යයක නිදන්වන්නේ යයි බුදුමුවින්ම ප්‍රකාශ විණැයි යන අදහස භික්ෂූන් මාර්ගයෙන් මේ වන විට පතුරුවා තිබෙන්නට ඇත. එවැනි වාතාවරණයක් යටතේ මේ අවස්ථාව මඟ හැරීමට හෝ ඊට විරුද්ධ වීමට සිව රජුට හැකිකමක් නැත. එතුමා පඬුරු පාක්කුඩම් ගෙන ඉදිරියට අවුත් කාකවණ්ණතිස්ස රජු පිළිගෙන ඔහුගේ වැඩපිළිවෙළට අනුකූලතාව දැක්වීය. සිව රජුගේ හා ඒ අවට සිටි අනෙක් ප්‍රාන්තරජුන්ගේ සහයෝගය ලබා ගෙන සේරුවාවිල චෛත්‍යය කරවා ඒ අසල විහාරයක් ද සාදවා භික්ෂූන්ට පූජා කළේය. එය පූජා කළේ ද විහාර දේවියගේ සොහොයුරා වූ චුල්ලපිණ්ඩපාතියතිස්ස තෙරුන්ටය.

සේරු නුවර ඉදි කළ චෛත්‍යයේ නලාට ධාතුව පමණක් නොව කේස ධාතුන් ද නිදන් කළ බව ධාතුවංසයේ සඳහන් වේ. ඒ කේස ධාතු සිව නම් තෙරකෙනෙකුන් විසින් භූමින්ධර නාගලෝකයේ ජයසේන නම් නාගරාජයෙකු වෙත තිබී රැගෙන ආ බව ද විස්තර වෙයි. ගිරිකණ්ඩික නම් චෛත්‍යයක් වර්ණනා කරන තිරියායේ ප්‍රසිද්ධ ලිපියේ සඳහන් කේසධාතූන් හා මෙහි සඳහන් කේසධාතුවලත් සම්බන්ධයක් ඇද්දැයි විමසා බැලිය යුතු කරුණකි. නාගලෝකය හා සම්බන්ධ වූ ආශ්චර්යවත් සිද්ධියක් ලෙස පෙනෙන මේ පුවත ජනප්‍රවාදයක් ලෙස සලකා ඉතිහාසකරුවන් එතරම් ගණන් නොගත්තා විය හැකිය. කේසධාතු ගෙන ආවේ සිව නම් තෙර කෙනකුන් නිසාත් සිවයන් කැලණියට සම්බන්ධ නිසාත් ඔවුන් නාග ගෝත්‍රිකයන් බව ඉතිහාසඥයන් අදහස් කරන නියා මේ සිද්ධිය විමසිය යුත්තක් බව අපගේ අදහසයි. තපස්සු හා භල්ලික වෙළඳ දෙබෑයන් ගෙනා කේසධාතූන් ගැන තිරියායේ ලිපියේ සඳහන් වේ. තිරියායේ ගිරිකණ්ඩ චෛත්‍යයඉදිකළත් කේස ධාතූන් එහි නිදන් නොකොට විහාර මන්දිරයක් කොට එහි තැබුවා විය හැකිය. එම ස්ථානය මුහුදට ළං වූ එකක් නිසා සිව තෙරුන්ගේ පරපුරට අයත් කවුරුන් විසින් හෝ බැහැර පෙදෙසකට ගෙන ගොස් රැක ගත්තා දෝයි විමසනු වටී. 'අනුරාධපුර යුගයේ' තිරියාය ලිපිය ගැන කෙරෙන

විස්තරය මෙහි ලා ඉතා ප්‍රයෝජනවත් වෙයයි සිතමි.[1] කේසධාතුවංසයක් ගැන මහවංසයේ සඳහන් වේ.[2] ඒ අනුව කේසධාතූන් ද කලක් යන තුරු අතින් අතට යමින් පැවති බව සිතිය හැකියි. කේසධාතූන් සේරුවාවිල චෛත්‍යයේ නිදන් කළ නිසා එම ග්‍රන්ථයත් සේරුවාවිල චෛත්‍යයට සම්බන්ධ දැයි අනුමානයක් ඇතිවෙයි. ධාතු නිධානෝත්සවයට මල් ගෙන ඊම සඳහා හිමවතට ගිය සාමණේරයන් වහන්සේලා සතර නමගෙන් කෙනෙක් සේරු නුවර සිව රජුගේ බෑනාගේ පුතායයි සඳහන් වේ. (එකො සෙරුනගරෙ සිවරාජභාගිනෙය්‍යස්ස පුත්තො උත්තරසාමණෙරො නාම.) මෙ සාමණේරයන් වහන්සේ ඉහත කී සිව තෙරුන්ගේ ශිෂ්‍ය නමක් හෝ විය හැකියි. සේරු නුවර වැඩ විසුවායයි පෙනෙන සිව තෙරුන් ද එය පාලනය කළ සිව රජු ද උත්තර සාමණේර නම ද කැලණි රජපරපුරට සම්බන්ධ පිරිසක් වශයෙන් සැලකිය හැකිය. ගිරිනුවරින් බැහැර වූ කැලණියේ සිවගේ සොහොයුරු අභය රජුට හොඳින් සත්කාර කොට අමුතුවෙන් නගරයක් පවා ඉදි කොට දී සේරු නුවර සිව රජතුමා කළ උපකාරය මේ අදහස වඩාත් ඔප්පු කරන්නක් විය හැකිය. ධාතුවංසය ඇසුරෙන් සේරු නුවර ආශ්‍රිතව කළ මෙ විවරණය නිසා මේ ග්‍රන්ථයේ ඇතැම් සිදුවීම් හාරා අවුස්සා බලත් බලත්ම වැදගත් ඓතිහාසික නිගමනයන්ට බැසගත හැකි බව පෙනේ.

### ලෝණ නුවර

චෛත්‍ය කර්මාන්තය සඳහා පැමිණි කාකවණ්ණතිස්ස රජු පිළිගැනීමට ලෝණ නගරයේ මහානාග නම රජකෙනෙකුද පැමිණි බවත් චෛත්‍ය කර්මාන්තයට ආධාර කළ බවත් ධාතුවංසයේ සඳහන් වෙයි. මෙ නගරය අසවල් තැනයයි කියා කීමට හෝ මහානාග රජු අසවලායයි කීමට හෝ වෙනත් ඓතිහාසික මූලාශ්‍රයක් හමු වී නැත. බදුල්ලේ සිට බිබිල හරහා යන මහා මාර්ගයෙහි පස්සර අසල ඇති ලුණුගල නම් ගම ලෝණ නගරය විය හැකියයි ඇතැම්හු අදහස් කරති. එහි රජමහා විහාරයක් ද තිබෙන බව සඳහන් වේ.[3] මේ රාජ්‍ය ප්‍රදේශයත් මාගම රාජ්‍යයට යටත් වූවකි.

මෙසේ ගිරි නගරය, සෝම නගරය, සේරු නගරය, ලෝණ නගරය යන නගරයන් සම්පූර්ණයෙන් කාකවණ්ණතිස්සගේ අණසකට යටත් වූ පසු එක්සත් රෝහණ රාජ්‍යයක් බිහිවූයේ යයි විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ කථිකාචාර්යව සිටි අපවත් වී වදාළ හාන්දුපැල්පොල පුඤ්ඤරතන නාහිමියෝ පවසති.[4] එම යුගයේදී ලක්දිව ප්‍රධාන රාජ්‍යය රෝහණ රාජ්‍යයයි. කාවන්තිස්ස රජතුමා එහි අගරජ තනතුර ඉසිලීය. මහවැලි ගඟින් උතුරෙහි වූ රජරටේ

1. අනුරාධපුර යුගය, 130 පිට.
2. මහාවංසය, 39 පරි. 36 ගාථාව.
3. විද්‍යොදය සරසවි සඟරාව, 2 කලාපය (1961–62): "මහාවංශ කතුවරුන් නොදුටු සිංහල රාජධානි", 113 පිට, එල්ලාවල මේධානන්ද.
4. විද්‍යොදය විශ්වවිද්‍යාලයීය ඉතිහාස සඟරාව, 5 කලාපය (1961): "රජගල හෙවත් ගිරිකුම්භිල විහාරය", 29 පිට, හාන්දුපැල්පොල පුඤ්ඤරතන.

බලය විදේශිකයන් අල්ලාගෙන රෝහණ කල්‍යාණී දේශ සීමාවන්හි ඉදි කළ බලකොටුත් සමග බලකොටු 32 ක් ඉදි කොට පුරා 44 වසක් සිංහලයන්ට තමන්ගේ රාජ්‍යය ආපසු ලබා ගැනීමට ඉඩ නුදුන් බව පෙනේ. එහෙත් එක්සත් රෝහණ රාජ්‍යයක් පිහිටුවීම ඒ සඳහා ගත් අර්ථවත් පියවරක් විය. කැලණිය හා ඇති කර ගත් ඥාති සම්බන්ධයත් සේරුවාවිල චෛත්‍ය නිර්මාණයත් උපයෝගි කරගෙන කාකවණ්ණතිස්ස රජතුමා මේ කාර්යය කළ බව ධාතුවංසයෙන් පැහැදිලි වෙයි. කාව්‍යමය අතින් වැඩි දියුණුවක් හෝ භාෂාව අතින් ව්‍යක්ත බවක් නොපෙන්වනත් මහාවංස, දීපවංසාදි ප්‍රධාන වංසකථාවලින් මඟහැරී ගිය ඓතිහාසික ප්‍රවෘත්ති රාශියක් ධාතුවංශයෙන් ලැබෙන නිසා ලංකා ඉතිහාසය පිළිබඳ කරුණු සෙවීමේදී එයින් ලැබෙන පිටුවහල ඉතා මහත් බව සඳහන් කරමු.

# ධාතුවංසො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## 1. තථාගතස්සාගමනකථා

සම්බුද්ධමතුලං සුද්ධං ධම්මං සඞ්ඝං අනුත්තරං
නමස්සිත්වා[1] පවක්ඛාමි ධාතුවංසප්පකාසනං[2].

තික්ඛත්තුමගමා නාථො ලඞ්කාදීපං මනොරමං
සත්තානං හිතමිච්ඡන්තො සාසනස්ස චිරට්ඨිතිං.

තත්ථ තික්ඛත්තුමගමා නාථො'ති අනමතග්ගෙ සංසාරවට්ටෙ පරිනාමෙත්වා[3] අප්පතිසරණභාවප්පත්තානං[4] ලොකියලොකුත්තරසුඛනිප්ඵාදනභාවෙන නාථො පතිසරණ[5] භූතො භගවා බුද්ධධම්මසඞ්ඝරතනත්තයමග්ගං[6] ආවික්ඛන්තො ලඞ්කාදීපං තික්ඛත්තුං ගතො. තත්ථ පඨමගමනෙ තාව බොධිමණ්ඩං ආරුය්හ පුරත්ථිමාභිමුඛො[7] නිසීදිත්වා සුරියෙ අනත්ථඞ්ගතෙයෙව[8] මාරබලං විධමෙත්වා, පඨමයාමෙ පුබ්බෙනිවාසඤාණං අනුස්සරිත්වා මජ්ඣිමයාමෙ චුතූපපාතඤාණං පත්වා පච්ඡිමයාමාවසානෙ පච්චයාකාරෙ ඤාණං ඔතාරෙත්වා දසබලචතුවෙසාරජ්ජාදි ගුණපතිමණ්ඩිතං සබ්බඤ්ඤුතඤ්ඤාණං පටිවිජ්ඣිත්වා බොධිමණ්ඩප්පදෙසෙ අනුක්කමෙන සත්තසත්තාහං වීතිනාමෙත්වා අට්ඨමෙ සත්තාහෙ අජපාලනිග්‍රොධමූලෙ[9] නිසින්නො ධම්මගම්භීරතං පච්චවෙක්ඛනෙන[10] අප්පොස්සුක්කතං ආපජ්ජමානො දසසහස්සබ්‍රහ්මපරිවාරෙන සහම්පතිමහාබ්‍රහ්මුනා ආයාචිතධම්මදෙසනො

---

1. නමස්සිත්වා – ජී. වි. කෙං.
2. ධාතුවංසප්පකාසකං – ජී. කෙං.
   ධාතුවංසං සුභංපියං – සිං. ධා.
3. පරිනාමෙත්වා – ජී.
4. අප්පතිස්සරණභාව සන්තානං – ජී. වි. කෙං.
5. පතිස්සරණ – ජී. වි. කෙං.
6. රතනත්තයං මග්ගං – ජී. වි. කෙං.
7. පුරත්ථිමායභිමුඛො – කෙං.
8. අත්ථඞ්ගමිතෙයෙව – ජී. වි. කෙං.
9. නිග්‍රොධරුක්ඛමූලෙ – ජී. වි.
10. පච්චවෙක්ඛණෙන – ජී. වි. කෙං.

හුත්වා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො පඤ්චවග්ගියානං භික්ඛූනං බහූපකාරතං අනුස්සරිත්වා උට්ඨායාසනා කාසිනං[1] පුරං ගන්ත්වා අඤ්ඤාකොණ්ඩඤ්ඤප්පමුඛෙ අට්ඨාරස බ්‍රහ්මකොටියො අමතං පායෙන්තො ධම්මචක්කං පවත්තෙත්වා පක්ඛස්ස පඤ්චමියං පඤ්චවග්ගියෙ සබ්බෙපි තෙ අරහත්තෙ පතිට්ඨාපෙත්වා තං දිවසමෙව යසකුලපුත්තස්ස රත්තිභාගෙ සොතාපත්තිඵලං දත්වා පුනදිවසෙ අරහත්තං දත්වා තස්ස සහායකෙ චතුපඤ්ඤාසජනෙ අරහත්තං පාපෙත්වා එවං ලොකෙ එකසට්ඨියා[2] අරහන්තෙසු ජාතෙසු වුත්ථවස්සො පවාරෙත්වා, 'චරථ භික්ඛවෙ චාරික'න්ති[3] භික්ඛූ දිසාසු පෙසෙත්වා සයං උරුවෙලං ගච්ඡන්තො අන්තරාමග්ගෙ කප්පාසිකවනසණ්ඩෙ භද්දවග්ගියෙ කුමාරෙ තිංසජනෙ විනෙත්වා එහිභික්ඛුභාවෙන පබ්බාජෙත්වා උරුවෙලං ගන්ත්වා අඩ්ඪුඩ්ඪානි පාටිහාරියසහස්සානි දස්සෙන්තො උරුවෙලකස්සපාදයො සහස්සජටිලපරිවාරෙ තෙභාතිකජටිලෙ විනෙන්තො තත්ථෙව විහාසි.

අපරභාගෙ අඞ්ගමගධරට්ඨවාසිනො උරුවෙලකස්සපස්ස මහායඤ්ඤං උපට්ඨාපෙසුං. සො පන ඉච්ඡාචාරාභිභූතො[4] චින්තෙසි: "ස්වායං මහාසමණො ඉමස්ස සමාගමස්ස මජ්ඣෙ පාටිහාරියං කරෙය්‍ය ලාභසක්කාරො මෙ පරිහායිස්සතී" ති. තස්සෙවං පවත්තඅජ්ඣාසයං ඤත්වා පාතොව උත්තරකුරුතො භික්ඛං ආහරිත්වා අනොතත්තතො ආහාරං පරිභුඤ්ජිත්වා සායන්හ[5]සමයෙ ඵුස්සපුණ්ණමීඋපොසථදිවසෙ ලඞ්කාදීපස්සත්ථාය ලඞ්කාදීපමුපාගමි.

තස්ස පන දීපස්ස මහාගඞ්ගාය දක්ඛිණපස්සෙ ආයාමතො තියොජනෙ පුථුලතො එකයොජනප්පමාණෙ මහානාගවනුය්‍යානෙ යක්ඛසමාගමස්ස මජ්ඣෙ තස්ස උපරි මහියඞ්ගණථූපස්ස පතිට්ඨානට්ඨානෙ[6] ආකාසෙයෙව ඨිතො වුට්ඨිවාතන්ධකාරං දස්සෙත්වා තෙසං භයං උප්පාදෙසි. තෙ භයෙන උපද්දුතා "කස්ස නු ඛො ඉමං කම්ම" න්ති ඉතො චිතො ඔලොකෙන්තා අද්දසංසු[7] භගවන්තං ආකාසෙ නිසින්නං. දිස්වාන[8] භගවන්තං අභයං යාචිංසු. තෙසං භගවා ආහ:

1. කාසිකං – ජී. වී. කෙ෴.
2. එකසට්ඨි – කෙ෴. එකසට්ඨීසු – ජී. වී.
3. චාරිකං භික්ඛවෙ චරථා'ති – ජී. වී. කෙ෴.
4. ඉච්ඡාමාරාභිභූතො – කෙ෴.
5. සායණ්හ – ජී. වී. කෙ෴.
6. පතිට්ඨිතට්ඨානෙ – ජී. වී. කෙ෴.
7. අද්දක්ඛිංසු – ජී. අද්දසිංසු – වී. කෙ෴.
8. දිස්වා – ජී. වී. කෙ෴.

“සචෙ තුම්හෙ අභයං ඉච්ඡථ මය්හං නිසජ්ජට්ඨානස්ස ඔකාසං දෙථා” ති. සබ්බෙපි තෙ තස්ස නිසජ්ජට්ඨානං අදංසු. භගවා නිසජ්ජාය ඔකාසං ගහෙත්වා තෙසං භයං විනොදෙත්වා තෙහි දින්නෙ භූමිභාගෙ චම්මඛණ්ඩං පත්ථරිත්වා නිසීදි. නිසින්නො ච පන භගවා චම්මඛණ්ඩං පසාරෙසි.[1]

තෙ යක්ඛා භීතතසිතා අඤ්ඤත්ථ ගන්තුං අසහමානා සමන්තතො සාගරතීරෙ රාසිභූතා අහෙසුං. සත්ථා ගිරිදීපං[2] ඉද්ධානුභාවෙන ආහරිත්වා දස්සෙසි. තෙසු තත්ථ පතිට්ඨිතෙසු පුන යථාට්ඨානෙව ඨපෙත්වා පත්ථරිතචම්මඛණ්ඩම්පි සංඛිපි. තස්මිං ඛණෙ තතො තතො දෙවා සන්නිපතිංසු. තෙසං සමාගමෙ ධම්මං දෙසෙසි. අනෙකෙසං පාණකොටීනං ධම්මාභිසමයො අහොසි. සරණෙසු ච සීලෙසු ච පතිට්ඨිතා අසඞ්ඛෙය්‍යා අහෙසුං. සුමනකූටෙ පන මහාසුමනදෙවො සොතාපත්තිඵලං පත්වා අත්තනො පූජනීයං භගවන්තං යාචි. භගවා තෙන යාචිතො සීසං පාණිනා පරාමසිත්වා කෙසධාතුං ගහෙත්වා තස්ස අදාසි. දත්වා ච පන ලඞ්කාදීපං තික්ඛත්තුං පදක්ඛිණං කත්වා[3] පරිත්තං කත්වා ආරක්ඛං සංවිධාය පුන උරුවෙලමෙව ආගතො.

සො පන කෙසධාතුයො සුවණ්ණචඞ්ගොටකෙනාදාය සත්ථු නිසින්නට්ඨානෙ නානාරතනෙහි විචිත්තං ථූපං පතිට්ඨාපෙත්වා[4] උපරි ඉන්දනීලමණිථූපිකාහි පිදහිත්වා ගන්ධමාලාදීහි පූජෙන්තො විහාසි. පරිනිබ්බුතෙ පන භගවති සාරිපුත්තස්ස අන්තෙවාසිකො සරභූ නාම ථෙරො ඛීණාසවො චිතකතො ඉද්ධියා තථාගතස්ස ගීවට්ඨිං ආදාය තස්මිං ඉන්දනීලමණිථූපෙ පතිට්ඨාපෙත්වා[4] මෙඝවණ්ණපාසාණෙහි ද්වාදසහත්ථං ථූපං කාරාපෙත්වා ගතො.[5] තතො දෙවානම්පියතිස්සරඤ්ඤො භාතා චූළාභයො නාම කුමාරො තමබ්භුතං චෙතියං දිස්වා අභිප්පසන්නො තං පටිච්ඡාදෙන්තො තිංසහත්ථං චෙතියං පතිට්ඨාපෙසි. පුන දුට්ඨගාමණී අභයමහාරාජා තං පටිච්ඡාදෙත්වා අසීතිහත්ථං කඤ්චුකචෙතියං[6] කාරාපෙසි.

---

1. පසාදෙසි - සී. වි. කො.
2. යක්ඛගිරිදීපං - සී. වි.
3. තික්ඛත්තුං විචාරෙත්වා - සී. වි. කො.
4. පතිට්ඨපෙත්වා - වි.
5. 'ගතො' ඉති - සී. වි. කො. පොත්ථකෙසු නත්ථි
6. චෙතියං - සී. වි. කනක චෙතියං - කො.
   කඤ්චුකචෙතියං - මව.

[මහියඞ්ගණ[1]ථූපස්ස පතිට්ඨානාධිකාරො එවං විත්ථාරතො[2] වෙදිතබ්බො :

බොධිං පත්වාන සම්බුද්ධා බොධිමූලෙ නරාසභො
නිසීදිත්වාන සත්තාහං පාටිහීරං තතො අකා.

තතො පුබ්බුත්තරෙ ඨත්වා පල්ලඞ්කා ඊසකෙ ජිනො
අනිමිසෙන[3] නෙත්තෙන සත්තාහං තං උදික්ඛයි.

චඞ්කමිත්වාන සත්තාහං චඞ්කමෙ රතනාමයෙ
විචිනිත්වා[4] ජිනො ධම්මං වරං සො රතනාඝරෙ.

අජපාලම්හි සත්තාහං අනුභොසි සමාධිජං
රම්මෙ ච මුචලින්දස්මිං විමුත්තිසුඛමුත්තමං.

රාජායතනමූලම්හි සත්තරත්තින්දිවං වසී
දන්තපොනොදකං සක්කො අදසි සත්ථුනො තදා.

චතූහි ලොකපාලෙහි සිලාපත්තං සමාහටං
චතුක්කමෙකකං කත්වා අධිට්ඨානෙන නායකො.

වාණිජෙහි තදා දින්නං මන්ථඤ්ච මධුපිණ්ඩිකං
තහිං පන ගහෙත්වාන භත්තකිච්චං අකා ජිනො.

ගණ්හිංසු සරණං තස්ස තපුස්සභල්ලිකා[5] උභො
සරණං අගමුං තෙ තං[6] සත්ථු දින්නසිරොරුහා.[7]

ගන්ත්වාන තෙ සකං[8] රට්ඨං ථූපං කත්වා මනොරමං
නමස්සිංසු ච පූජෙසුං දෙවභාතිකඋපාසකා.

ඉති සො සත්තසත්තාහං වීතිනාමෙසි නායකො;
බ්‍රහ්මුනා යාචිතො සත්ථා ධම්මචක්කං පවත්තිතුං.

තතො බාරාණසිං ගන්ත්වා ධම්මචක්කං පවත්තයි[9]
කොණ්ඩඤ්ඤෙ දෙසිතෙ ධම්මෙ සොතාපත්තිඵලං ලභි.

බ්‍රහ්මානො'ට්ඨාරසකොටී[10] දෙවතා ච අසඞ්ඛියා
සොතාපත්තිඵලං පත්තා ධම්මචක්කෙ පවත්තිතෙ.

---

1. මයිහඞ්ගණ – වි. මයහඞ්ගන – ජි.
2. විත්ථාරො – ජි. වි. කෙ.
3. අනිමිසෙන – කෙ.
4. විචිනෙත්වා – වි. කෙ.
5. තපස්සුභල්ලිකා – වි. ජි.
6. තෙසං – ජි. වි. කෙ.
7. සිරොරුහං – ජි. වි. කෙ.
8. සක – ජි. වි. කෙ.
9. පවත්තිය – කෙ.
10. බ්‍රහ්මට්ඨාරසකොටී ච – ජි. වි. කෙ.

පත්තො පාටිපදෙ වප්පො හද්දියො දුතියෙ[1] එලං
තතියෙ[2] ච මහානාමො අස්සජි ච චතුත්ථියං.

තෙ සබ්බෙ සන්නිපාතෙත්වා පඤ්ච'මෙ පඤ්චවග්ගියෙ
අනත්තසුත්තං දෙසෙත්වා බොධියග්ග[3]ඵලෙන තෙ.

බොධිං පාපෙත්ව[4] පඤ්චාහෙ යසත්ථෙරාදිකෙ ජනෙ
තතො මග්ගන්තරෙ තිංසකුමාරෙ හද්දවග්ගියෙ.

උරුවෙලං තතො ගන්ත්වා උරුවෙලාය සඤ්ඤිතං[5]
උරුවෙලෙනනුඤ්ඤතො උරුවෙලනාගං දමි.

තං තං දමී ජිනො නාගං දමනෙන උරාදිගං
තථාගතං නිමන්තිංසු දිස්වා තෙ පාටිහාරියං.

ඉධෙව වනසණ්ඩස්මිං විහාරෙත්වා මහාමුනී
උපට්ඨාමසෙ සබ්බෙ නිච්චභත්තෙන තං මයං.

උරුවෙලකස්සපස්ස මහායඤ්ඤෙ උපට්ඨිතෙ
තස්ස'ත්තනො නාගමනෙ ඉච්ඡාචාරං විජානිය.[a]

උත්තරකුරුතො භික්ඛං හරිත්වා[6] දිපදුත්තමො[6]
අනොතත්තදහෙ භුත්වා සායණ්හ[7]සමයෙ සයං,[a]

බොධිතො නවමෙ මාසෙ ඵුස්සපුණ්ණමියං ජිනො
ලඞ්කාදීපං විසොධෙතුං ලඞ්කාදීපමුපාගමි.[a]

යක්ඛෙ දමිත්වා සම්බුද්ධො ධාතුං දත්වාන නායකො
ගන්ත්වාන උරුවෙලං සො වසී තත්ථ වනෙ ජිනො.

පඨමගමනකථා සමත්තා.

දුතියගමනෙ පන බොධිතො පඤ්චමෙ වස්සෙ ජෙතවනමහාවිහාරෙ වසන්තො චූළොදර[8]මහොදරානං මාතුලභාගිනෙය්‍යානං නාගානං මණිපල්ලඞ්කං නිස්සාය සඞ්ගාමං පච්චුපට්ඨිතං දිස්වා සයං පත්තචීවරමාදාය චිත්තමාසස්ස කාළපක්ඛ

1. දුතියං – පී. වි. කො.
2. තතියං – පී. වි. කො.
3. බොධියඞ්ග – පී. වි. කො.
4. පත්වා ච – පී. වි. කො.
5. උරුවෙලෙන සංපය – පී. වි. කො.
6. ආහරිත්වා'රිමද්දනො – මව.
7. සායණ්හ – පී. වි. කො.
8. චූලොදර – කො.
a. මහාවංස.

උපොසථදිවසෙ නාගදීපං ගන්ත්වා තෙසං සඞ්ගාමමජ්ඣෙ[1] ආකාසෙ නිසින්නො අන්ධකාරං අකාසි. තෙ අන්ධකාරාභිභූතෙ සමස්සාසෙත්වා ආලොකං දස්සෙත්වා අත්තනො සරණභූතානං තෙසං සාමග්ගිකරණත්ථං ඵලහරිතරුක්ඛං චාලෙන්තො විය ධම්මං දෙසෙසි. තෙ උභොපි ධම්මෙ පසීදිත්වා තම්පි පල්ලඞ්කං තථාගතස්ස අදංසු. භගවා පල්ලඞ්කෙ නිසින්නො දිබ්බන්නපානෙහි සන්තප්පිතො භත්තානුමොදනං කත්වා අසීතිකොටියො නාගෙ සරණෙසු ච සීලෙසු ච පතිට්ඨාපෙසි. තස්මිං සමාගමෙ මහොදරස්ස මාතුලො මණිඅක්ඛිකො නාම නාගරාජා භගවන්තං පුන කල්‍යාණිදෙසමාගමනත්ථං.[2] අයාචි. භගවා පන තුණ්හීභාවෙන අධිවාසෙත්වා ජෙතවනමෙව ගතො.

එවං හි සො නාගදීපං උපෙතො
මාරාභිභූ සබ්බවිදූ සුමෙධො
දමෙත්ව නාගෙ කරුණායුපෙතො[3]
ගන්ත්වා වසී ජෙතවනෙ මුනින්දො.

දුතියගමනකථා සමත්තා.

තතියගමනෙ පන බොධිතො අට්ඨමෙ වස්සෙ ජෙතවනමහාවිහාරෙ විහරන්තො භගවා: "මම පරිනිබ්බානතො පච්ඡා තම්බපණ්ණිදීපෙ සාසනං පතිට්ඨහිස්සති; සො දීපො බහුභික්ඛුභික්ඛුනිඋපාසකඋපාසිකාදි අරියගණසෙවිතො කාසාවපජ්ජොතො භවිස්සති, මය්හං චතුන්නං දාඨාධාතූනං අන්තරෙ එකා දාඨා ච දක්ඛිණඅක්ඛකධාතු ච නලාටධාතු[4] ච රාමගාමවාසීහි ලද්ධො එකකොට්ඨාසො ච අඤ්ඤෙ බහුසරීරධාතූ ච කෙසධාතුයො ච තත්ථෙව පතිට්ඨහිස්සන්ති. අනෙකානි සඞ්ඝාරාමසහස්සානි ච. බුද්ධධම්මසඞ්ඝරතනෙ පතිට්ඨිතසද්ධො මහාජනො භවිස්සති. තස්මා ලඞ්කාදීපං ගන්ත්වා තත්ථ සමාපත්තිං. සමාපජ්ජිත්වා ආගන්තුං වට්ටතී"ති චින්තෙත්වා ආනන්දත්ථෙරං ආමන්තෙසි :- "ආනන්ද චතුපටිසම්භිදප්පත්තානං පඤ්චසතමහාඛීණාසවානං භික්ඛූනං පටිවෙදෙසි, අම්හෙහි සද්ධිං ගන්තබ්බ"න්ති. ආනන්දත්ථෙරො කපිලවත්ථුකොළිය නගරවාසීනං පඤ්චසතමහාඛීණාසවානං භික්ඛූනං පටිවෙදෙසි. තෙ පටිවෙදිතා පඤ්චසතඛීණාසවා පත්තචීවරධරා හුත්වා සත්ථාරං

1. ගාමමජ්ඣෙ – ජී. වී. කෙ෴.
2. කල්‍යාණිදෙස ආගමනත්ථං – ජී. වී. කෙ෴.
3. කරුණා වුට්ඨිතො – ජී. කරුණාය වුට්ඨිතො – වී. කෙ෴.
4. ලලාටධාතු – වී.

වන්දිත්වා අඤ්ජලිං පග්ගය්හ නමස්සමානා අට්ඨංසු. සත්ථුනො පන සලලාය නාම ගන්ධකුටියා අවිදූරෙ රත්තසෙතනීලුප්පල-කුමුදපදුමපුණ්ඩරීකසතපත්තසහස්සපත්තජලජෙහි සොගන්ධික නානාපුප්ඵෙහි සඤ්ඡන්නා, සුභසොපාණා, පසාදිතමත්තිකා-කාකපෙය්‍යසුරමණීයසීතලමධුරොදකා සුඵුල්ලපුප්ඵඵලධාරිත නානාවිධවිචිත්තසාලසලලචම්පකාසොකරුක්ඛනාගරුක්ඛාදීහි සුසජ්ජිතභූමිප්පදෙසා අවවනන්තරමණීයා පොක්ඛරණී අත්ථි. තත්ථ අධිවත්ථො මහානුභාවො සුමනො නාම නාගරාජා සොළස-සහස්සමත්තාහි නාගමාණවිකාහි පරිවුතො මහන්තං සිරිසම්පත්තිං අනුභවමානො තථාගතස්ස රූපසොභග්ගප්පත්තං අත්තභාවං ඔලොකෙත්වා මහන්තං සුඛසොමනස්සං අනුභවමානො අත්තනො මාතරං නන්දනාගමානවිකං[1] ගරුට්ඨානෙ ඨපෙත්වා තස්සා වෙය්‍යාවච්චං කුරුමානො තස්මිංයෙව පොක්ඛරණිං අජ්ඣා-වසති. සත්ථා පන අත්තනො ගමනං සංවිධානානන්තරෙ සුමනං නාගරාජානං අවිදූරෙ ඨිතං ආමන්තෙත්වා සපරිවාරො ආගච්ඡාහී ති ආහ. සො සාධූති සම්පටිච්ඡිත්වා අත්තනො පරිවාරෙ ඡකොටිමත්තෙන නාගෙ ගහෙත්වා සුපුප්ඵිතචම්පකරුක්ඛං තථාගතස්ස සුරියරංසිනිවාරණත්ථං ඡත්තං කත්වා ගණ්හි.

අථ භගවා රවිරස්මිපජ්ජලිතසුවණ්ණපබ්බතො විය විරොචමානො අත්තනො පත්තචීවරමාදාය ආකාසං අබ්භුග්ගඤ්ඡි.[2] සත්ථාරං පරිවාරෙත්වා ඨිතා තෙ පඤ්චසතඛීණාසවාපි සකං සකං පත්තචීවරමාදාය ආකාසං උග්ගන්ත්වා සත්ථාරං පරිවාරයිංසු. සත්ථා පඤ්චසතඛීණාසවපරිවුතො විසාඛපුණ්ණමුපොසථදිවසෙ කල්‍යාණියං ගන්ත්වා මහාරහෙ මණ්ඩපමජ්ඣෙ පඤ්ඤත්තවර බුද්ධාසනෙ පඤ්චසතඛීණාසවපරිවුතො හුත්වා නිසීදි.

අථ මණිඅක්ඛිකො නාම නාගරාජා බුද්ධප්පමුඛං භික්ඛු සඞ්ඝං අනෙකෙහි දිබ්බෙහි ඛජ්ජභොජ්ජෙහි සන්තප්පෙත්වා එකමන්තං නිසීදි. සත්ථා තස්ස භත්තානුමොදනං[3] කත්වා සුමනකූටෙ පදලඤ්ඡනං දස්සෙත්වා තස්මිං පබ්බතපාදෙ අනෙක-පාදපාකිණ්ණභූමිප්පදෙසෙ නිසින්නො දිවාවිහාරං කත්වා තතො වුට්ඨාය දීඝවාපිචෙතියට්ඨානෙ සමාපත්තිං සමාපජ්ජි. මහාපථවී උදකපරියන්තං කත්වා සතවාරං සහස්සවාරං සඞ්කම්පි. තත්ථ මහාසෙනං නාම දෙවපුත්තං ආරක්ඛත්ථාය[4] නිවත්තෙත්වා[5]

1. මාණවිකං – ජී. වී. කෙ.
2. අබ්භුග්ගච්ඡි – කෙ.
3. භුත්තානුමොදනං – ජී.
4. ආරක්ඛනත්ථාය – ජී. වී. කෙ.
5. නීයාදෙත්වා – ජී. වී. කෙ.

තතො වුට්ඨාය මහාථූපට්ඨානෙ තථෙව සමාපත්තිං සමාපජ්ජි.[1] මහාපඨවී තථෙව කම්පි. තත්‍රාපි විසාලරූප[2]දෙවපුත්තං ආරක්ඛං ගණ්හනත්ථාය ඨපෙත්වා තතො වුට්ඨාය ථූපාරාම චෙතියට්ඨානෙ තථෙව නිරොධසමාපත්තිං සමාපජ්ජි. මහාපඨවී තථෙව කම්පි. තත්ථ ච පඨවිපාල[3]දෙවපුත්තං ආරක්ඛත්ථාය.[4] නිවත්තෙත්වා[5] තතො වුට්ඨාය මරිචවට්ටිචෙතියට්ඨානං ගන්ත්වා පඤ්චහි භික්ඛුසතෙහි[6] සද්ධිං සමාපත්තිං අප්පයි. පඨවි තථෙව කම්පි. තස්මිං ඨානෙ ඉන්දකදෙවපුත්තං ආරක්ඛං ගණ්හනත්ථාය ඨපෙසි. තතො වුට්ඨාය කාචරගාමචෙතියට්ඨානෙ[7] තථෙව සමාපත්තිං[8] සමාපජ්ජි. පඨවි තථෙව කම්පි. [තස්මිං ඨානෙ මහාඝොස[9]දෙවපුත්තං ආරක්ඛං ගණ්හනත්ථාය නිය්‍යාදෙසි.]* එතස්මිං මහාචෙතියට්ඨානෙ මහාඝොසං[10] නාම දෙවපුත්තං ආරක්ඛං ගණ්හනත්ථාය නිවත්තෙත්වා තතො වුට්ඨාය තිස්සමහා-විහාරචෙතියට්ඨානෙ තථෙව සමාපත්තිං සමාපජ්ජි. පඨවි තථෙව කම්පි. තත්ථ මණිමෙඛලං[11] නාම දෙවධීතරං[12] ආරක්ඛං ගාහාපෙත්වා තතො නාගමහාවිහාරචෙතියට්ඨානෙ තථෙව සමාපත්තිං සමාපජ්ජි. පඨවි තථෙව කම්පි. තස්මිම්පි මහින්දං නාම දෙවපුත්තං ආරක්ඛං ගණ්හනත්ථාය[13] ඨපෙසි. තතො වුට්ඨාය මහාගඞ්ගාය දක්ඛිණදිසාභාගෙ සෙරු නාම දහස්ස අන්තෙ වරාහ නාම සොණ්ඩිමත්ථකෙ අතිමනොරමං උදකබුබ්බුළකෙලාසකූටපටිභාගං චෙතියං පතිට්ඨහිස්සතී'ති පඤ්චසතඛීණාසවෙහි සද්ධිං නිරොධසමාපත්තිං සමාපජ්ජි. බහල-ඝනමහාපඨවී පරිබ්භමිතකුම්භකාරචක්කං විය පභින්නමදමහා හත්ථිනාගස්ස[14] කුඤ්චනාදකරණං විය උච්ඡුකොට්ටන[15] යන්ත-

1. සමාපජ්ජිත්වා – ජී. වි. කෙ.
2. විසාරූප – ජී. වි. විසාරූ – වි. විසාල – සි. ධා.
3. පුථුවිමාල – ජී.
4. ආරක්ඛනත්ථාය – ජී. වි. කෙ.
5. නිය්‍යාදෙත්වා – ජී. වි. කෙ.
6. භික්ඛුසඞ්ඝ සතෙහි – ජී. වි. කෙ.
7. ගාම චෙතියට්ඨානෙ – ජී. වි. කෙ.
8. සමාධිං – ජී. වි. කෙ.
9. ගන්ධ – ජී. වි. කෙ. මහාඝොස – සි. ධා.
* අයං පාඨො අධිකො විය ඤායතෙ.
10. මහාමෙඝං – ජී. වි. කෙ.
11. මණිකාර – ජී. නකා සමණිහාර – සි. ධා.
12. දෙවධීතා – ජී. වි. කෙ.
13. ආරක්ඛං – ජී. වි. කෙ.
14. නාගො – ජී. වි. කෙ.
15. කොට්ටින – ජී. වි. කෙ.

මුඛසඞ්ඛො විය [ච] සතවාරං සහස්සවාරං නදමානා සොමනස්සප්පත්තා විය සකලලඞ්කාදීපං උන්නාදං කුරුමානා සංකම්පි. තතො වුට්ඨාය සුමනනාගරඤ්ඤො හත්ථෙසු ඨිත[1]චම්පකරුක්ඛතො පුප්ඵානි[2] ආදාය තත්ථ පූජෙත්වා පුනප්පුනං තං ඔලොකෙසි. සො සත්ථාරං වන්දිත්වා මයා භන්තෙ කිං කාතබ්බන්ති පුච්ඡි. ඉමස්ස ඨානස්ස ආරක්ඛං කරොහීති ආහ. සො තං සුත්වා භන්තෙ තුම්හාකං ගන්ධකුටිං[3] මම ආරක්ඛං කරොන්තස්ස රූපසොභග්ගප්පත්තං අසීත්‍යනුබ්‍යඤ්ජනබ්‍යාමප්පභාද්වත්තිංසමහාපුරිසලක්ඛණවිචිත්තං දස්සනානුත්තරියභූතං පස්සන්තස්ස මනොසිලාතලෙ සීහනාදං නදන්තො තරුණසීහො විය ගජ්ජන්තො[4] පාවුස්සකමහාමෙඝො විය ආකාසගඞ්ගං ඔතාරෙන්තො විය රතනදාමං ගන්ථෙන්තො[5] විය ච අට්ඨඞ්ගසමන්නාගතං සවනීයසරං විස්සජ්ජෙත්වා[6] බ්‍රහ්මඝොසං නිච්ඡාරෙන්තො නානානයෙහි විචිත්තකථං කථයමානානං[7] සවනානුත්තරියභූතං සංසාරණ්ණවනිමුග්ගානං තාරණසමත්ථං මධුර ධම්මදෙසනං සුණන්තස්ස, ඤාණිද්ධියා කොටිප්පත්තා සාරිපුත්තමොග්ගල්ලානාදයො අසීතිමහාසාවකෙ පස්සන්තස්ස, තත්ථෙව මය්හං වසනං[8] රුච්චති. න සක්කොමි අඤ්ඤත්ථ තුම්හෙහි විනා වසිතුන්ති ආහ. භගවා තස්ස කථං සුත්වා නාගරාජ, ඉමං පදෙසං තයා චිරං වසිතට්ඨානං. කකුසන්ධස්ස භගවතො ධාතු ඉමස්මිංයෙව ඨානෙ පතිට්ඨිතා, ත්වමෙව තස්මිං කාලෙ වරනිඤ්ඤො නාම නාගරාජා හුත්වා තස්සා ධාතුයා ආරක්ඛං ගහෙත්වා ගන්ධමාලාදීහි පූජං කරොන්තො චිරං විහාසි. පුන කොණාගමනස්ස භගවතො ධාතු ඉමස්මිංයෙව ඨානෙ පතිට්ඨිතා ත්වමෙව තස්මිං කාලෙ ජයසෙනො නාම දෙවපුත්තො හුත්වා තස්සා ධාතුයා ආරක්ඛං ගහෙත්වා ගන්ධමාලාදීහි පූජං කත්වා තත්ථෙව චිරං විහාසි. පුන කස්සපස්ස භගවතො ධාතු ඉමස්මිංයෙව ඨානෙ පතිට්ඨිතා. ත්වමෙව තස්මිං කාලෙ දීඝසාලො නාම නාගරාජා හුත්වා තාය ධාතුයා ආරක්ඛං ගහෙත්වා ගන්ධමාලාදීහි පූජං කරොන්තො විහාසි. මයි පන පරිනිබ්බුතෙ කාකවණ්ණතිස්සමහාරාජා මය්හං නලාටධාතුං

1. හත්ථෙ පුප්ඵිත – පී. වී. කො.
2. පුප්ඵං – පී. වී. කො.
3. ගන්ධකුටියං – පී. වී. කො.
4. විජම්භිත්වා ගජ්ජන්තො – පී. වී. කො.
5. ගන්ථෙන්තො – වී. කො.
6. විස්සජ්ජිත්වා – පී. වී. කො.
7. කථයමානං – පී. වී. කො.
8. වචනං – පී. වී. කො.

ඉමස්මිංයෙව ඨානෙ පතිට්ඨාපෙස්සති[1], තස්මා ත්වං ඉමස්ස ඨානස්ස ආරක්ඛං කරොහීති වත්වා පඤ්චසීලෙසු පතිට්ඨාපෙත්වා පඤ්චසතඛීණාසවෙහි සද්ධිං චෙතියට්ඨානං පදක්ඛිණං කත්වා ත්වං අප්පමත්තො හොහීති වත්වා ආකාසං උප්පතිත්වා ජෙතවනමෙව ගතො.

තස්ස පන නාගරඤ්ඤො මාතා ඉන්දමානවිකා නාම[2] ආගන්ත්වා තථාගතං වන්දිත්වා එකමන්තං[3] ඨිතා, භන්තෙ මම පුත්තො සුමනො නාම නාගරාජා කුහින්ති ආහ. තව පුත්තො තම්බපණ්ණිදීපෙ මහාවාලුකගඞ්ගාය[4] දක්ඛිණභාගෙ සෙරු නාම දහස්ස සමීපෙ වරාහ නාම සොණ්ඩියං සමාධි අප්පිතත්තා අත්තනො පරිවාරෙ ඡකොටිමත්තෙ නාගෙ ගහෙත්වා ආරක්ඛං ගණ්හීති ආහ. සා ඉන්දමානවිකා තං සුත්වා සපරිවාරා තා සොළසසහස්ස නාගකඤ්ඤායො ගහෙත්වා සත්ථාරං වන්දිත්වා භන්තෙ ඉතො පට්ඨාය තුම්හාකං දස්සනං දුල්ලභං, ඛමථ මෙති අච්චයං දෙසෙත්වා[5] මහන්තිං[6] නාගසම්පත්තිං ගහෙත්වා පුත්තස්ස සුමනනාගරාජස්ස සන්තිකං ගන්ත්වා මහන්තිං ඉස්සරියසම්පත්තිං අනුභවන්තී තත්ථෙව ආරක්ඛං ගහෙත්වා චිරං විහාසි.

මහාපඤ්ඤො මහාසද්ධො මහාවීරො මහාඉසි
මහාබලෙන සම්පන්නො මහන්තගුණභූසිතො.

ගන්ත්වාන තම්බපණ්ණිං සො සත්තානුද්දයමානසො
ගන්ත්වා නාගවරං දීපං අගා ජෙතවනං විදූ.

අතිසයමතිසාරො සාරදානං කරොන්තො
අතිඅධිරමණීයො සබ්බලොකෙකනෙත්තො
අතිගුණධරණීයො සබ්බස[illegible] තමග්ගං
අතිවිපුලදයො තානෙතුමාගා සුදීපං.*

තතියගමනකථා සමත්තා.

ඉති අරියජනපසාදනත්ථාය කතෙ ධාතුවංසෙ තථාගතස්ස ගමනං නාම

## පඨමො පරිච්ඡෙදො.

1. පතිට්ඨහිස්සති – ජී. වි කො.
2. නාමනාගකඤ්ඤා – ජී. වි. කො.
3. එකමන්තෙ – ජී. වි කො.
4. මහාගඞ්ගාය – ජී. කො.
5. දස්සෙත්වා – ජී. වි. කො
6. මහන්තං – ජී. වි. කො.

* "මහාපඤ්ඤො මහාවීරො මහෙසී මුනිසත්තමො
මහාබලෙහි සම්පන්නො මහාධීරගුණෙ ඨිතො

ආගන්ත්වා තම්බපණ්ණිං සො සත්තානුද්දයමානසො
පුන ගන්ත්වා නාගදීපං අගා ජෙතවනං වරං

අතිසයමතිසාරො සාරදනෙක රතනො
අතිධිතිරමණීයො සබ්බලොකෙකනෙත්තො
අතිගුණරමණීයං සබ්බසත්තෙකමග්ගං
අතිවිපුලදයත්තා ලඞ්කමාගා සුදීපං".

ඉති සීහළභාසාය කතෙ ධාතුවංසෙ දිස්සතෙ.

## 2. පරිනිබ්බානකථා

සත්ථා පන තතො පඤ්චචත්තාලීසවස්සානි තිපිටකපරියත්තිධම්මං දෙසෙත්වා වෙනෙය්‍යජනෙ සංසාරතො චතුඅරියමග්ගඵලපටිලාභවසෙන උද්ධරෙත්වා නිබ්බානෙ පතිට්ඨාපෙත්වා පච්ඡිමෙ කාලෙ වෙසාලිනගරං උපනිස්සාය චාපාලචෙතියං නිස්සාය විහරන්තො මාරෙන පරිනිබ්බානත්ථාය ආරාධිතො සතො සම්පජානො ආයුසඞ්ඛාරෙ විස්සජ්ජෙසි. තස්ස විස්සට්ඨභාවං ආනන්දොයෙව අඤ්ඤාසි. අඤ්ඤො කොචි පි ජානන්තො නාම නත්ථි. තස්මා භික්ඛුසඞ්ඝම්පි ජානාපෙස්සාමීති ජෙතවනමහාවිහාරං ගන්ත්වා සබ්බං භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛවෙ තථාගතස්ස[1] න චිරස්සෙව තිණ්ණං මාසානං අච්චයෙන පරිනිබ්බානං භවිස්සති, තුම්හෙ සත්තතිංසබොධිපක්ඛියධම්මෙසු සමග්ගා හුත්වා එකිභාවා[2] හොථ, තුම්හෙ විවාදං මා කරොථ. අප්පමාදෙන තිස්සො සික්ඛා සම්පාදෙථාති වත්වා පුන දිවසෙ වෙසාලියං පිණ්ඩාය චරිත්වා පිණ්ඩපාතා[3] පටික්කමිත්වා[4] භණ්ඩගාමං ගතො. භණ්ඩගාමතො හත්ථිගාමං හත්ථිගාමතො අම්බගාමං අම්බගාමතො ජම්බුගාමං ජම්බුගාමතො නිග්‍රොධගාමං නිග්‍රොධගාමතො භොගනගරං භොගනගරතො පාවානගරං පාවානගරතො කුසිනාරානගරං පත්තො. තත්ථ යමකසාලානමන්තරෙ ඨිතො ආනන්දත්ථෙරං ආමන්තෙත්වා උත්තරසීසකං කත්වා මඤ්චකං පඤ්ඤපෙහි කිලන්තොස්මි ආනන්ද නිපජ්ජිස්සාමී'ති ආහ. තං සුත්වා ආනන්දත්ථෙරො උත්තරසීසකං කත්වා මඤ්චකං පඤ්ඤපෙත්වා චතුග්ගුණං සඞ්ඝාටිං අත්ථරිත්වා පඤ්චචත්තාලීසවස්සානි අසයිතබුද්ධසෙය්‍යං සයන්තො දක්ඛිණපස්සෙන සතො සම්පජානො අනුට්ඨානසඤ්ඤං මනසිකරිත්වා සීහසෙය්‍යං කප්පෙසි.

අතීතමද්ධාන භවෙ චරන්තො
අනන්තසත්තෙ කරුණායුපෙතො[5]
කත්වාන පුඤ්ඤානි අනප්පකානි
පත්තො සිවං ලොකහිතාය නාථො.

---

1. තථාගතෙ – ජී. වී. කෙ.
2. එකභාවා – ජී. වී. එකභාගා – කෙ.
3. පිණ්ඩපාතං – ජී. වී. කෙ.
4 පටික්කමෙත්වා – ජී. වී. කෙ.
5. කරුණාය යුත්තො – ජී. වී. කෙ.

එවං හි සො දසබලොපි විහීනථාමො
යමකස්ස සාලාන[1] නිපජ්ජි මජ්ඣෙ
කත්වාන සඤ්ඤං හි[2] අනුට්ඨහානං[3]
ස ඉද්ධිමා[4] මාරමුඛං පවිට්ඨො.

තස්මිං ඛණෙ යමකසාලා සුපුප්ඵිතා අහෙසුං. න කෙවලං යමකසාලායෙව සුපුප්ඵිතා, අථ ඛො දසසහස්සී ලොකධාතු චක්කවාළෙසු සාලරුක්ඛාපි පුප්ඵිතා. න සාලරුක්ඛායෙව සුපුප්ඵිතා, අථ ඛො යං කිඤ්චි පුප්ඵූපගඵලූපග රුක්ඛජාතං සබ්බම්පි පුප්ඵඤ්ච ඵලඤ්ච ගණ්හි. ජලෙසු ජලපදුමානි ථලෙසු ථලපදුමානි ඛන්ධෙසු ඛන්ධපදුමානි සාඛාසු සාඛාපදුමානි ලතාසු ලතාපදුමානි ආකාසෙ ඔලම්බපදුමානි පිට්ඨිපාසාණෙ භින්දිත්වා සතපත්තපදුමානි සුපුප්ඵිතානි අහෙසුං. පඨවිතො යාව බ්‍රහ්මලොකා තාව දසසහස්සී චක්කවාළා එකමාලාගුණා විය අහෙසුං. දෙවා ආකාසතො දිබ්බමන්දාරවපාරිච්ඡත්තකකොවිළාරපුප්ඵානි ච චන්දනචුණ්ණානි ච සමාකිරන්ති. දිබ්බතුරියසඞ්ගීතියො ච අන්තලික්ඛෙ පවත්තන්ති. අනෙකානි අච්ඡරියසහස්සානි අහෙසුං. එවං පූජාවිසෙසෙ පවත්තමානෙ පඨමයාමෙ සුභද්දපරිබ්බාජකං විනෙත්වා මජ්ඣිමයාමෙ දසසහස්සී ලොකධාතු දෙවතානං අනුසාසිත්වා[5] පච්ඡිමයාමාවසානෙ පඨමජ්ඣානං සමාපජ්ජිත්වා . තතො වුට්ඨාය දුතියජ්ඣානං තතියජ්ඣානං චතුත්ථජ්ඣානං සමාපජ්ජි. තතො වුට්ඨාය ආකාසානඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජිත්වා තතො වුට්ඨාය නිරොධසමාපත්තිං සමාපජ්ජි. තතො වුට්ඨාය පඨමජ්ඣානං දුතියජ්ඣානං තතියජ්ඣානං චතුත්ථජ්ඣානඤ්ච සමාපජ්ජි. තතො වුට්ඨාය එත්ථන්තරතො අනුපාදිසෙසනිබ්බානධාතුයා පරිනිබ්බායි.

මහාමොහතමං හන්ත්වා[6] සත්තානං හදයස්සිතං[7]
රවීව ජොතමානො[8] සො ලොකස්ස අනුකම්පකො,

---

1. යමකසාලාය – පී. වි. කෙ.
2. පස්සානි – පී. වි. පදස්සානි – කෙ.
3. අනුට්ඨහානි – පී. වි. කෙ.
4. සයිද්ධියා – පී. ස ඉද්ධියා – කෙ.
5. අනුසාසෙත්වා – පී. වි. කෙ.
6. මහාමොහතමොනද්ධං – පී. වි. කෙ.
7. හදයනිස්සිතං – පී. වි. කෙ, සිං. ධා.
8. රවිපජ්ජොතමානො – පී. වි. කෙ.
රවිවජ්ජොතමානො – සිං. ධා.

වස්සානි පඤ්චතාලීසං කත්වා සත්තහිතං බහුං
අධුනා[1] අග්ගික්ඛන්ධොව පරිනිබ්බායි සො ජිනො.

එවං පන භගවති පරිනිබ්බුතෙ විස්සකම්මදෙවපුත්තො තථාගතස්ස සරීරප්පමාණං වරදොණිං රතනෙහි[2] මාපෙත්වා විසුද්ධකප්පාසෙහි තථාගතස්ස සරීරං වෙඨෙත්වා රතනදොණියං[3] පක්ඛිපිත්වා ගන්ධතෙලෙහි පූරෙත්වා[4] අපරාය දොණියා පිදහිත්වා සබ්බගන්ධදරුචිතකං කත්වා යෙභුය්‍යෙන දෙවතායො ලොහිතචන්දනසටිකායො ආදය චිතකායං පක්ඛිපිත්වා අග්ගිං ගාහාපෙතුං නාසක්ඛිංසු. කස්මා? මහාකස්සපත්ථෙරස්ස අනාගතත්තා. සො ආයස්මා මහාකස්සපත්ථෙරො යෙභුය්‍යෙන බහුන්නං[5] දෙවානං පියො මනාපො. ථෙරස්ස හි දනං දත්වා සග්ගෙ නිබ්බත්තානං පමාණො නාම නත්ථි. තස්මා දෙවතා තස්මිං සමාගමෙ අත්තනො කුලූපගත්ථෙරං[6] අදිස්වා අම්හාකං මහාකස්සපත්ථෙරො කුහින්ති ඔලොකෙන්තා අත්තනො පරිවාරෙහි පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සද්ධිං මග්ගං පටිපන්නොති ඤත්වා යාව ථෙරො ඉමස්මිං න සම්පත්තො චිතකං තාව න පජ්ජලතූති අධිට්ඨහිංසු. තස්මිං කාලෙ ථෙරො යෙභුය්‍යෙන තෙරසධුතඞ්ගධරෙහි පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සද්ධිං ආගන්ත්වා චිතකං තික්ඛත්තුං පදක්ඛිණං කත්වා පාදපස්සෙ ඨිතො, භන්තෙ තුම්හාකං දස්සනත්ථාය ඉතො කප්පසතසහස්සමත්ථකෙ පදුමුත්තරසත්ථුනො පාදමූලෙ අභිනීහාරතො පට්ඨාය අවිජහිත්වා ආගතො. ඉදානි මෙ අවසානදස්සනන්ති පාදෙ ගහෙත්වා වන්දිතුං අධිට්ඨාසි.

මහාකස්සපථෙරො සො භික්ඛුසඞ්ඝපුරක්ඛතො
එකංසං චීවරං කත්වා පග්ගහෙත්වාන අඤ්ජලිං.

පදක්ඛිණඤ්ච තික්ඛත්තුං කත්වා ඨත්වා පදන්තිකෙ[7]
පතිට්ඨහන්තු සීසෙ මෙ ජිනපාදෙත්[8]'ධිට්ඨහි.

සහාධිට්ඨානං චිතකා දුස්සානි ච විභිජ්ජිය
නික්ඛමිංසු තද පාද ඝනමුත්තොව චන්දිමා.

උභො හත්ථෙහි පග්ගය්හ ඨපෙත්වා අත්තනො සිරෙ[9]
වන්දිත්වා[10] සත්ථුනො පාදෙ ඨපාපෙත්වා විසජ්ජයි.

---

1. අඩුනා – සිං.ධා.
2. සුවණ්ණෙහි ? (රන්දෙණක් මවා–සිං. ධා.)
3. සුවණ්ණදොණියං – ? (රන්දෙණ–සිං. ධා)
4. පූරාපෙත්වා – ජී.වි.කො.
5. බහූනං – ජී.වි.කො.
6. කුලූපකත්ථෙරං - කො.
7. පදන්තිකං - ජී.වි.කො.
8. ජිනපාදන්ති - ජී.වි. කො.
9. සීසෙ - ජී.වි.කො.
10. අවන්දිය - ජී.වි.කො.

පුණ්ණචන්දෙ යථා අග්ගිං චිතකං පාවිසී තද
ඉදං අච්ඡෙරකං දිස්වා රවං රවි මහාජනො.

උට්ඨහිත්වාන පාචීනා චන්දෙ අත්ථඞ්ගතො යථා
පාදෙ අන්තරධායන්තෙ අරොදිංසු මහාජනා.

තද මල්ලරාජානො භගවතො සරීරකිච්චං කරිස්සාමාති වත්වා නානාවත්ථාභරණානි නිවාසෙත්වා පරිවාරයිංසු. තතො රාජානො මනුස්සා ච අග්ගිං දතුං ආරභිංසු. තද සක්කො: මයි පන පරිනිබ්බුතෙ සක්කො දෙවරාජා මණිජොතිරසං පසාරෙත්වා නික්ඛන්තඅග්ගිනා මම සරීරකිච්චං කරිස්සති. මණිඅග්ගිනො අවසානෙ මනුස්සා අග්ගිං කරිස්සන්තීති. එවං බුද්ධවචනං පරිභාවෙත්වා[1] තික්ඛත්තුං පදක්ඛිණං කත්වා භගවතො සරීරකිච්චං කත්වා සමන්තතො උට්ඨහතූති අධිට්ඨහි.

තස්මිං ඛණෙ සයමෙව චිතකං අග්ගි ගණ්හි. සරීරං පන භගවතො ඣායමානං ඡවිචම්මමංසන්හාරුඅට්ඨිඅට්ඨිමිඤ්ජං අසෙසෙත්වා සුමනමකුළමුත්තාරාසිසදිසමෙව ධාතුයො අවසෙසා අහෙසුං.

පරිනිබ්බුතකාලෙපි සකලං කලුනං අහු
පරිදෙවො මහා ආසි මහී උද්‍රියනං යථා.

දෙවතායානුභාවෙන සජ්ජිතො චිතකො සයං
තතො එකප්පහාරෙන පජ්ජලිත්වා සමන්තතො.

යඤ්ච අබ්භන්තරං දුස්සං යං දුස්සං සබ්බබාහිරං[2]
දුස්ස ද්වෙව න ඣායිංසු තෙසං දුස්සානමන්තරෙ.

යථා නිරුද්ධතෙලස්ස න මසී න ච ඡාරිකා[3]
එවමස්ස න දිස්සති බුද්ධගත්තස්ස ඣායතො.

සුමනමකුළසභාවා[4] ච ධොතමුත්තාහමෙව ච
සුවණ්ණවණ්ණසංකාසා අවසිස්සිංසු ධාතුයො.

දාඨා චතස්සො උණ්හීසං අක්ඛකා ද්වෙ ච සත්තිමා[5]
න විකිණ්ණා තතො සෙසා විප්පකිණ්ණාව ධාතුයො.

අහොසි තනුකා ධාතු සාසපබීජමත්තකා[6]
ධාතුයො මජ්ඣිමා මජ්ඣභින්නතණ්ඩුලමත්තිකා.

---

1. පරිසාමෙත්වා – කෙ. පරිසාවෙත්වා – පී.වී.
2. දුස්සං යං සබ්බථා බාහිරං – කෙ.
3. යා ඡාරිකා – වී.
4. සභාවො – පී.වී.කෙ.
5. සතනමා – පී.වී.කෙ.
6. මත්තකා – පී.වී.කෙ.

ධාතුයො මහතී මජ්ඣා භින්නමුග්ගප්පමාණකා[1]
ධාතුවණ්ණා තයො ආසුං බුද්ධාධිට්ඨානතෙජසා.

සාරිපුත්තස්ස ථෙරස්ස සිස්සො සරභූනාමකො
ආදාය ජිනගීවට්ඨිං චිතකාතොව ධාතු සො.

සද්ධිං සිස්සසහස්සෙන චෙතියෙ මහියඞ්ගණෙ
ඨපෙත්වා චෙතියං කත්වා කුසිනාරමගා මුනි.

ඡළභිඤ්ඤො වසිප්පත්තො ඛෙමො කාරුණිකො මුනි
සහසා චිතකාතොව[2] වාමදාඨං සමග්ගහී.

ආකාසතො පතිත්වාපි නික්ඛමිත්වාපි සාලතො
සමන්තතොම්බුමුග්ගන්ත්වා[3] නිබ්බාපෙසුං[4] ජලානලං.[5]

මල්ලරාජගණා සබ්බෙ සබ්බගන්ධොදකෙන තං
චිතකං ලොකනාථස්ස නිබ්බාපෙසුං මහෙසිනො.

එවං පන සබ්බලොකෙ[6] කරුණාධිකො සම්මාසම්බුද්ධො වෙසාඛපුණ්ණමුපොසථෙ අඞ්ගාරදිවසෙ පරිනිබ්බුතො. දෙවමනුස්සානං සඞ්ගහකරණත්ථාය යමකසාලානමන්තරෙ චිතකං සත්තරත්තින්දිවං[7] වසි. තතො වීසං හත්ථසතිකස්ස[8] උපරි සත්තරත්තින්දිවං වසි. යාව අග්ගිපරිනිබ්බාපනං සත්තරත්තින්දිවං හොති.

තතො සත්තදිවසානි කුසිනාරායං මල්ලරාජපුත්තෙසු ගන්ධොදකෙන චිතකං නිබ්බාපයමානෙසු සාලරුක්ඛතො උදකධාරා නික්ඛමිත්වා චිතකං නිබ්බාපයිංසු. තතො දසබලස්ස ධාතුයො සුවණ්ණචඞ්ගොටකෙ පක්ඛිපිත්වා අත්තනො නගරෙ සන්ථාගාරෙ ඨපෙත්වා සත්තිපඤ්ජරං කත්වා ධනුපාකාරෙහි පරික්ඛිපාපෙත්වා සත්තාහං නච්චගීතවාදිතගන්ධමාලාදීහි මල්ලරාජපුත්තා සක්කාරං කරිංසු.

තතො තෙ මල්ලරාජානො රම්මං දෙවසභොපමං
සබ්බත්ථ මණ්ඩයිත්වාන සන්ථාගාරං තතො පන,

---

1. භින්නමුග්ගප්පමාණකා - කො.
2. චිතකතොව - ජී.වි.කො.
3. සාමන්තතුම්බමුග්ගන්ත්වා - ජී.වි.කො.
4. හරාපෙසුං - ජී.වි.කො.
5. ජලාජලං - ජී.වි.කො.
6. සබ්බලොකං - ජී.වි.කො.
7. සත්තරත්තිවන්දිසං - ජී.වි.කො.
8. වීසතිහත්ථසතිකස්ස - ජී.වි.කො.

මඟ්ගං අලඞ්කරිත්වාන යාව මකුටචෙතියා
හත්ථික්ඛන්ධෙ ඨපෙත්වාන හෙමදොණිං සධාතුකං.

ගන්ධාදීහිපි පූජෙත්වා කීළන්තා සාධුකීළිතං
පවෙසෙත්වාන නගරං සන්ථාගාරෙ මනොරමෙ.

දසහුමසම්ං[1] පල්ලඞ්කෙ ඨපෙත්වා ජිනධාතුයො
උස්සයුං[2] තෙ තදා ජනතා සන්ථාගාරසමන්තතො.

හත්ථීහි පරික්ඛිපාපෙසුං තතො අස්සෙ තතො රථෙ
අක්ඛොහිණි'ක්ඛොහිණිං පරිවාරෙත්වා[3] තතො යොධෙ තතො ධනු.

ඉති පරික්ඛිපාපෙසුං සමන්තා යොජනං කමා[4]
තදා නච්චෙහි ගීතෙහි වාදිතෙහි ච පූජයුං.]

පරිනිබ්බානකථා සමත්තා.

තතො භගවතො පරිනිබ්බුතභාවං සුත්වා අජාතසත්තු මහාරාජා කොසිනාරකානං[5] මල්ලානං සාසනං පෙසෙසි. අහම්පි ඛත්තියො භගවාපි ඛත්තියො සත්ථුනො සරීරධාතූනං ථූපඤ්ච මහඤ්ච කරොමීති. තෙනෙව උපායෙන වෙසාලියං ලිච්ඡවිරාජානො ච කපිලවත්ථුම්හි සක්‍යරාජානො ච අල්ලකප්පකෙ බුලයො[6] ච රාමගාමකෙ කොළියා ච වෙඨදීපකෙ[7] බ්‍රාහ්මණො ච පාවායං පාවෙය්‍යකා ච සාසනං පෙසෙත්වා සබ්බෙ එකතො හුත්වා කොසිනාරකෙහි සද්ධිං විවාදං උප්පාදෙසුං. තෙසං පන ආචරියො දොණබ්‍රාහ්මණො නාම. සො තෙසං: මා භොන්තො විග්ගහවිවාදං කරොථ, අම්හාකං භගවා ඛන්තිවාදීයෙවාති වත්වා තාදිසස්ස ච ඛන්තිමෙත්තානුද්දයසම්පන්නස්ස සරීරභාගෙ[8] කලහං කාතුං අයුත්තන්ති ආහ.

[රාජා අජාතසත්තු ච ලිච්ඡවී ච නරාධිපා
සක්‍යා ච අල්ලකප්පා ච කොළියාපි[9] ච රාමකෙ,

බ්‍රාහ්මණො වෙඨදීපො[10] ච මල්ලපාවෙය්‍යකාපි ච
මල්ලා ච ධාතු අත්ථාය[11] අක්ඛොහිණිමක්ඛොහිණිං විවාදයුං.

---

1. දසහුමස්ස – ජී.වි.කො.
2. දසෙසසුං – ජී.වි.කො.
3. අක්ඛොහිණිමක්ඛොහිණිං පරිවාරිකො – ජී.වි.කො.
4. අහු – ජී.වි.කො.
5. කුසිනාරකානං – ජී.වි.කො.
6. වුලියො – ජී.වි.කො.
7. වෙත්තදීපකෙ – ජී.වි.කො.
8. සරීරභාවෙ – ජී.වි.කො.
9. කොලිරාජා – ජී.වි.කො.
10. වෙත්තදීපො – ජී.වි.කො.
11. ධාතුසසත්ථාය – ජී.වි.කො.

එවං සන්තෙ තද දෙණො බ්‍රාහ්මණො එතදබ්‍රවි:
සුණන්තු භොන්තො මෙ වාචං හිතමත්ථූපසංහිතං.[1]

ඛන්තිවාදී ඉසිකාලෙ ධම්මපාලකුමාරකෙ
ඡද්දන්තො භූරිදත්තො ච චම්පෙය්‍යො සඞ්ඛපාලකෙ,

මහාකපිජාතකාලෙ අම්හාකං ලොකනායකො
කොපං අකත්වා අඤ්ඤෙසු ඛන්තිමෙව[2] අකා ජිනො.

සිට්ඨාසිට්ඨෙ සුඛෙ දුක්ඛෙ[3] ලාභාලාභෙ යසායසෙ
තාදී[4] ලක්ඛණසම්පන්නො ඛන්තිවාදෙසු කා කථා.

එවං භවතං[5] විවාදෙ සම්පහාරො න සාධුකො
සබ්බෙව සහිතා හොථ සමග්ගා මොදමානකා.[6]

තථාගතස්ස සාරීරං[7] අට්ඨභාගං කරොමසෙ
ථූපා විත්ථාරිතා හොන්තු පසන්නා හි බහුජ්ජනා.

තෙන හි විභජෙහි[8] ත්වං අට්ඨභාගන්තු බ්‍රාහ්මණ
ථූපා විත්ථාරිතා හොන්තු[9] පසන්නා හි බහුජ්ජනා.[10]

එවං වුත්තෙ තද දෙණො බ්‍රාහ්මණො ගණජෙට්ඨකො
සුවණ්ණං නාළිං කත්වාන සමං භාජෙසි රාජුනං.

සොළසනාළියො ආසුං සබ්බා තා සෙසධාතුයො
එකෙකපුරවාසීනං දෙව දෙව දෙණො අද තද.

ධාතුයො ච ගහෙත්වාන හට්ඨතුට්ඨා නරාධිපා
ගන්ත්වා සකෙ සකෙ රට්ඨෙ චෙතියානි අකාරයුං.

දෙණො තුම්බං ගහෙත්වාන කාරෙසි තුම්බචෙතියං
අඞ්ගාරථූපං කාරෙසුං මොරියා හට්ඨමානසා.

එකා දඨා තිදසපුරෙ එකා නාගපූරෙ අහු
එකා ගන්ධාරවිසයෙ එකා කාලිඞ්ගරාජිනො.][a]

1. හිතමත්තුපසඤ්හිතං – ජී.වී., හිතමත්ථූපසඤ්හිතං – කො.
2. ඛන්තියෙව – ජී.වී:කො.
3. ඉට්ඨානිට්ඨමනිට්ඨෙපි – ජී.වී.කො.
4. තාදිසානි – ජී.වී.කො.
5. භවිසං – ජී.වී.කො.
6. මොදමානසා – ජී.වීකො.
7. සරීරං – ජී.වී.කො.
8. විභජ්ජෙහි – ජී.වී.කො.
9. ආසි – ජී.වී.කො.
10. බහූ ජනා - ජී.වී.කො.
a. බුද්ධවංස

තත්‍ථ දෙණොති: තද ගණාචරියො. සො ධාතුයො[1] විභජන්තො[2] එකං දක්ඛිණදාඨාධාතුං ගහෙත්වා වෙඨනන්තරෙ ඨපෙසි. තද සක්කො අජ්ජ දක්ඛිණදාඨාධාතුං නො ලභන්තීති චින්තෙත්වා වෙඨනන්තරෙ පස්සි. සො රතනචඞ්ගොටකං ගහෙත්වා අදිස්සමානකායෙන ගන්ත්වා ධාතුං ගහෙත්වා තාවතිංසභවනෙ චූළාමණිචෙතියෙ එකයොජනුබ්බෙධං යෙව මහන්තං ථූපං කත්වා ඨපෙසි. එකං දක්ඛිණදාඨාධාතුං පාදගණ්ඨන්තරෙ අක්කමිත්වා ගණ්හි.

**එත්තාවතා තාවතිංසභවනදන්තධාතුකථා පරිපුණ්ණා වෙදිතබ්බා.**

තද ජයසෙනො නාම නාගරාජා භගවතො පරිනිබ්බුතභාවං සුත්වා අජ්ජ පච්ඡිමදස්සනං පස්සිස්සාමීති[3] මහන්තං නාගරාජසම්පත්තිං ගහෙත්වා කුසිනාරං ගන්ත්වා මහාපූජං කත්වා එකමන්තං ඨත්වා පාදගණ්ඨන්තරෙ ඨිතං ධාතුං දිස්වා නාගඉද්ධිබලෙන ගහෙත්වා නාගභවනං නෙත්වා නාගපුරස්ස මජ්ඣෙ රතනඛචිතෙ චෙතියෙ ඨපෙසි. තං තම්බපණ්ණියං කාකවණ්ණතිස්සරාජකාලෙ මහාදෙවත්ථෙරස්ස සිස්සො මහින්දත්ථෙරො නාම නාගභවනං ගන්ත්වා දක්ඛිණදාඨං ගහෙත්වා තම්බපණ්ණියං සෙරුනගරං හරිත්වා[4] ගිරිඅභයස්ස සෙරුනගරපබ්බතන්තරෙ චෙතියං කාරාපෙත්වා ඨපෙසි.

**එත්තාවතා නාගභවනදන්තධාතුකථා පරිපුණ්ණා වෙදිතබ්බා.**

තත්‍රායං ගන්ධාරවාසිනොති: එකා වාමදාඨා දෙණො නාම ආචරියො නිවත්ථ[5]වත්ථන්තරෙ ඨපෙත්වා ගණ්හි. තද එකො ගන්ධාරවාසී පුබ්බෙ ලද්ධබ්‍යාකරණො කතාභිනීහාරො වත්ථන්තරෙ ඨපිතදන්තධාතුං දිස්වා කුසලචිත්තෙන තතො දන්තධාතුං ගහෙත්වා ගන්ධාරවාසිකෙහි සද්ධිං අත්තනො රට්ඨං ගන්ත්වා චෙතියවනෙ ඨපෙසි.

**එත්තාවතා වාමදන්තධාතුකථා පරිපුණ්ණා වෙදිතබ්බා.**

තත්‍ථ අධො වාමදන්තධාතුං සාරිපුත්තත්ථෙරස්ස සිස්සො ඛෙමො නාම මුනි ජාලචිතකතොව උප්පතිත්වා වාමදාඨං ගහෙත්වා කාලිඞ්ගපුරං නෙත්වා බ්‍රහ්මදත්තස්ස රඤ්ඤො සමීපං

1. ධාතු – ජී.වී.කො.
2. විභජ්ජන්තො – ජී.කො.
3. පස්සිස්සාමාති – ජී.වී.කො.
4. පරිහරිත්වා – ජී.වී.කො.
5. නිවාස – ජී.වී.කො.

a. බුද්ධවංශ

ගන්ත්වා[1] දන්තධාතුං දස්සෙත්වා: මහාරාජ වාමදන්තධාතුං භගවා තමෙව ඉමස්මිං ජම්බුදීපෙ යාව ගුහසීවපරම්පරා දෙව-මනුස්සානං අත්ථං කරිත්වා පරියොසානෙ ගුහසීවරඤ්ඤො පාහෙස්සතීති [නියාදෙතුං] ආහාති නීයාදෙසි.

අපරභාගෙ හෙමමාලා රාජකඤ්ඤා දන්තකුමාරෙන සද්ධිං* බ්‍රාහ්මණවෙසං ගහෙත්වා[2] දන්තධාතුං ආදය පලායිත්වා වාණිජෙ ආරොචෙත්වා[3] නාවා චෙගෙන ගන්ත්වා චෙව නාගසුපණ්ණෙහි මහන්තං පූජං කාරෙත්වා අනුක්කමෙනාගන්ත්වා ජම්බුකොළ-පට්ටනං පත්වා දිජවරස්ස ආචික්ඛිතමග්ගෙන අනුරාධපුරං පත්වා කිත්තිසිරිමෙඝස්ස පවත්තිං පුච්ඡිත්වා නවවස්ස-ආයුසමානො තීසු සරණෙසු පසන්නභාවං ඤත්වා මෙඝගිරි[1]-මහාථෙරස්ස සන්තිකං ගන්ත්වා වන්දිත්වා එකමන්තං නිසීදිත්වා දන්තධාතුං ජම්බුදීපතො ගහෙත්වා ආගතභාවං ආරොචෙත්වා දස්සෙසි. දිස්වා[5] ච පන පීතියා ඵුටො[6] උභින්නම්පි සඞ්ගහං කත්වා මහාවිහාරං අලඞ්කාරෙත්වා ජිනදන්තධාතුං ඨපෙත්වා එකං භික්ඛුං පෙසෙත්වා තං පවත්තිං රඤ්ඤො ආරොචාපෙසි. තං සුත්වා රාජා පීතිපාමොජ්ජො චක්කවත්තිස්ස සිරිසම්පත්තො දළිද්දො විය තස්ස පාටිහාරියං දිස්වා විමංසිත්වා නික්කඞ්ඛො හුත්වා සකලලඞ්කාදීපෙන පූජෙසි. එතෙන නයෙන පූජං කත්වා එකදිවසෙනෙව නවලක්ඛං පූජෙසි.

සීහළින්දො උභින්නම්පි බහූනි රතනානි ච
ගාමෙ ච ඉස්සරෙ චෙව දත්වාන සඞ්ගහං අකා.

**එත්තාවතා අධොදාඨාධාතුකථා පරිපුණ්ණා වෙදිතබ්බා.**

චත්තාලීස සමා දන්තා කෙසා ලොමා ච සබ්බසො
දෙවා හරිංසු එකෙකං චක්කවාළපරම්පරා. *a*

තත්‍ර වචනෙ, චත්තාලීස සමා දන්තාති: සෙසදන්තා[7] ච කෙසා ච ලොමා ච නඛා ච සබ්බසොපි මයි පරිනිබ්බුත-

---

1. උපසඞ්කමිත්වා – ජී.වි. උපගන්ත්වා – කෙ.
2. කත්වා – ජී.වි.කෙ.
3. ආරොචාපෙත්වා – ජී.වි.කෙ.
4. සඞ්ඝරි – ජී.වි.කෙ.
5. දස්සෙත්වා – ජී.වි.කෙ.
6. පීතිපුට්ඨො ජී. වි. කෙ
7. සෙතදන්තා – ජී.වි.කෙ.

* එත්ථ ''තෙ ජයම්පතිකා උභො හෙට්ඨා වුත්තනයෙනෙව''ති පි අධිකො පාඨො දිස්සතෙ. ජිනකාලමාලියම්පි එවං දිස්සති.

a. බුද්ධවංස

කාලෙ මා ඣායන්තු[1] ලුඤ්චිත්වා ආකාසෙ පතිට්ඨන්තු[2] එකෙක-චක්කවාළඤ්ච එකෙකකෙසලොමනඛදන්තධාතුපරම්පරා නෙත්වා චෙතියං කාරෙත්වාන දෙවමනුස්සානං අත්ථං කරොන්තූති[3] අධිට්ඨාසි. තස්මා පරිනිබ්බුතකාලතො යාව සරීරං න ඣායති තාව ඡබ්බණ්ණරස්මියො ලොමධාතු න පජහති. දොණ-බ්‍රාහ්මණොපි ධාතුවිභජනාවසානෙ වෙණන්තරෙ ච නිවාස-නන්තරෙ ච පාදඝනන්තරෙ ච ධාතූනං විනට්ඨභාවං[4] ඤත්වා පථවියං උත්තානකොයෙව ජාතො. තදා සක්කො දෙවරාජා දිස්වා අයං දොණාචරියො ධාතු අත්ථාය අනුපරිවත්තෙත්වා විනාසං පාපුණෙය්‍ය[5] අහං වීණාචරියවෙසං ගහෙත්වා[6] තස්ස සන්තිකං ගන්ත්වා සොකං විනොදෙස්සාමීති සක්කරූපං ජහිත්වා වීණාචරියවෙසං ගහෙත්වා තස්ස සන්තිකං ගන්ත්වා[7] එකමන්තං ඨිතො දිබ්බගීතං ගායිත්වා වීණං වාදෙන්තො නානප්පකාරං උදනෙසි. යං ධම්මමෙතං[8] පුරිසස්ස වාදං ජින්දිස්සාමීති වත්වා කථාය සොතුනං[9] ලොභං පරස්ස අත්ථං විනාසෙත්වා අති-ලොභෙන[10] පුරිසො පාපකො හොතීති. හංසරාජජාතකං[11] දීපෙත්වා යං ලද්ධං තං සුලද්ධන්ති ආහ. තං සුත්වා දොණො අයං වීණාචරියො මය්හං ථෙනභාවං අඤ්ඤාසීති සොකං විනොදෙත්වා උට්ඨාය ආවජ්ජමානො තුම්බං දිස්වා යෙන භගවතො සරීරධාතුයො මිතා[12] සොපි ධාතුගතිකොව ඉදං ථූපං කරිස්සාමීති චින්තෙත්වා තුම්බං ගහෙත්වාන චෙතියෙ ඨපෙසි. මොරියා අඞ්ගාරං ගහෙත්වා අඞ්ගාරචෙතියං නාම කාරෙසුං.

[නගරෙ කපිලවත්ථුම්හි සම්මාදිට්ඨි බහුජ්ජනො[13]
තත්ථ සාරීරිකං ථූපං අකාසි රතනාමයං.

1. දඩ්ඪාතු – ජී.වි.කො.
2. පතිට්ඨාතු – ජී.වි.කො.
3. කරොති – ජී.වි.කො.
4. විනස්සභාවං – ජී.වි.කො.
5. පාපුණියාති – ජී. පාපුණියාති – වි.කො.
6. කත්වා – ජී.වි.කො.
7. උපසඞ්කමිත්වා – ජී.වි.කො.
8. යංධම්මමෙතං – ජී.වි.කො.
9. කථනං සොතුං – ජීවි..කො.
10. අතිලොභො – ජී.වි.කො.
11. හංසරාජජාතකෙ – ජී.වි.කො.
12. මිනිතා – ජී.
13. බහු ජනො – ජී.වි.කො.

නගරෙ අල්ලකෙ රඤ්ඤො බුද්ධධාතු පතිට්ඨිය
සිලාය මුග්ගවණ්ණාය ථූපං සධාතුකං අකා.

ජනො පාවෙය්‍යරට්ඨස්මිං[1] පතිට්ඨිය සාරීරිකං
සිලාය මණිවණ්ණාය පාවෙය්‍යං[2] චෙතියං අකා.

චීවරං පත්තදණ්ඩඤ්ච මධුරායං[3] අපූජයුං
නිවාසනං කුසඝරෙ පූජයිංසු මහාජනා.

පච්චත්ථරණං කපිලෙ උණ්ණලොමඤ්ච කොසලෙ
පූජෙසුං පාටලිපුත්තෙ කරකං කායබන්ධනං.

නිසීදනං අවන්තීසු[4] චම්පායං 'දකසාටකං
දෙවරට්ඨෙ අත්ථරණං විදෙහෙ පරිස්සාවනං.

වාසි-සූචිඝරඤ්චාපි ඉන්දපත්තෙ[5] අපූජයුං
පාසාණකෙ පදං[6] සෙට්ඨං භණ්ඩසෙසං පරන්තකෙ.

මහිංසු මනුජා ධාතුං අට්ඨදොණමිතං තදා[7]
ධාතු විත්ථාරිතා ආසි ලොකනාථස්ස සත්ථුනො].*

එත පන රාජානො හි අත්තනො ලද්ධධාතුං ගහෙත්වා සකසකනගරං ගන්ත්වා චෙතියං කාරාපෙත්වා මහන්තං පූජාවිධානං කරිංසු. චක්ඛුමන්තස්ස භගවතො සරීරධාතු අට්ඨදොණමත්තං සුවණ්ණනාළියා එකසතඅට්ඨවීසතිනාළිකා අහොසි: සත්ථා පන උත්තරාසාළ්හනක්ඛත්තෙන මාතුකුච්ඡියං පටිසන්ධිං ගණ්හි. විසාඛනක්ඛත්තෙන මාතුකුච්ඡිතො නික්ඛමි. උත්තරාසාළ්හනක්ඛත්තෙන මහාභිනික්ඛමනං නික්ඛමි. විසාඛනක්ඛත්තෙන බුද්ධො අහොසි. උත්තරාසාළ්හනක්ඛත්තෙන ධම්මචක්කං පවත්තෙසි. තෙනෙව යමකපාටිහාරියං අකාසි. අස්සයුජනක්ඛත්තෙන දෙවොරොහණං අකාසි. විසාඛනක්ඛත්තෙන පරිනිබ්බායි. මහාකස්සපත්ථෙරො ච අනුරුද්ධත්ථෙරො ච ද්වෙ මහාථෙරා භගවතො සරීරධාතුයො විස්සජ්ජාපෙත්වා අදංසු.

1. තුණ්ඩනරට්ඨස්මිං – කො. තුණ්ඩනරට්ඨෙපි – ජී.
2. සෙතුණ්ඩං – ජී.වි.කො.
3. වජිරායං – ජී.වි.කො. මධුරායං – බුද්ධවංස.
4. අවන්තිපුරෙ – ජී.වි.කො.
5. ඉන්දසත්ථෙ – ජී.වි. ඉන්දපත්තෙ – ජිණකා. ඉන්දරට්ඨෙ – කො.
6. පාසාණකොසරං – ජී.වි.කො. පාසාණකෙ පදං – ජිණකා.
7. අට්ඨදොණමත්තංසු – ජී.වි.කො.

* "රාජා අජාතසත්තු ච" ආදිං කත්වා එත්තකං ඨානං සිහළ භාෂාය කතෙ ධාතුවංසෙයි හා දිස්සතෙ.

තෙසං රාජූනං[1] භගවතො[2] සරීරධාතුං ලභිත්වා සත්තදිවසසත්තමාසාධිකානි[3] සත්තවස්සානි[4] මහාරහං පූජං කත්වා ගතකාලෙ මිච්ඡාදිට්ඨිකමනුස්සා: සමණො ගොතමො පරිනිබ්බුතො. තස්ස ධාතු අත්ථාය අම්හාකං ජීවිතකප්පනං නාසෙත්වා පූජං කරොතී'ති සම්මාසම්බුද්ධෙ පදුස්සන්ති. සක්කො ආවජ්ජෙන්තො තං කාරණං ඤත්වා මහාකස්සපත්ථෙරස්ස ආරොචෙසි: 'භන්තෙ මිච්ඡාදිට්ඨිකා මනුස්සා භගවති[5] පදුට්ඨචිත්තෙන ඉතො චුතා අවීචිනිරයං උපපජ්ජන්ති. බහුතරා අනාගතෙ මිච්ඡාදිට්ඨිකා මාතුපිතුඝාතකා රාජානො භවිස්සන්ති. අජ්ජෙව ධාතුයො නිදහිතුං[6] වට්ටතී'ති ථෙරො විචාරෙත්වා අද්දස.*

අනන්තවත්ථං ධරමානකාලෙ කත්වාන සත්තානමලීනචිත්තො
සෙසානමත්ථාය සරීරධාතුං ඨපෙත්ව සො මච්චුමුඛං උපෙතො.

[කත්වා යො බොධිඤාණං විවිධබලවරං බුජ්ඣිතුං පාරමීයො
චත්වා[7] සඞ්ඛෙය්‍යාපුණ්ණෙ අපරිමිතභවෙ උත්තරිත්වා සුමුත්තං.
ආරොහිත්වාන[8] සීසං අරියසිවපදං අච්චුතං සීතිභාවං**
පත්තො සො ජාතිපාරං නිඛිලපදහනං[9] දුක්කරං කාරයිත්වා.

ධාත්වන්තරායං දිස්වාන ථෙරො කස්සපසව්හයො
නිධානං සබ්බධාතූනං කරොහීත්යාහ භූපතිං.

සාධූති සො පටිස්සුත්වා මාගධො[11] තුට්ඨමානසො
ධාතුනිධානං කාරෙසි සබ්බත්ථ වත්තිතාදිය.[12]

කාරාපෙත්වාන සො රාජා කස්සපස්ස නිවෙදයී
ධාතුයො ආහරී ථෙරො ඉදං කාරණමද්දස.

---

1. තෙ රාජානො – ජී.වී.කෙ.
2. භගවන්තං – ජී.වී.කෙ.
3. මාසික – ජී.වී.කෙ.
4. සත්තවස්සාධිකානි – ජී.වී.කෙ.
5. භගවතො – ජී.වී.කෙ.
6. නිධාතුං – ජී.වී.කෙ.
7. සත්තා – ජී.වී.කෙ.
8. ආරොපෙත්වාන – ජී.වී.කෙ.
9. බුධගණං – ජී.වී.කෙ.
10. අනාගතෙ – ජී.වී.කෙ.
11. මාගතො – ජී.වී.කෙ.
12. වත්තනාදිකා – ජී.වී. වණ්ණනාදිකා – කෙ.

* සීහළ ධාතුවංසෙ නත්ථි.

** ජී.වී.කෙ. පොත්ථකෙසු "දසසත්තමෙම තාරණීතෙ ගුණගණසහිතෙ ජාපයිත්වාන නාථො" ඉතිපි පාඨො දිස්සතෙ, සො අට්ඨානපතිතොති මඤ්ඤෙ.

භුජඞ්ගා පරිගණ්හිංසු රාමගාමම්හි ධාතුයො:
චෙතියෙ ධාරයිස්සන්ති ලඞ්කාදීපෙ අනාගතෙ.

තා ධාතුයො ඨපෙත්වාන ථෙරො කස්සපසව්හයො
රඤ්ඤො අජාතසත්තුස්ස අදසි ධාතුයො තද.

ගෙහෙ චූපකරණානි චතුසට්ඨිසතානි සො
අබ්භන්තරෙ ඨපෙසි රාජා සබ්බා තා බුද්ධධාතුයො.

කරණ්ඩාසීති සංකිණ්ණං[1] චෙතියාසිතිලඤ්ඡනං
ගෙහෙ බහුසමාකිණ්ණං ථූපාරාමප්පමාණකං.

කාරෙත්වා සබ්බකරණං වාලිකං ඔකිරි තහිං
නානාපුප්ඵසහස්සානි නානා ගන්ධං සමාකිරි.

අසීතිථෙරරූපානි අට්ඨවක්කසතානි ච
සුද්ධොධනස්ස රූපම්පි මායාපජාපතාදිනං.

සබ්බානි තානි රූපානි සුවණ්ණස්සෙව කාරයි
පඤ්ච ඡත්තධජසතෙ උස්සාපෙසි මහීපති.

ජාතරූපමයෙ කුම්භෙ කුම්භෙ ච රතනාමයෙ
පඤ්ච පඤ්ච සතෙයෙව ඨපාපෙසි සමන්තතො.

සොවණ්ණිකබ්බමයෙන ච කපාලෙ[2] රජතාමයෙ
පූරෙසි ගන්ධතෙලස්ස ජාලාපෙත්වා පදීපකෙ.

පඤ්ච පඤ්ච සතෙයෙව ඨපාපෙසි දිසම්පති;
ඉමෙ තථෙව තිට්ඨන්තු අධිට්ඨාසි මහාමුනි.

විත්ථාරිතා ධම්මාසොකො භවිස්සති අනාගතෙ
අක්ඛරෙ සොණ්ණපත්තම්හි ඡින්දාපෙසි මහාමති.[4]

පකප්පිත්වා විසුකම්මං[3] ධාතුගබ්භසමන්තතො
වාතවෙගෙන යායන්තං යන්තරූපමකාරයි.

කත්වා සිලාපරික්ඛෙපං[5] පිදහිත්වා සිලාහි තං[6]
තස්සූපරි කරි ථූපං සමං පාසාණථූපියං.]*

ධාතුනිධානකථා සමත්තා.

ඉති අරියජනප්පසාදනත්ථාය කතෙ ධාතුවංසෙ තථාගතස්ස
පරිනිබ්බුතාධිකාරො නාම
දුතියො පරිච්ඡෙදො.

1. සමපුණ්ණං – කො.
2. කබෙලෙ – ජී.වි.කො.
3. විස්සකම්මං – ජී.වි.
4. මහීපති – කො.
5. පරික්ඛයං – ජී.වි.කො.
6. සුසිලාය – ජී.වි.කො.
* සීහළ ධාතුවංසෙ නත්ථි.

## 3. ධාතුපරම්පරාකථා

ධාතුසු පන විභජිත්වා දීයමානෙසු සත්ථුනො නලාටධාතු කොසිනාරකානං[1] මල්ලානං ලද්ධකොට්ඨාසෙයෙව අහොසි. මහාකස්සපත්ථෙරො තෙ උපසඞ්කමිත්වා සත්ථුනො නලාටධාතු තුම්හාකං කොට්ඨාසෙ අහොසි, තං ගහෙතුං ආගතො, භගවා හි ධරමානෙයෙව තම්බපණ්ණිදීපස්ස අනුජානි, 'තස්මා තං අම්හාකං දෙථා'ති. තං සුත්වා මල්ලරාජානො: 'එවං පතිගණ්හථ භන්තෙ ධාතු'න්ති මහාකස්සපත්ථෙරස්ස අදංසු. සො අත්තනො සද්ධිවිහාරිකං මහානන්දත්ථෙරං පක්කොසාපෙත්වා නලාටධාතුං ථෙරස්ස නිය්‍යාදෙත්වා 'ඉමං ධාතුං තම්බපණ්ණිදීපෙ මහාවාලුකගඞ්ගාය දක්ඛිණභාගෙ සෙරුනාම දහස්ස අනෙන්ත වරාහ[2] නාම සොණ්ඩිමත්ථකෙ කාකවණ්ණතිස්සො නාම රාජා පතිට්ඨපෙස්සති, චෙතියං සඞ්ඝාරාමං කාරාපෙස්සති, ත්වං ඉමං ධාතුං ගහෙත්වා වෙසාලියං උපනිස්සාය මහාවනවිහාරෙ කූටාගාරසාලායං සත්ථුනො වසිතගන්ධකුටියං ඨපෙත්වා ධාතුපූජං කත්වා ආයුසඞ්ඛාරෙ ඔස්සට්ඨෙ[3] පරිනිබ්බාපයමානෙ අත්තනො සද්ධිවිහාරිකස්ස චන්දගුත්තත්ථෙරස්ස ධාතුවංසං කථෙත්වා අප්පමත්තො හොහී'ති වත්වා ධාතුං ථෙරස්ස දත්වා අනුපාදිසෙසනිබ්බානධාතුයා පරිනිබ්බායි.

සාවකො සත්ථුකප්පො සො පභින්නපටිසම්භිදෙ
